# 2024

# වාර්ෂික වාර්තාව

## ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව**

**අංක 31, නොරිස් කැනල් පාර,**

**කොළඹ 10**

**Hotline:** **(+ 94) 717 412 222**

**Fax:** **(+94) 112 674 787**

**Email:** **info@slmc.gov.lk**

**Website:** **https;// slmc.gov.lk**

# අන්තර්ගතය


දැක්ම
මෙහෙවර
ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කර්තව්‍යයන්
සභාපතිතුමාගේ පණිවිඩය
ලේඛකාධිකාරීගේ පණිවිඩය
වසරේ වැදගත් සිදුවීම්
2024 සභාව

**1. හැඳින්වීම**

1.1. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිබඳ විශ්ලේෂණයක්
1.2. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ඉතිහාසය
1.3. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලය
1.4. සංවිධාන සැකැස්ම
1.5. පාලන අධිකාරිය
1.5.1. සභාවේ කාර්ය භාරය
1.5.2. සභාවේ ව්‍යවස්ථාව සහ වගකීම්

**2. සභාවේ සාමාජිකයන්**

**3. සභාවේ කමිටු**

**4. සභාවේ පාර්ශ්වකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම**

4.1. රෝගීන්
4.2. සභාවේ විමර්ශන කාර්ය පටිපාටිය
4.3. වෛද්‍ය වෘත්තිකයන් සහ දන්ත වෛද්‍ය වෘත්තිකයන් සඳහා පිරිනමන සේවාවන්
4.4. වෛද්‍ය වෘත්තිකයන් සඳහා මඟ පෙන්වීම, උපදේශන සහ ආචාර ධර්ම
4.5. වෛද්‍ය අධ්‍යාපනය, පුහුණුව, අධීක්ෂණය සහ තත්ත්ව ආරක්ෂණය

5. විවිධ අංශවල කාර්යසාධනය

5.1. ලේඛනගත කිරීමේ අංශය
5.2. ප්‍රතීතන අංශය
5.3. විභාග අංශය
5.4. විදේශ උපාධි අංශය
5.5. තොරතුරු තාක්ෂණ අංශය
5.6. නීති අංශය
5.7. සීමාවාසික පුහුණු අංශය
5.8. මුදල් අංශය

# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

## දැක්ම

නිපුණ, මානුෂීය, ආචාරශීලී සහ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත්
සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන් විසින්
රෝගීන්ට ප්‍රතිකාර කරන සහ රැක බලා ගන්නා සෞඛ්‍ය පද්ධතියක්

## මෙහෙවර

දිවයින පුරා සෞඛ්‍ය සත්කාර පුහුණුව සහ වෘත්තියේ ප්‍රමිතීන්
සකස් කිරීම, පවත්වා ගෙන යාම සහ ඉහළ නැංවීම මඟින්
මහජනතාවගේ සෞඛ්‍යය හා සුරක්ෂිත බව
ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම

# ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කර්තව්‍යයන්

- විශිෂ්ට පරිචයක් ලබා දීමට හැකි නියාමන ප්‍රතිපත්ති සහ පද්ධති සකස් කිරීම සහ සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන් මඟින් සුරක්ෂිත මෙන්ම ඵලදායී සෞඛ්‍යාරක්ෂණයක් ලබා දීමට දායක වීම

- ගෝලීය වශයෙන් පිළිගැනීමක් ඇති, විශිෂ්ට ප්‍රතිඵල අරමුණු කර ගත් සෞඛ්‍යාරක්ෂණ වෘත්තික අධ්‍යාපනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම

- ශ්‍රී ලංකාවේ සහ විදේශවල අධ්‍යාපන පාඨමාලාවල ප්‍රතීතනය විනිවිද භාවයකින් යුතුව සිදු කිරීම මඟින් අපේක්ෂිත ප්‍රමිතීන් සහතික කිරීම

- සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන්ගේ විනය පවත්වා ගැනීම

- ස්වාභාවික යුක්ති මූලධර්මය ආරක්ෂා කරමින් සියලු ම විනය පරීක්ෂණවල දී සාධාරණව දෙපාර්ශවයටම සවන් දීමේ අවස්ථා ලබා දීම

- සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සහ සහතිකකරණය සිදු කරමින් එම වෘත්තිකයන්ගේ දක්ෂතාවන් තක්සේරු කිරීම සහ තහවුරු කිරීම

- තොරතුරු රැස් කිරීම, කළමනාකරණය කිරීම සහ බෙදා හැරීම

- සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීම

- සෞඛ්‍යාරක්ෂණ පහසුකම් භාවිත කරන පුරවැසියන්ගේ අයිතිවාසිකම් හා සුරක්ෂිත බව ආරක්ෂා කිරීමට කටයුතු කිරීම

- කඩදාසි විරහිත, පරිසර හිතකාමී සහ කාර්යක්ෂම පරිපාලනයක් පවත්වා ගෙන යාම

# සභාපතිතුමාගේ පණිවිඩය

වැදගත් නියාමනයකින් යුත්, අධ්‍යාපනික සහ තාක්ෂණික ප්‍රගතියක් අත්පත් කර ගත් වසරක අවසානය සනිටුහන් කරමින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෙනුවෙන් මා මෙම පණිවිඩය ඉදිරිපත් කරන්නේ ඉමහත් අභිමානයෙන් සහ ගාම්භීර වගකීමකින් යුක්තවයි. 2024 වර්ෂය වූ කලී ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයෙහි වඩාත් ප්‍රතිචාරාත්මක සහ ඉදිරි දැක්මක් ඇති නියාමන පද්ධතියක් සඳහා උපායමාර්ගික පරිවර්තනයන් සහිත අඩිතාලමක් දැමූ වසරකි.

මෙම වසර තුළ වැදගත් සිදුවීම් අතරින් එකක් වන්නේ, 2025-2029 සඳහා වූ සභාවේ උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමයි. පාර්ශ්වකරුවන්ගේ අදහස් අනුව සකස් කරන ලද, දත්ත මත පදනම් වූ ඉදිරි දැක්මක් සහිත මෙම පුළුල් සැලැස්ම, අපගේ ආයතනික වර්ධනයේ ඉදිරි පියවර සඳහා මඟ පෙන්වන්නකි. නියාමන දුර්වලතා ශක්තිමත් කර ගැනීම, ඩිජිටල් නවෝත්පාදන ධෛර්යවත් කිරීම, ආචාර ධර්ම ප්‍රමිතීන් ශක්තිමත් කිරීම සහ සෞඛ්‍ය සේවා වෘත්තිකයන් හා ආයතන සමඟ සහයෝගිතාව වර්ධනය කර ගැනීම කෙරෙහි එමඟින් අවධානය යොමු කෙරේ.

අපගේ ප්‍රමුඛ ජයග්‍රහණයක් වනුයේ වෛද්‍ය සහ දන්ත වෛද්‍ය වෘත්තිකයන් සඳහා වූ ලියාපදිංචිය අලුත් කිරීමේ මාර්ගගත ක්‍රමවේදය සාර්ථක ලෙස දියත් කළ හැකි වීම ය. සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ට සිය ලියාපදිංචිය අලුත් කර ගැනීම පහසුවෙන් සහ විනිවිදභාවයකින් යුතුව කර ගත හැකි වීම නිසා මෙම ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නංවා ඇත.

ශ්‍රී ලංකාවේ වෛද්‍ය නියාමනයට පිටිවහලක් වූ නෛතික රාමුව නවීකරණය කිරීමෙහි ලා දිගු පියවරක් ඉදිරියට තැබීමට 2024 දී අපට හැකි විය. නව වෛද්‍ය පනතක් කෙටුම්පත් කිරීම එහි කූටප්‍රාප්තියකි. මෙම නව නීති සම්පාදනයෙහි අරමුණ වන්නේ, බලපත් නිකුත් කිරීමේ ක්‍රමවේදය නිරවුල් කිරීම, මූල්‍ය වගකීම ශක්තිමත් කිරීම සහ රෝගීන්ගේ ආරක්ෂාව පිළිබඳ ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීම යනාදිය හඳුන්වා දී, උසස්තම ගෝලීය ප්‍රමිතීන් සමඟ වෛද්‍ය නියාමනය පෙළගැස්වීම ය. මේ හා සමගාමීව, 2024 අංක 46 සහ අංක 47 දරන වෛද්‍ය (සංශෝධන) පනත් බලාත්මක කිරීම මඟින් වෛද්‍ය ප්‍රමිතීන්ගේ අනුකූලතාව සහ දැඩි බව සහතික කරමින් විදේශීය සුදුසුකම් ලැබූ වෘත්තිකයන් ලියාපදිංචි වීමෙහි සහ විදේශ වෛද්‍ය විද්‍යාල සඳහා ඇති පිළිගැනීමෙහි වර්ධනයක් ඇති විය.

මූල්‍ය විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීමට සහ ජාතික නියාමන අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්වීමට විගණන කමිටුවක් ස්ථාපනය කිරීමත් සමඟ අපගේ පාලන තන්ත්‍රය තුළ වැදගත් සංවර්ධනයක් දක්නට ලැබිණ. ඊට අමතරව අප විසින් නව කමිටු කිහිපයක් ම ස්ථාපනය කරන ලදි. (වෛද්‍ය නිපුණතා) නැවත සනාථ කිරීම පිළිබඳ කමිටුව, වෛද්‍ය සහ දන්ත වෛද්‍ය අධ්‍යාපන කමිටුව, ආචාර ධර්ම කමිටුව සහ දේශසීමාන්තර ටෙලි වෛද්‍ය ක්‍රම පිළිබඳ උපකමිටුව යන මේවා එක එකක් වෘත්තීය සංවර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීමට උපකාර වීම, සදාචාරාත්මක වෛද්‍ය වෘත්තික චර්යාවන් ශක්තිමත් කිරීම සහ නූතන සෞඛ්‍ය සේවා සැපයීමේ දී මතු වන ගැටලු විසඳීම ආදිය උදෙසා සැලසුම් කරන ලදි.

මෙම මුලපිරීම් සියල්ල තුළින් අපගේ අවධානය යොමු කරන ලද්දේ එක් ස්ථිර අරමුණක් කෙරෙහි ය. එනම්, ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යා සහ දන්ත වෛද්‍ය විද්‍යා වෘත්තිකයන් දක්ෂතාවයේ, වෘත්තීයමය භාවයේ සහ ආචාර ධර්මයන්ගේ විශිෂ්ඨතම ප්‍රමිතීන් අත්පත් කර ගැනීම සහතික කරමින් මහජන විශ්වාසය සුරැකීම ය.

2025 දී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සියවස සැපිරීම සනිටුහන් කිරීමට සූදානම් වන අපට, ශක්තිමත් නියාමනයක් හා සදාචාරාත්මක නායකත්වයක් තුළින් ශ්‍රී ලංකාවේ ජනතාවගේ සෞඛ්‍යය සුරැකීමේ අපගේ පෞඪ උරුමය පිළිබඳව සිහිපත් වේ. අනාගතය තුළ අපගේ මෙහෙවර ආවර්ජනය කිරීමට, සැමරීමට සහ යළි සලකා බැලීමට මෙම සියවස් පූරණය කදිම අවස්ථාවක් සපයනු ඇත.

අපගේ සාමාජිකයන්ට, කාර්ය මණ්ඩලයට සහ පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ කැපවීම සහ දායකත්වය උදෙසා සභාව වෙනුවෙන් මගේ හෘදයාංගම කෘතඥතාව පළ කරමි. අපගේ සේවාලාභීන් වන ජනතාවට වටිනාකමක් ඇති සෞඛ්‍ය සේවා පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා අපි ඉදිරියටත් එක්ව කටයුතු කරමු.

**මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක**
සභාපති
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

# ලේඛකාධිකාරීගේ පණිවිඩය :

වෛද්‍ය නියාමනයන් වැඩි දියුණු කිරීමේ සහ වෘත්තීය ප්‍රමිතීන් සුරැකීමේ සැලකිය යුතු අභිවෘද්ධියක් අත්පත් කර ගත් වසරක් සනිටුහන් කරමින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ 2024 වාර්ෂික වාර්තාව සඳහා මා මෙම පණිවිඩය ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව රජයට අයත් ව්‍යවස්ථාපිත නියාමන අධිකාරියක් බවට 2023 දී ගරු නීතිපතිවරයා විසින් දෙන ලද තීරණය අනුව, ව්‍යුහගත පරිවර්තන ක්‍රියාවලියේ කොටසක් වශයෙන් රජයේ ක්‍රියා පටිපාටිය සමඟ සිය මෙහෙයුම් පෙළගැස්වීමෙහි ලා සභාව විසින් ඉදිරි පියවර ගන්නා ලදි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ 2025-2029 උපාය මාර්ගික සැලැස්ම පිළියෙළ කිරීම, නව වෛද්‍ය පනත කෙටුම්පත් කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීමේ මාර්ගගත ක්‍රමවේදය ජනගත කිරීම පසුගිය වසරේ අපගේ ජයග්‍රහණයන් අතර ප්‍රමුඛ ස්ථානයක් ගනී. මෙම මූලාරම්භයන් ඔස්සේ සභාවේ නියාමනයේ, පරිපාලනයේ සහ මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සැලකිය යුතු මට්ටමකින් වර්ධනය වෙතැයි අපේක්ෂා කෙරේ. ඊට අමතරව, ශීඝ්‍ර තාක්ෂණික වර්ධනයන්ට අනුව වෙනස් වන ගෝලීය සෞඛ්‍ය සේවා ප්‍රමිතීන්ට සහ අඛණ්ඩව සිදුවන සමාජමය, සංස්කෘතික සහ ආර්ථික විචලනයන්ට අදාළව දීර්ඝකාලීනව පවත්නා සහ මතු වන්නා වූ අභියෝගයන්ට මුහුණදීම සඳහා සභාවට හැකි වනු ඇත.

සභාවේ ශත සංවත්සරය සැමරීමට අප සූදානම් වන 2025 වසරේ දී, සභාවේ සියලු ම සාමාජිකයන්ට, කාර්ය මණ්ඩලයට සහ පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ කැප වීම සහ සහයෝගය වෙනුවෙන් කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාවේ ඒකාග්‍රතාවය සහතික කිරීම උදෙසා යළි පණ ගැන්වී අපි පෙරට ම ඇදෙමු.

**වෛද්‍ය එච්.ඩී.බී. හේරත්**
ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

# 2024 වර්ෂයේ නොමැකෙන මංසලකුණු

## 2024 වසරේ නොමැකෙන මංසලකුණු

### උපාය මාර්ගික සැලැස්ම පිළියෙළ කිරීම

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් 2025-2029 සඳහා වූ සිය උපාය මාර්ගික සැලැස්ම පිළියෙළ කිරීමට මූලාරම්භයක් ගනු ලැබුවේ වෛද්‍ය නියාමනය ශක්තිමත් කිරීම, අධ්‍යාපන ප්‍රමිතීන් උසස් කිරීම, සදාචාරාත්මක පැවැත්ම වැඩි දියුණු කිරීම, ඩිජිටල් පරිණාමනයන්ට අනුගත වීම සහ පාර්ශ්වකරුවන්ගේ සහයෝගය දිරිගැන්වීම යන අංශ ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරමිනි. වෛද්‍ය ක්ෂේත්‍රයේ පැන නඟින අභියෝගයන් සහ අවස්ථාවන් යන දෙකට ම සාර්ථකව මුහුණදීම මඟින් සෞඛ්‍යාරක්ෂණ නියාමනයේ විශිෂ්ටත්වය තහවුරු කිරීම මෙම සැලැස්මේ අරමුණයි.

මෙම උපාය මාර්ගික සැලැස්ම ගොඩනැඟීම සඳහා වෛද්‍ය වෘත්තිකයන්, අධ්‍යාපන ආයතන, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ සෞඛ්‍යාරක්ෂණ සංවිධාන වැනි ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ අදහස් සැලකිල්ලට ගෙන දත්ත මත පදනම් වූ පුළුල් ප්‍රවේශයක් ආධාර කර ගනු ලැබ ඇත. සෞඛ්‍ය පුහුණුවේ ඵලදායිත්වය, නියාමනය සහ වෘත්තීය ආචාර ධර්ම වැඩි දියුණු කරන ඉදිරි දැක්මක් ඇති වැඩ පිළිවෙළක් ස්ථාපනය කිරීමට මෙම පුළුල් සහභාගිත්වය තුළින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව අපේක්ෂා කරයි.

නියාමන ක්‍රියාවලිය විධිමත් කිරීම, සෞඛ්‍ය තොරතුරු සඳහා ප්‍රවේශය දියුණු කිරීම සහ බලපත්‍ර ලබා දීමේ හා ප්‍රතීතන ක්‍රමවේදයන් නවීකරණය කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණය සමඟ අනුකලනය වීම මෙම උපාය මාර්ගයේ ප්‍රධාන ඉලක්කයයි. ඊට අමතරව, වෛද්‍ය වෘත්තිකයන් උපරිම මට්ටමේ ඒකාග්‍රතාවය පවත්වා ගෙන යන බවට සහතික වෙමින් සදාචාරාත්මක ප්‍රමිතීන් සහ වෘත්තීයමය වගවීම ශක්තිමත් කිරීම උදෙසා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව කැප වී සිටී.

එළඹෙන වසර පහ පුරා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ක්‍රියාවන්ගේ ගමන් මඟ තීරණය කරනු ලබන්නේ මෙම සැලැස්ම තුළිනි. ශක්තිමත්, විනිවිද භාවයකින් යුත් එමෙන් ම ගෝලීය මට්ටම හා සමගාමී වූ වෛද්‍ය නියාමන ක්‍රමවේදයක් ශ්‍රී ලංකාවේ පවත්වා ගෙන යාම සඳහා සභාවේ කැපවීම මෙම මූලාරම්භය මඟින් අවධාරණය කෙරේ.

### වෛද්‍ය සහ දන්ත වෛද්‍ය වෘත්තිකයන් සඳහා වූ ලියාපදිංචිය අලුත් කිරීමේ මාර්ගගත ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම

නියාමන ක්‍රියාවලිය නවීකරණය කිරීමේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 2024 දී ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් වෛද්‍ය සහ දන්ත වෛද්‍ය වෘත්තිකයන් සඳහා **ලියාපදිංචිය අලුත් කිරීමේ මාර්ගගත ක්‍රමවේදය** සාර්ථකව හඳුන්වා දෙන ලදි. මෙම ඩිජිටල් මූලාරම්භය පිළියෙළ කරන ලද්දේ අලුත් කිරීමේ ක්‍රියාවලිය රට පුරා විසිර සිටින සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන් සඳහා වඩාත් කාර්යක්ෂම, සුගම සහ භාවිතයට පහසු වන පරිදි විධිමත් කිරීමට ය.

මාර්ගගත ක්‍රමවේදයකට මාරු වීම තුළින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයේ සැකසුම් කාලය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර, පරිපාලනමය භාරය අවම කර ඇති අතර විනිවිද භාවය වර්ධනය කර ඇත. භෞතිකව පැමිණීමේ සහ ලිපිලේඛන ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවකින් තොරව ලෝකයේ ඕනෑ ම තැනක සිට ඉතා පහසුවෙන් සිය ලියාපදිංචිය අලුත් කර ගැනීමට වෘත්තිකයන්ට දැන් හැකියාව ඇත. ඊට අමතරව, දත්තවල සුරක්ෂිත බව සහ නියාමන අනුකූලතාව තහවුරු කිරීම සඳහා වැඩි දියුණු කරන ලද ආරක්ෂක විධිවිධාන මෙම ක්‍රියාවලිය තුළ අන්තර්ගතව ඇත.

මෙම මූලාරම්භය, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවා සැපයීම සහ පාලනය වැඩි දියුණු කිරීම සඳහා ඩිජිටල් පරිවර්තනයන් යොදා ගැනීම යන ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පුළුල් දැක්ම හා සමගාමී වේ. ඉදිරියේ දී, වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නියාමනයේ කාර්යක්ෂමතාව, සුගම ප්‍රවේශය සහ වගවීම තව දුරටත් වැඩි දියුණු කිරීමෙහි ලා තාක්ෂණය මත වැඩි බරක් යෙදීමට සභාව අඛණ්ඩව කැප වී සිටී. ලියාපදිංචිය අලුත් කිරීමේ මාර්ගගත ක්‍රමවේදය සාර්ථකව ක්‍රියාවට නැංවීම මඟින් නියෝජනය වන්නේ, ශ්‍රී ලංකාව තුළ වඩාත් නවීන සහ ප්‍රතිචාරාත්මක සෞඛ්‍යාරක්ෂණ නියාමන කාර්යභාරක් බිහි කිරීමෙහි ලා තබන ලද තීරණාත්මක පියවරකි.

## නව වෛද්‍ය පනත කෙටුම්පත් කිරීම

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව 2024 දී පසු කළ අතිශය වැදගත් සන්ධිස්ථාන අතරින් එකක් වන්නේ ශ්‍රී ලංකාවේ වෛද්‍ය වෘත්තිය පාලනය කෙරෙන නෛතික සහ නියාමන වැඩ පිළිවෙළ ශක්තිමත් කිරීම ඉලක්ක කොට ගත් පරිවර්තනීය මූලාරම්භයක් වන නව වෛද්‍ය පනත කෙටුම්පත් කිරීමයි. මෙම වැදගත් නීති පද්ධතිය සකස් කරන ලද්දේ සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන් සඳහා වන වෛද්‍ය නියාමනය නවීකරණය කිරීම, වෘත්තීයමය වගවීම වැඩි දියුණු කිරීම සහ සෞඛ්‍යාරක්ෂණ ප්‍රමිතීන් විශිෂ්ටතම ගෝලීය භාවිතයන් හා සමගාමී කරවීම උදෙසා ය.

බලපත් ලබා දීම සහ ලියාපදිංචි කිරීම සඳහා වූ ක්‍රියාවලි විධිමත් කිරීම, වෘත්තීය ආචාර ධර්ම වඩාත් සියුම් ලෙස සුපරීක්ෂා කිරීම, වෙනත් සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන්ගේ පුහුණු වීම් සඳහා වන ප්‍රතිතන ප්‍රමිතීන් උසස් කිරීම සහ රෝගීන්ගේ ආරක්ෂාව සඳහා වන වැඩ පිළිවෙළ වැඩි දියුණු කිරීම ද ඇතුළත් පුළුල් පරිවර්තනයන් රැසක් නව වෛද්‍ය පනත මඟින් හඳුන්වා දී ඇත. ඊට අමතරව, වඩාත් කාර්යක්ෂම පාලන තන්ත්‍රයක් සහ නියාමන යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට පහසුකම් සැලසීම සඳහා ඩිජිටල් පරිවර්තනයන් ද මෙම පනතට ඇතුළත් කර ඇත.

මෙම පනත කෙටුම්පත කිරීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෛද්‍ය වෘත්තිකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ පාර්ශ්වකරුවන් සමඟ සමීපව කටයුතු කරන හෙයින් මෙම මූලාරම්භය 2024 වසරේ දී ලත් විශිෂ්ට ජයග්‍රහණයක් ලෙස කැපී පෙනෙයි. මෙය බලාත්මක කරනු ලැබුවායින් පසුව, සෞඛ්‍යාරක්ෂණ භාවිතයෙහි, පුහුණුවෙහි සහ සදාචාරාත්මක හැසිරීමෙහි උසස් ප්‍රමිතීන් සහතික කරමින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂණ පද්ධතියේ අනාගතය හැඩගැස්වීමෙහි ලා අතිශය වැදගත් භූමිකාවක් නව වෛද්‍ය පනත මඟින් ඉටු කෙරෙනු ඇත.

## 2024 අංක 46 සහ අංක 47 දරන වෛද්‍ය (සංශෝධන) පනත් බලාත්මක කිරීම

වෛද්‍ය ආඥා පනත (105 වන වගන්තිය) සංශෝධනය කරමින් 2024 අංක 46 දරන වෛද්‍ය (සංශෝධන) පනත සහ 2024 අංක 47 දරන වෛද්‍ය (සංශෝධන) පනත බලාත්මක කිරීම හරහා 2024 වර්ෂයේ දී වැදගත් නීතිමය ප්‍රතිසංස්කරණයන් කරලියට ගෙන ඒමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සමත් විය. මෙම සංශෝධනයන් හඳුන්වා දෙන ලද්දේ, විදේශ වෛද්‍ය විද්‍යාලවලට පිළිගැනීමක් ප්‍රදානය කිරීම සහ විදේශවලින් සුදුසුකම් ලැබූ වෛද්‍ය හා දන්ත වෛද්‍ය විශේෂඥයන් ලියාපදිංචි කිරීම විධිමත් කිරීම මඟින් වෛද්‍ය නියාමන වැඩ පිළිවෙළ ශක්තිමත් කිරීම මෙන්ම වෘත්තීයමය ප්‍රමිතීන් උසස් කිරීමට සහ ශ්‍රී ලංකාව තුළ උසස් ම තත්ත්වයේ වෛද්‍ය අධ්‍යාපනයක් සහ භාවිතයක් සහතික වීමටත් ය.

සෞඛ්‍ය අධ්‍යාපන ප්‍රමිතීන් උසස් කිරීම, වෘත්තීයමය වගවීම ශක්තිමත් කිරීම සහ සෞඛ්‍යාරක්ෂණ පද්ධතිය පුරා රෝගීන්ගේ සුරක්ෂාව වැඩි දියුණු කිරීම යන අංශයන්ගෙන් ඉදිරියට තබන ලද වැදගත් පියවරක් මෙම නෛතික ප්‍රතිසංස්කරණ මඟින් නියෝජනය කෙරේ. ශ්‍රී ලංකාවේ වෛද්‍ය භාවිතයේ විශිෂ්ටත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීමෙහි ලා මෙම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම උදෙසා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව නිරන්තරයෙන් කැප වී සිටී.

## රජයේ චක්‍රලේඛවලට අනුගත වන පරිදි විගණන කමිටුවක් ස්ථාපනය කිරීම

මූල්‍ය විනිවිදභාවය, වගවීම සහ පාලන තන්ත්‍රය වැඩි දියුණු කිරීම උදෙසා රජයේ අදාළ චක්‍රලේඛවලට අනුකූල වූ විගණන කමිටුවක් පිහිටුවීම තුළින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් වැදගත් පියවරක් ඉදිරියට තබා ඇත. මෙම මූලාරම්භය සුභාවිතය හා සමගාමී වේ. ආයතනය තුළ විනිවිදභාවය, නියාමනමය අනුකූලතාව හා ඵලදායී මූල්‍ය සුපරීක්ෂණයක් සහතික කිරීමෙහි ලා මෙම මූලාරම්භය මඟින් වැදගත් පියවරක් ඉදිරියට තබා ඇත.

රජයේ චක්‍රලේඛවලට අනුකූල වූ මෙම කමිටුව ස්ථාපනය කිරීම මඟින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින්, යහපත් පාලන තන්ත්‍රයක්, ආයතනමය වගවීම සහ මූල්‍ය විනිවිදභාවය වෙනුවෙන් වූ සිය කැපවීම ශක්තිමත් කරනු ලැබ ඇත. සිය මෙහෙයුම්වල කාර්යක්ෂමතාවෙහි සහ විශ්වාසනීයත්වයෙහි ඉහළ ම ප්‍රමිතීන් පවත්වා

ගෙන යාමෙහි ලා සභාවේ කැපවීම පිළිබිඹු කරමින් මෙම සන්ධිස්ථානය 2024 වර්ෂයේ වැදගත් ජයග්‍රහණයක් ලෙස කැපී පෙනෙයි.

## වෛද්‍ය පාලන තන්ත්‍රය ශක්තිමත් කිරීම උදෙසා නව කමිටු ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් 2024 වර්ෂයේ දී ප්‍රමුඛ කමිටු කිහිපයක් ස්ථාපනය කිරීම මඟින් සෞඛ්‍ය නියාමනය, පුහුණුව, ආචාර ධර්ම සහ ඩිජිටල් සෞඛ්‍යාරක්ෂණය නංවා ලීම උදෙසා වැදගත් පියවරක් ඉදිරියට තබන ලදි. මෙම අභිනවයෙන් ස්ථාපනය කරන ලද කමිටුවල ඉලක්කය වන්නේ අඛණ්ඩ වෘත්තීයමය සංවර්ධනය, සදාචාරාත්මක වෛද්‍ය භාවිතයන් පවත්වා ගෙන යාම සහ සෞඛ්‍යාරක්ෂණයේ, විශේෂයෙන් දේශසීමාන්තර ටෙලි වෛද්‍ය ක්ෂේත්‍රයේ, පැන නඟින අභියෝගයන්ට මුහුණදීම ය.

I. (වෛද්‍ය නිපුණතා) **නැවත සනාථ කිරීම පිළිබඳ කමිටුව** (CPD) - වෛද්‍ය සහ දන්ත වෛද්‍ය වෘත්තිකයන්ගේ නිපුණතා අඛණ්ඩව පවත්වා ගෙන යන බව සහතික වීම සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය [Continuing Professional Development (CPD)] හා (වෛද්‍ය නිපුණතා) නැවත සනාථ කිරීම මෙහි ඉලක්කය වේ.
II. **වෛද්‍ය සහ දන්ත වෛද්‍ය අධ්‍යාපන කමිටුව** - අධ්‍යාපන ප්‍රමිතීන් අධීක්ෂණය, ප්‍රතීතනය සහ ගෝලීය සුභාවිතයන් සමඟ විෂය මාලා සමායෝජනය.
III. **ආචාර ධර්ම කමිටුව** - සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන් උසස් ම ප්‍රමිතීන්වලට අනුගත වන බවට සහතික වීම උදෙසා ආචාර ධර්ම අධීක්ෂණය කිරීම බලගැන්වීම.
IV. **දේශසීමාන්තර ටෙලි වෛද්‍ය ක්‍රම පිළිබඳ අනුකමිටුව** - සදාචාරාත්මක සහ සුරක්ෂිත දේශාන්තර ටෙලි වෛද්‍ය ක්‍රම පද්ධතියක් උදෙසා මාර්ගෝපදේශ සහ රෙගුලාසි සකස් කිරීම

ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂණ ක්ෂේත්‍ර තුළ වෛද්‍ය පාලන තන්ත්‍රය නවීකරණය කිරීමෙහි සහ තාක්ෂණික ප්‍රගතීන් වැළඳ ගැනීමෙහි ලා වැදගත් පියවරක් ඉදිරියට තැබීම මෙම කමිටු මඟින් සිදු කෙරෙනු ඇත.

# සභාව 2024

### අසුන් ගෙන (වමේ සිට දකුණට) – පළමු පෙළ

වෛද්‍ය එස්. ෂන්මුගනාතන්, මහාචාර්ය එම්. උමාකාන්ත්, මහාචාර්ය සමන් නානායක්කාර, මහාචාර්ය මාධව චන්ද්‍රතිලක, වෛද්‍ය ජනක පුෂ්පකුමාර, ඒ. සබානාදන් මහත්මිය (සහකාර ලේඛකාධිකාරි), මහාචාර්ය එෆ්. රනිල් ප්‍රනාන්දු (උප සභාපති), මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක (සභාපති), වෛද්‍ය එච්.ඩී.බී. හේරත් (ලේඛකාධිකාරි), වෛද්‍ය පී.ජී.සී. සංජීව බෝවත්ත, මහාචාර්ය ආර්. සුරෙන්තිරකුමාරන්, මහාචාර්ය මුදිත විදානපතිරණ, මහාචාර්ය මනෝරි ගමගේ, මහාචාර්ය සුරංගි යසවර්ධන, මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක

### සිටගෙන (වමේ සිට දකුණට)

වෛද්‍ය කපිල ජයරත්න, වෛද්‍ය තෙනුවන් තරංග වික්‍රමසිංහ, වෛද්‍ය චන්දික එපිටකඩුව, වෛද්‍ය චන්දන ධර්මරත්න, වෛද්‍ය හරිත අලුත්ගේ, වෛද්‍ය එම්.ඩී. සමරසිංහ, වෛද්‍ය එස්.ආර්. විජයසිංහ, වෛද්‍ය ජනක රාජපක්ෂ, වෛද්‍ය ඩී.එස්. සමරවීර, වෛද්‍ය ලාල් පනාපිටිය

### නොපැමිණි

වෛද්‍ය අසේල ගුණවර්ධන, මහාචාර්ය ජයන්ත ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.පී. වීරරත්න, වෛද්‍ය පී.ඒ.ජී. නවරත්න, වෛද්‍ය ඩී.කේ.ඩී. මැතිව්, මහාචාර්ය එච්.ජේ. ද සිල්වා, මහාචාර්ය ප්‍රසාද් කටුලන්ද, වෛද්‍ය ගීතා නානායක්කාර, වෛද්‍ය ඒ.එම්.ඩී.එම්. ඉන්දික ද ලැනරෝල්, වෛද්‍ය වයි.වී.එන්. දර්ශන සිරිසේන, වෛද්‍ය ආර්.එන්.ඒ.එම්.යූ.කේ. බණ්ඩාර වරකාගොඩ

# 1. හැඳින්වීම

## 1.1. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිබඳ විශ්ලේෂණයක්

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව යනු එම සභාව යටතේ ලියාපදිංචි වී සිටින සෞඛ්‍ය වෘත්තිකයන් විසින් අධ්‍යාපනික සහ වෘත්තීය ප්‍රමිතීන්, විනය සහ සදාචාරාත්මක භාවිතයන් පවත්වා ගෙන යන බවට සහතික වීම මඟින් රෝගීන්ගේ සොයන්නන් ආරක්ෂා කිරීම උදෙසා ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.
ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට එහි ව්‍යවස්ථාපිත බලය ලැබෙනුයේ 1927 අංක 26 දරන වෛද්‍ය ආඥා පනත මඟින් සහ එයට කලින් කල සිදු කරනු ලබන සංශෝධනයන් ද එකී ආඥා පනත යටතේ ගැසට් පත්‍රයක් මඟින් ප්‍රසිද්ධ කරනු ලබන රෙගුලාසි ද මඟිනි.

## 1.2. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ඉතිහාසය

### සමාරම්භය - 1870 - 1880

ශ්‍රී ලංකාවේ දීර්ඝතම කාලයක් පැවැති වෛද්‍ය විද්‍යාලය වන කොළඹ වෛද්‍ය පාසල 1870 ජූනි පළමුවැනි දින ආරම්භ කරන ලද අතර ඊට සිසුන් විසිපස් දෙනකු බඳවා ගැනිණ. ඔවුන්ට වෛද්‍ය විද්‍යාව සහ ශල්‍යකර්ම පිළිබඳ බලපත්‍රය [Licentiate in Medicine and Surgery (L.M.S.)] නමින් ඩිප්ලෝමාවක් ප්‍රදානය කරන ලදි. 1880 දී මෙම පාසල ලංකා වෛද්‍ය විද්‍යාලය ලෙස නම් කෙරුණ අතර L.M.S. ඩිප්ලෝමාව වෙනත් පරීක්ෂණයකින් තොරව බ්‍රිතාන්‍යයේ මහා වෛද්‍ය සභාවෙහි ලියාපදිංචි කරන ලදි.

### ලියාපදිංචි කරන ලද වෘත්තිකයන් 1905-1915

වෛද්‍ය ලියාපදිංචි ආඥා පනත 1905 දී සම්මත වූ අතර L.M.S. (ලංකා) ඩිප්ලෝමාධාරීහු වෛද්‍ය වෘත්තිකයන් ලෙස වෛද්‍ය වෘත්තියෙහි සහ ශල්‍යකර්මයන්හි නිරත වීම සඳහා ලංකා වෛද්‍ය විද්‍යාල සභාව [Ceylon Medical College Council (CMCC)] මඟින් පිළිගන්නා ලදී. මෙම ඩිප්ලෝමාව පිළිගන්නා රටක ලියාපදිංචි වී සිටින ඕනෑ ම අයෙක් CMCC මඟින් ලංකාවේද ලියාපදිංචි කරන ලදි. ලියාපදිංචි පුද්ගලයකුගේ නම ඉවත් කිරීමේ ප්‍රතිපාදන ද 1905 වෛද්‍ය ලියාපදිංචි ආඥා පනත මඟින් පනවා ඇත.

ප්‍රධාන සිවිල් වෛද්‍ය නිලධාරීගේ (වර්තමානයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හා සමාන) අනුමැතිය මත රාජ්‍ය අංශය තුළ වෛද්‍ය වෘත්තියෙහි සහ ශල්‍යකර්මයන්හි නිරත වීම සඳහා ඇපොතිකරිවරුන් සහ වතු ඖෂධ සංයෝජකවරු ලියාපදිංචි කිරීමට 1908 අංක 36 දරන වෛද්‍ය ලියාපදිංචි (සංශෝධන) ආඥා පනත මඟින් නෛතික ප්‍රතිපාදන සැලසිණ.

දන්ත වෛද්‍ය වෘත්තියෙහි නිරත වීම සඳහා දන්ත වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමට 1915 දී දන්ත වෛද්‍ය ලියාපදිංචි ආඥා පනත හඳුන්වා දෙන ලදි.

**ලියාපදිංචි වීමේ ප්‍රතිපාදන පුළුල් කිරීම**

වින්නඹු මාතාවන් අතීතයේ ලියාපදිංචි කරන ලද්දේ 1920 අංක 02 දරන වින්නඹු මාතා ආඥා පනත යටතේ ය. 1924 වෛද්‍ය ආඥා පනතෙහි වින්නඹු මාතාවන් ලියාපදිංචිය සඳහා ප්‍රතිපාදන සකස් කරන ලදී. වින්නඹු මාතාවක් ලෙස ලියාපදිංචි වීම සඳහා වන සුදුසුකම කාන්තාවන්ට පමණක් සීමා විය.

1927 අංක 26 දරන වෛද්‍ය ආඥා පනතෙහි ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම සඳහා ප්‍රතිපාදන සැලසුණ අතර ඖෂධ සහ විෂ වර්ග බෙදා හැරීම ලියාපදිංචි ඖෂධවේදීන්ට සහ ඖෂධවේදී රසායනඥයන්ට පමණක් සීමා විය.

1927 අංක 26 දරන වෛද්‍ය ආඥා පනතෙහි විනය හේතූන් මත අවලංගු කිරීමේ ප්‍රතිපාදන සලසා තිබිණ. වර්තමානයේ පිළිගනු ලබන විනයානුකූල විමර්ශන ක්‍රියා පටිපාටිය ප්‍රසිද්ධ කරනු ලැබුවේ 1993 මාර්තු 10 දිනැති අංක 757/7 දරන රජයේ ගැසට් පත්‍රය මඟිනි.

## විශ්වවිද්‍යාල ආඥා පනත සහ සීමාවාසික පුහුණුව 1942

1942 විශ්වවිද්‍යාල ආඥා පනත මඟින් ලංකා විශ්වවිද්‍යාලය ස්ථාපනය කරනු ලැබීමෙන් අනතුරුව එමඟින් පිරිනමන ලද MBBS උපාධිය සහ BDS උපාධිය ද CMCC මඟින් ලියාපදිංචිය සඳහා පිළිගනු ලැබිණ.

සීමාවාසික පුහුණු කාලයක් සේවය කිරීම මඟින් ලියාපදිංචි කිරීමට පෙර අත්දැකීම් ලබා ගැනීම සඳහා වෛද්‍ය උපාධිධාරීන් තාවකාලිකව ලියාපදිංචි කිරීමට 1955 අංක 23 දරන වෛද්‍ය (සංශෝධන) පනත මඟින් ප්‍රතිපාදන සැලසිණ. ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍යතාවක් ලෙස මෙහි 'යහපත් චරිතය' ඇතුළත් කර ඇත.

## වෛද්‍ය වෘත්තිකයන් සඳහා තාවකාලික ලියාපදිංචිය 1946-1997

උපාධිය ප්‍රදානය කිරීමේ ප්‍රමාදයක් ඇති වූ විට වෛද්‍ය වෘත්තිකයන් තාවකාලිකව ලියාපදිංචි කිරීම සඳහා 1946 අංක 25 දරන වෛද්‍ය (සංශෝධන) පනත මඟින් ප්‍රතිපාදන සලසා ඇති අතර, පසුව කළ සංශෝධන මඟින් වෙනත් හේතූන් මත ඇති වන ප්‍රමාදයන්ද ආවරණය කර ඇත.

රටට සේවය කිරීම සඳහා රජය විසින් ආරාධනා කරනු ලැබූ වෛද්‍ය වෘත්තිකයන්, දන්ත වෛද්‍ය වෘත්තිකයන් සහ හෙද නිලධාරීන් තාවකාලිකව ලියාපදිංචි කිරීම සඳහා 1961 අංක 37 දරන වෛද්‍ය (සංශෝධන) පනත මඟින් ප්‍රතිපාදන සලසා ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හෝ වෛද්‍ය පීඨයක පීඨාධිපති විසින් ලියාපදිංචිය නිර්දේශ කළ යුතු බවට 1997 අංක 31 දරන වෛද්‍ය (සංශෝධන) පනත මඟින් මෙය සංශෝධනය කරන ලදී. ලියාපදිංචිය මාස දොළහක කාලසීමාවකට සීමා කරන ලදී; අයදුම්කරුගේ කුසලතාව සහ දැනුම සභාව මඟින් විනිශ්චය කරන ලදී.

## හෙද නිලධාරීන් ලියාපදිංචි කිරීම 1949-2005

ලංකා වෛද්‍ය සභාව මඟින් හෙද නිලධාරීන් ලියාපදිංචි කිරීම සඳහා 1949 අංක 10 දරන වෛද්‍ය ආඥා පනත මඟින් ප්‍රතිපාදන සලසා ඇත. මෙම ක්‍රියාවලිය වර්තමානයේ අයත් වන්නේ 1988 අංක 19 දරන පනත මඟින් ස්ථාපනය කරන ලද සහ පසුව 2005 අංක 35 දරන පනත මඟින් සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා හෙද සභාවට ය.

## පරිපූරක වෛද්‍ය සහකාරවරුන් ලියාපදිංචි කිරීම 1987 සහ පරිපූරක වෛද්‍ය වෘත්තිකයන්

1987 අංක 30 දරන වෛද්‍ය (සංශෝධන) පනත මඟින් පරිපූරක වෛද්‍ය සහකාරවරුන් ලියාපදිංචිය සඳහා ප්‍රතිපාදන සලසන ලදි. මෙම වර්ගීකරණයට අයත් වන පුද්ගලයන් වන්නේ, විකිරණ ශිල්පීන්, වෛද්‍ය පර්යේෂණාගාර තාක්ෂණ ශිල්පීන්, භෞත චිකිත්සකයන්, වෘත්තීය චිකිත්සකයන්, විද්‍යුත් කන්තු රේඛන සටහන් ශිල්පීන්, ශ්‍රව්‍යවේදීන්, සායනික කායික විද්‍යාඥයන්, කථන චිකිත්සකයන්, පාද රෝග චිකිත්සනයන්, ආහාරවේදීන්, අක්ෂි සහායකයන් සහ සායනික මනෝ චිකිත්සකයන් වේ.

## විදේශ සුදුසුකම් ලියාපදිංචි කිරීම 1996

සභාව මඟින් පිළිගනු ලබන ශ්‍රී ලංකාවෙන් බැහැර වෛද්‍ය පාසලකින් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා ගෙන ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්, ඔවුන් 1991 මැයි 17 දිනට පෙර සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවයෙහි නියුක්තව සිටියේ නම් ලියාපදිංචි කිරීම සඳහා 1996 අංක 15 දරන වෛද්‍ය (සංශෝධන) පනත මඟින් ප්‍රතිපාදන සලසා ඇත.

## ERPM / ERPDS සඳහා ලියාපදිංචි කිරීම 1965

සභාව මඟින් පිළිගනු ලබන ශ්‍රී ලංකාවෙන් බැහැර වෛද්‍ය පාසලකින් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා ගෙන ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්, සභාව මඟින් පවත්වනු ලබන විශේෂ පරීක්ෂණයකට යටත් වීමෙන් සහ සීමාවාසික පුහුණු කාලයක් සේවය කිරීමෙන් පසුව ලියාපදිංචි කිරීම සඳහා 1965 අංක 16 දරන වෛද්‍ය (සංශෝධන) පනත මඟින් ප්‍රතිපාදන සලසා ඇත. මෙම විශේෂ පරීක්ෂණය පූර්වයෙහි 16 වන පනතේ පරීක්ෂණය යනුවෙන් හඳුන්වනු ලැබූ අතර වර්තමානයේ ශ්‍රී ලංකාවේ වෛද්‍ය වෘත්තියෙහි නියැලීම සඳහා ලියාපදිංචි කිරීම උදෙසා වන පරීක්ෂණය [Examination for Registration to Practice Medicine (ERPM)] සහ ශ්‍රී ලංකාවේ දන්ත වෛද්‍ය වෘත්තියෙහි නියැලීම සඳහා ලියාපදිංචි කිරීම උදෙසා වන පරීක්ෂණය [Examination for Registration to Practice Dental Surgery (ERPDS)] නමින් හැඳින්වේ.

# 2024.12.31 දිනට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලය

| තනතුර | තථ්‍ය සංඛ්‍යාව |
|---|---|
| ලේඛකාධිකාරී | 01 |
| සහකාර ලේඛකාධිකාරී | 01 |
| විභාග අංශයේ ප්‍රධානි | 01 |
| ප්‍රතීතන අංශයේ ප්‍රධානි | 01 |
| සීමාවාසික පුහුණු අංශයේ ප්‍රධානි | 01 |
| නීති අංශයේ ප්‍රධානි | 01 |
| මුදල් අංශයේ ප්‍රධානි | 01 |
| විදේශ උපාධි අංශයේ ප්‍රධානි | 00 |
| සම සෞඛ්‍ය අංශයේ ප්‍රධානි | 01 |
| නීති නිලධාරී | 02 |
| තොරතුරු තාක්ෂණ පද්ධති පරිපාලක | 01 |
| අභිචෝදක නිලධාරී | 01 |
| විධායක ලේකම් | 01 |
| PPC & PCC Co - සම්බන්ධීකාරක | 01 |
| කළමනාකරණ සහකාර - ලියාපදිංචි අංශය | 10 |
| කළමනාකරණ සහකාර - ICT අංශය | 01 |
| කළමනාකරණ සහකාර - මානව සම්පත් හා පාලන අංශය | 02 |
| කළමනාකරණ සහකාර - මුදල් අංශය | 03 |
| කළමනාකරණ සහකාර - සම සෞඛ්‍ය අංශය | 02 |
| කළමනාකරණ සහකාර - නීති අංශය | 03 |
| කළමනාකරණ සහකාර - සීමාවාසික පුහුණු අංශය | 01 |
| කළමනාකරණ සහකාර - විභාග අංශය | 04 |
| කළමනාකරණ සහකාර - විදේශ උපාධි අංශය | 02 |
| කළමනාකරණ සහකාර - ප්‍රතීතන අංශය | 01 |
| කළමනාකරණ සහකාර - පිළිගැනීම | 02 |
| කාර්යාල සහයක | 02 |
| කාර්යාල සහයක | 01 |
| සාමාන්‍ය සේවකයන් | 03 |
| එකතුව | **51** |

## ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සංවිධාන ව්‍යුහය




ශ්‍රී ලංකා වෛද්‍ය සභාව - සංවිධාන ව්‍යුහය
සභාපති සහ සභාව
විගණන කමිටුව, නෛතික කමිටුව, ආචාර ධර්ම කමිටුව, කළමනාකරණ කමිටුව, විශේෂඥ කමිටුව, විභාග කමිටුව, වෛද්‍ය සහ දන්ත වෛද්‍ය අධ්‍යාපන කමිටුව, නැවත සනාථ කිරීමේ කමිටුව, සීමාවාසික පුහුණු කමිටුව, විදේශ උපාධි කමිටුව, ප්‍රතීතන කමිටුව, සම සෞඛ්‍ය කමිටුව, තොරතුරු තාක්ෂණ ජාල කමිටුව
ලේඛකාධිකාරී, සහකාර ලේඛකාධිකාරී
අභ්‍යන්තර විගණක, නීති අංශයේ ප්‍රධානි, පරිපාලන නිලධාරි, මුදල් අංශයේ ප්‍රධානි, විභාග අංශයේ ප්‍රධානි, සීමාවාසික පුහුණු අංශයේ ප්‍රධානි, විදේශ විභාග අංශයේ ප්‍රධානි, ප්‍රතීතන අංශයේ ප්‍රධානි, සම සෞඛ්‍ය අංශයේ ප්‍රධානි, තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධානි
නීති නිලධාරීන්
විධායක ලේකම්
ලියාපදිංචි කිරීමේ අංශය, පිළිගැනීම

## 1.5 පාලන අධිකාරිය

### 1.5.1 සභාවේ කාර්ය භාරය

ලියාපදිංචි වූවන්ගේ ප්‍රමිතීන් හා විනය පවත්වා ගැනීම

- ලියාපදිංචි වූවන්ගේ තොරතුරු සංශෝධනය කිරීම උදා.:- නම්, ලිපින, ජා.හැ.ප. අංක ආදී
- අදාළ ලේඛනවල අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීම
- අදාළ ලේඛනවල සහතික කළ උද්ධෘත නිකුත් කිරීම
- ලේඛනවල ඇති නම් අලුත් කිරීම සහ සංරක්ෂණය කිරීම
- සීමාවාසික පුහුණුව සඳහා සුදුසු රජයේ රෝහල් හඳුනාගැනීම
- ලියාපදිංචි වූවන්ගේ ලියාපදිංචිය තහවුරු කිරීම
- විශේෂඥ ලේඛනයේ විශේෂඥයන් ලියාපදිංචි කිරීම
- ලියාපදිංචි සහතික නිකුත් කිරීම
- ලියාපදිංචිය පිළිබඳ විමසීම්වලට පිළිතුරු දීම
- ලියාපදිංචි වූවන් සඳහා යහපත් පැවැත්මේ සහතික නිකුත් කිරීම
- ලියාපදිංචි වූවන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම
- ආධුනික ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම සහ ගිවිසුම් නිකුත් කිරීම
- විදේශ උපාධිධාරීන්ගේ (වෛද්‍ය සහ දන්ත වෛද්‍ය) උපාධි අනුමත කිරීම
- විදේශයන්හි සුදුසුකම් ලබා ඇති වෛද්‍ය සහ දන්ත වෛද්‍ය උපාධිධාරීන් සඳහා ERPM/ERPDS විභාග පැවැත්වීම
- විනය පැමිණිලි පිළිබඳව විභාග කිරීම
- විදේශ වෛද්‍ය සහ දන්ත වෛද්‍ය පාසල් හඳුනාගැනීම සහ එවැනි අනුමත පාසල් සඳහා ලේඛනයක් පවත්වා ගෙන යාම
- සභාව මඟින් අනුමත කරන ලද ලේඛන සහතික කිරීම

### 1.5.2. සභාවේ ව්‍යවස්ථාව සහ කාර්ය භාරය

වෛද්‍ය ආඥා පනතේ III කොටස මඟින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ව්‍යවස්ථාව සහ කාර්ය භාරය පහත සාරාංශගත කොට ඇති පරිදි අර්ථ දක්වා ඇත:-

වෛද්‍ය සභාව "ශ්‍රී ලංකා වෛද්‍ය සභාව" යන නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද ඒ නාමයෙන් සභාව විසින් සහ සභාවට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි අතර යම් චංචල හෝ නිශ්චල දේපළක් දැරීම, අත් කර ගැනීම සහ බැහැර කිරීම ද සභාව විසින් කළ හැකි ය. තව ද එය සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන්ගෙන් ද, නිල බලයෙන් පත් වන සාමාජිකයන්ගෙන් ද, විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපනය කරන ලද විශ්වවිද්‍යාල මඟින් නම් කරන ලද සාමාජිකයන්ගෙන් ද, වෛද්‍ය වෘත්තිකයන්, දන්ත වෛද්‍යවරුන්, වෛද්‍ය වෘත්තියෙහි නියැලීමට සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන්, විශේෂඥ වෛද්‍ය වෘත්තිකයන් සහ විශේෂඥ දන්ත වෛද්‍යවරුන් අතරින් තෝරා පත් කර ගන්නා ලද සාමාජිකයන්ගෙන් ද සමන්විත විය යුතු ය. අමාත්‍යවරයා විසින් සභාපති පත් කරනු ලබන අතර උප සභාපති තෝරා පත් කර ගනු ලබන්නේ සභාවේ සාමාජිකයන් අතරිනි.

**සභාවේ කාර්ය භාරය**

- සභාව සමඟ ලියාපදිංචි වී සිටින වෘත්තිකයන්ගේ ප්‍රමිතීන් පවත්වා ගැනීම (අවම ප්‍රමිති නියෝග)
- වෘත්තිකයන්ගේ විනය පවත්වා ගැනීම (විනය ක්‍රියාපටිපාටි නියෝග) සහ ලේඛන නඩත්තු කිරීම
- වෛද්‍ය සභාව මඟින් ලේඛකාධිකාරීවරයකු පත් කරනු ඇති අතර භාණ්ඩාගාරිකවරයකු ලෙස වෛද්‍ය සභාව විසින් වෙනත් අයකු පත් කරනු නොලැබුණහොත් ඔහු වෛද්‍ය සභාවේ ලේකම් වශයෙන් මෙන් ම භාණ්ඩාගාරික වශයෙන් ද කටයුතු කරනු ඇත. තව ද, ආඥා පනත මඟින් ලේඛකාධිකාරීවරයාට පැවරී ඇති කාර්ය භාරය ඉටු කිරීමේ දී ඔහුට සහාය වීම සඳහා සහකාර ලේඛකාධිකාරීවරයකු ද පත් කරනු ඇත.
- පහත කාරණා සියල්ලට ම හෝ එයින් කවරකට හෝ සභාව මඟින් රෙගුලාසි සකස් කරනු ඇත:-
    - වෛද්‍ය සභාවට සාමාජිකයන් සහ උප සභාපතිවරයකු තෝරා පත් කර ගැනීම
    - ගණපූරණය ද ඇතුළත්ව වෛද්‍ය සභාවේ රැස්වීම් ක්‍රියා පටිපාටිය
    - වෛද්‍ය සභාවේ නිලධාරීන් සහ සේවකයන්ගේ පත්කිරීම්, වැඩ තහනම් කිරීම්, ඉවත් කිරීම්, කාර්ය භාරය සහ පාරිශ්‍රමික
    - මෙම ආඥා පනතෙහි ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේ දී ලැබීම් හා වියදම් පිළිබඳව ගිණුම් තබා ගැනීම සහ එම ගිණුම් විගණනය කිරීම
    - වෛද්‍ය පුහුණුවේ අවම ප්‍රමිතීන් පවත්වා ගෙන යාම
      මෙම ආඥා පනත යටතේ ලියාපදිංචිය ලබා ගැනීමට යෝග්‍ය වීම සඳහා කෙනකුට යම් සුදුසුකමක් ප්‍රදානය කරන හෝ පවරා දෙන්නා වූ විශ්වවිද්‍යාලවල සහ වෙනත් ආයතනවල අධ්‍යයන පාඨමාලා, විභාග, කාර්ය මණ්ඩල, උපකරණ, නවාතැන්, පුහුණු සහ වෙනත් පහසුකම්වලට අදාළ ප්‍රමිතීන් ද ඇතුළත්ව
    - විශ්වවිද්‍යාලවල සහ වෙනත් ආයතනවල පශ්චාත් උපාධි අධ්‍යාපනයේ අවම ප්‍රමිතීන් පවත්වා ගෙන යාම
- සභාව විසින් සභාවේ මාසික රැස්වීම් ඔස්සේ සිය කටයුතු මෙහෙයවීම, ගැටලු සාකච්ඡා කිරීම සහ තීරණ ගැනීම සිදු කරන අතර නොයෙකුත් කමිටු සහ මණ්ඩල ස්ථාපනය කරයි.
- සභාව විසින් වෙන ම අංශ ස්ථාපනය කොට ඇත.
    - බලපත්‍ර ලබා දීමේ විභාග පැවැත්වීම සඳහා විභාග අංශය
    - ප්‍රතීතන උපාධි වැඩසටහන් සඳහා ප්‍රතීතන අංශය
    - නඩු කටයුතුවලට මුහුණදීම සහ විනය ක්‍රියා පටිපාටිවලට සහය වීම සඳහා නීති අංශය
    - විදේශ උපාධි වැඩසටහන් හඳුනාගැනීම සඳහා විදේශ උපාධි අංශය
    - සීමාවාසික පුහුණුවේ තත්ත්වය අධීක්ෂණය කිරීම සහ උසස් කිරීම සඳහා සීමාවාසික පුහුණු අංශය
- සභාව මඟින් එහි ලියාපදිංචි වූවන්ට සහ මහජනතාවට බහුවිධ සේවාවන් සපයනු ලැබේ
    - වෘත්තිකයන් ලියාපදිංචිය සහ ස්ථාවර කාලපරිච්ඡේදයකට පසු ලියාපදිංචිය නැවත අලුත් කිරීම
    - යහපත් පැවැත්මේ සහතික නිකුත් කිරීම
    - සහතිකවල පිටපත් නිකුත් කිරීම
    - වෘත්තිකයන්ගේ ලියාපදිංචිය තහවුරු කිරීම

## සභාවේ සාමාජිකයෝ – 2024

**සභාපති**
මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
2020.11.27 සිට මේ දක්වා

**උප සභාපති**
මහාචාර්ය එෆ්. රනිල් ප්‍රනාන්දු
2023.05.29 සිට 2024.12.31 දක්වා

**සාමාජිකයෝ**

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්, සෞඛ්‍ය අමාත්‍යාංශය (නිල බලයෙන්) 2020.10.29 (12.1 (g) වගන්තිය)

මහාචාර්ය එස්. මන්දික විජේරත්න
2023.09.27 සිට 2024.01.08 දක්වා (12.1 b) වගන්තිය) (කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ නාමයෝජනාව)

මහාචාර්ය ප්‍රසාද් කටුලන්ද
2024.01.09 සිට (12.1 (b) වගන්තිය) (කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ නාමයෝජනාව)

මහාචාර්ය වසන්ති පින්තෝ
2021.10.13 සිට 2024.09.11දක්වා (12.1 (b) වගන්තිය) (පීඨාධිපති, වෛද්‍ය පීඨය, පේරාදෙනිය විශ්වවිද්‍යාලය)

මහාචාර්ය එස්. නානායක්කාර
2024.09.12 සිට (12.1 (b) වගන්තිය) (පීඨාධිපති, වෛද්‍ය පීඨය, පේරාදෙනිය විශ්වවිද්‍යාලය)

මහාචාර්ය මංජුල ආටිගල
2021.08.10 සිට 2024.08.09 දක්වා (12.1 (b) වගන්තිය) (පීඨාධිපති, දන්ත වෛද්‍ය පීඨය, පේරාදෙනිය විශ්වවිද්‍යාලය)

මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක
2024.08.10 සිට (12.1 (b) වගන්තිය) (පීඨාධිපති, දන්ත වෛද්‍ය පීඨය, පේරාදෙනිය විශ්වවිද්‍යාලය)

මහාචාර්ය මාධව චන්ද්‍රතිලක
2023.09.25 සිට (12.1 (b) වගන්තිය) (පීඨාධිපති, වෛද්‍ය පීඨය, කැලනිය විශ්වවිද්‍යාලය)

මහාචාර්ය මනෝරි ගමගේ
2023.11.17 සිට (12.1 (b) වගන්තිය) (පීඨාධිපති, වෛද්‍ය පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

මහාචාර්ය සුරංගි යසවර්ධන
2022.04.29 සිට (12.1 (b) වගන්තිය) (පීඨාධිපති, දන්ත වෛද්‍ය පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

වෛද්‍ය ඇන්ජෙලා අරුල්ප්‍රගාසම් ඇන්තනි
2019.02.07 සිට 2024.02.06 (12.1 (b) වගන්තිය) (ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍යාරක්ෂණ විද්‍යා පීඨයේ නාමයෝජනාව)

මහාචාර්ය එම්. උමාකාන්ත්
2024.08.01 සිට (12.1 (b) වගන්තිය) (ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍යාරක්ෂණ විද්‍යා පීඨයේ නාමයෝජනාව)

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.පී. වීරරත්න
2023.06.26 සිට (12.1 (b) වගන්තිය) (පීඨාධිපති, වෛද්‍ය පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය)

මහාචාර්ය ආර්. සුරෙන්තිරකුමාරන්
2021.10.29 සිට (12.1 (b) වගන්තිය) (පීඨාධිපති, වෛද්‍ය පීඨය, යාපනය විශ්වවිද්‍යාලය)

මහාචාර්ය මුදිත විදානපතිරණ
2023.08.11 සිට (12.1 (b) වගන්තිය) (පීඨාධිපති, වෛද්‍ය පීඨය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය)

වෛද්‍ය පී.ජී.සී. සංජීව බෝවත්ත
2021.01.28 සිට (12.1 (b) වගන්තිය) (පීඨාධිපති, වෛද්‍ය පීඨය, වයඹ විශ්වවිද්‍යාලය)

වෛද්‍ය ජනක පුෂ්පකුමාර
2022.08.11 සිට (12.1 (b) වගන්තිය) (පීඨාධිපති, වෛද්‍ය පීඨය, රජරට විශ්වවිද්‍යාලය)

වෛද්‍ය උදයංගනී රාමදාස
2021.04.30 සිට 2024.02.20 (12.1 (b) වගන්තිය) (වෛද්‍ය පීඨයේ නාමයෝජනාව, සබරගමුව විශ්වවිද්‍යාලය)

වෛද්‍ය ගීතා නානායක්කාර
2024.02.21 සිට (12.1 (b) වගන්තිය) (වෛද්‍ය පීඨයේ නාමයෝජනාව, සබරගමුව විශ්වවිද්‍යාලය)

වෛද්‍ය ඒ.එම්.ඩී.එම්. ඉන්දික ලැනරෝල්
2023.05.26 සිට (12.1 (c) වගන්තිය)

වෛද්‍ය ඊ.ජී.ඩී. චන්දික එපිටකඩුව
2023.05.26 සිට (12.1 (c) වගන්තිය)

වෛද්‍ය සී.එස්. ධර්මරත්න
2023.05.26 සිට (12.1 (c) වගන්තිය)

වෛද්‍ය පී.ඩබ්ලිව්.සී. පනාපිටිය
2023.05.26 සිට (12.1 (c) වගන්තිය)

වෛද්‍ය වයි.වී.එන්. දර්ශන සිරිසේන
2023.05.26 සිට (12.1 © වගන්තිය)

වෛද්‍ය ආර්.එන්.ඒ.එම්.යූ.කේ. බණ්ඩාර වරකාගොඩ
2023.05.26 සිට (12.1 (c) වගන්තිය)

වෛද්‍ය ඩබ්ලිව්.ඒ.ඩී. තෙනුවන් තරංග වික්‍රමසිංහ
2023.05.26 සිට (12.1 (c) වගන්තිය)

වෛද්‍ය හරිත පුනු අලුත්ගේ
2023.05.26 සිට (12.1 (c) වගන්තිය)

මහාචාර්ය ජනක සිල්වා
2021.10.29 සිට (12.1 (c) වගන්තිය)

වෛද්‍ය එස්.ආර්. විජයසිංහ
2021.10.29 සිට (12.1 (c) වගන්තිය)

වෛද්‍ය එම්.ඩී. සමරසිංහ
2021.10.29 සිට (12.1 (c) වගන්තිය)

වෛද්‍ය ගාමිණී නවරත්න
2021.10.29 සිට (12.1 (c) වගන්තිය)

වෛද්‍ය ඩී.එස්. සමරවීර
2023.03.31 සිට (12.1 (d) වගන්තිය)

වෛද්‍ය එස්. ෂන්මුගනාතන්
2023.03.31 සිට (12.1 (E) වගන්තිය)

වෛද්‍ය අන්වර් හම්දානි
2023.06.08 සිට 2024.01.26 දක්වා (12.1 (f) වගන්තිය)

මහාචාර්ය ජයන්ත ජයවර්ධන
2024.02.12 සිට (12.1 (f) වගන්තිය)

වෛද්‍ය ඩී. මැතිව්
2023.09.27 සිට (12.1 (f) වගන්තිය)

වෛද්‍ය ආර්.කේ.ජේ.එස්. රාජපක්ෂ
2023.06.28 සිට (12.1 (f) වගන්තිය)

වෛද්‍ය කපිල ජයරත්න
2023.06.30 සිට (12.1 (f) වගන්තිය)

## ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ හිටපු සභාපතිවරු

මහාචාර්ය එච්. ද සිල්වා
(2019 ජනවාරි - 2020 නොවැම්බර්)

මහාචාර්ය සී. ගුණරත්න
(2017 සැප්තැම්බර් - 2018 ජූලි)

මහාචාර්ය සී. ෆොන්සේකා
(2012 ජනවාරි - 2017 ජූනි)

මහාචාර්ය එල්. මෙන්ඩිස්
(2009 ජූනි - 2011 ජූනි)

වෛද්‍ය එච්.එච්.ආර්. සමරසිංහ
(1999 ජූනි - 2009 ජූනි)

වෛද්‍ය ජී.සී. ඌරාගොඩ
(1996 ඔක්තෝබර් - 1999 පෙබරවාරි)

වෛද්‍ය එස්.ඒ. කබ්‍රාල්
(1988 ඔක්තෝබර් - 1996 සැප්තැම්බර්)

වෛද්‍ය ඕ.ආර්. මෙඩොන්සා
(1980 ජූලි - 1988 ඔක්තෝබර්)

වෛද්‍ය එස්.එච්.පී. නානායක්කාර
(1975 මාර්තු - 1980 ජූනි)

වෛද්‍ය ඊ.එම්. විජේරාම
(1969 දෙසැම්බර් - 1974 දෙසැම්බර්)

ශ්‍රීමත් එන්. ආටිගල
(1964 ජූනි - 1969 දෙසැම්බර්)

වෛද්‍ය ඩබ්ලිව්.ඒ. කරුණාරත්න
(1959 සැප්තැම්බර් - 1964 ජූනි)

වෛද්‍ය ජේ. කහවිට
(1953 දෙසැම්බර් - 1959 සැප්තැම්බර්)

වෛද්‍ය ඩබ්ලිව්.ජී. වික්‍රමසිංහ
(1949 ඔක්තෝබර් - 1953 දෙසැම්බර්)

වෛද්‍ය එස්.එෆ්. චෙල්ලප්පා
1941 සැප්තැම්බර් - 1949 ඔක්තෝබර්)

වෛද්‍ය එස්.ටී. ගුණසේකර
(1937 මාර්තු - 1941 සැප්තැම්බර්)

වෛද්‍ය ආර්. බ්‍රියර්ක්ලිෆ්
(1930 ජනවාරි - 1937 මාර්තු)

වෛද්‍ය ජේ.ඕ.බී. වැන් ලැන්ගන්බර්ග්
(1929 දෙසැම්බර් - 1930 ජනවාරි)

ලුතිනන් කර්නල් සී.ඩී. මයිල්ස්
(1927 ජූනි - 1929 දෙසැම්බර්)

වෛද්‍ය එන්.ඩී. වෝකර්
(1925 ජූනි - 1926 දෙසැම්බර්)

## ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ හිටපු උපසභාපතිවරු

මහාචාර්ය ජයන්ත ජයවර්ධන
(2023 පෙබරවාරි - 2023 සැප්තැම්බර්)

මහාචාර්ය සුරංගි යසවර්ධන
(2023 ජනවාරි)

වෛද්‍ය එස්. ෂන්මුගනාතන්
(2020 සැප්තැම්බර් - 2022 දෙසැම්බර්)

මහාචාර්ය එන්. ද සිල්වා
(2016 අප්‍රේල් - 2020 අගෝස්තු)

වෛද්‍ය එල්. රණසිංහ
(2014 අගෝස්තු – 2016 මාර්තු)

වෛද්‍ය ඒ. හපුගොඩ
(2013 පෙබරවාරි –2014 ජූනි)

වෛද්‍ය එන්. අමරසේකර
(2009 ජූනි –2013 ජනවාරි)

වෛද්‍ය ඒ. සමරසේකර
(1998 අගෝස්තු - 2009 මැයි)

වෛද්‍ය ඩබ්ලිව්.එස්.එස්. ද අල්විස්
(1992 ජූලි –1998 ජූලි)

වෛද්‍ය එස්.එම්.ජී. විජේගුණරත්න
(1991 මාර්තු –1992 ජූලි)

වෛද්‍ය එස්.ඒ. කබ්‍රාල්
(1973 ජූනි –1991 මාර්තු)

වෛද්‍ය ඩබ්ලිව්.ඩී.එල්. ප්‍රනාන්දු
(1970 මාර්තු –1973 ජූනි)

වෛද්‍ය ර්.එම්. විජේරාම
(1964 ජූනි –1969 දෙසැම්බර්)

ශ්‍රීමත් එන්. ආටිගල
(1957 සැප්තැම්බර් –1964 ජූනි)

මහාචාර්ය ජේ.ආර්. බ්ලේස්
(1952 ජූනි –1957 සැප්තැම්බර්)

ශ්‍රීමත් එන්. ආටිගල
(1952 මාර්තු –1952 මැයි)

වෛද්‍ය එෆ්. ගුණසේකර
(1933 පෙබරවාරි –1952 මාර්තු)

වෛද්‍ය එල්. ද සිල්වා
(1925 ජූනි –1933 පෙබරවාරි)

## ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ හිටපු ලේඛකාධිකාරීවරු

වෛද්‍ය එස්.ආර්. විජේසිංහ (වැඩ බලන)
(2022 දෙසැම්බර් සිට 2023.01.31)

වෛද්‍ය ඒ. හපුගොඩ
(2019 නොවැම්බර් සිට 2022 නොවැම්බර්)

වෛද්‍ය සී.එල්.කේ. අතපත්තු (වැඩ බලන)
(2018 අගෝස්තු සිට 2019 නොවැම්බර්)

වෛද්‍ය එස්. ටෙරන්ස් ජී.ආර්. ද සිල්වා
(2015 ජූලි සිට 2018 මැයි)

වෛද්‍ය එච්.එම්.එස්.එස්.ඩී. හේරත් (වැඩ බලන)
(2013 මාර්තු - 2015 ජූනි)

වෛද්‍ය එන්.ජේ. නෝනිස්
(2005 පෙබරවාරි - 2013 මාර්තු)

මහාචාර්ය පී.එස්.එස්. පණ්ඩිතරත්න
(1994 සැප්තැම්බර් - 2005 පෙබරවාරි)

මහාචාර්ය එච්.වී.ජේ. ප්‍රනාන්දු
(1982 දෙසැම්බර් - 1994 සැප්තැම්බර්)

මහාචාර්ය එම්.ඒ. පෝල්
(1939 මාර්තු - 1982 මැයි)

වෛද්‍ය ඩබ්ලිව්.සී.ඕ. හිල්
(1938 ජූනි - 1939 මාර්තු)

මහාචාර්ය එෆ්.ඕ.බී. එලිසන්
(1925 ජූනි - 1938 ජූනි)

## සභාවේ කමිටු

### 2024 දෙසැම්බර් 31 දිනට සභාවේ ස්ථාවර කමිටු

### 1. කළමනාකරණ කමිටු රැස්වීම

මෙම කමිටුවෙහි වගකීම වන්නේ එදිනෙදා පරිපාලනමය සහ මූල්‍යමය කරුණු කළමනාකරණය කිරීමයි.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)

මහාචාර්ය සුරංගි යසවර්ධන
මහාචාර්ය ජනක ද සිල්වා
වෛද්‍ය එස්.ආර්. විජයසිංහ
වෛද්‍ය ඩී.එස්. සමරවීර
වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාතන්
වෛද්‍ය ආර්.එන්.ඒ.එම්.යූ.කේ. බණ්ඩාර වරකාගොඩ
වෛද්‍ය ඩබ්ලිව්.ඒ.ඩී. තෙනුවන් තරංග වික්‍රමසිංහ
වෛද්‍ය හරිත පුනු අලුත්ගේ
වෛද්‍ය ඒ.එම්.ඩී.එම්. ඉන්දික ද ලැනරෝල්
වෛද්‍ය චන්දන ධර්මරත්න

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)
මහාචාර්ය ගෝමින්ද පොන්නම්පෙරුම
(ප්‍රධානී - ප්‍රතීතන අංශය)
මහාචාර්ය ආර්.බී. මාරසිංහ
(ප්‍රධානී - සීමාවාසික පුහුණු අංශය)
මහාචාර්ය පූජිත වික්‍රමසිංහ
(ප්‍රධානී - විභාග අංශය)
පුද්ධ නානායක්කාර මහතා
(ප්‍රධානී - නීති අංශය)
ඒ.යූ. වෛද්‍යරත්න මහත්මිය
(ප්‍රධානී - මුදල් අංශය)
අමිල හේරත් මහතා
(තොරතුරු තාක්ෂණ පරිපාලක)
ශකිලා බෝපේආරච්චි මහත්මිය
(විධායක ලේකම්)

### 2. විභාග කමිටුව

මෙම කමිටුවෙහි වගකීම වන්නේ සියලු ම ERPM / ERPDS කටයුතු කළමනාකරණය කිරීම සහ සභාව වෙත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නිර්දේශ කිරීමයි.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.පී. වීරරත්න
වෛද්‍ය සංජීව බෝවත්ත
මහාචාර්ය වසන්ති පින්තෝ
මහාචාර්ය සමන් නානායක්කාර
මහාචාර්ය මංජුල ආටිගල
මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක
වෛද්‍ය පී.ඒ.ජී. නවරත්න
මහාචාර්ය ආරියරානී ඥාණදාසන්
වෛද්‍ය හර්ෂ අතපත්තු
වෛද්‍ය දුල්ෂිකා අමරසිංහ
මහාචාර්ය ෂාමිනී ප්‍රතාපන්
මහාචාර්ය ඉන්දිරා කිතුල්වත්ත
මහාචාර්ය මනෝරි ගමගේ
වෛද්‍ය මලික් සමරසිංහ
වෛද්‍ය චන්දික එපිටකඩුව

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)
මහාචාර්ය පූජිත වික්‍රමසිංහ
(ප්‍රධානී - විභාග අංශය)

## 3. ප්‍රතීතන කමිටුව

මෙම කමිටුවේ වගකීම වන්නේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපනය කරන ලද ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල සහ ශ්‍රීමත් ජෝන් කොතලාවල විශ්වවිද්‍යාලය වෙත බලය පැවරීම සඳහා ස්වාධීන ප්‍රතීතන අංශයක් ස්ථාපනය කිරීම සම්බන්ධව අධීක්ෂණය කිරීමයි.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)

මහාචාර්ය සුරංගි යසවර්ධන
මහාචාර්ය මාධව චන්ද්‍රතිලක
මහාචාර්ය පණ්ඩුල සිරිබද්දන
වෛද්‍ය පාලිත අබේකෝන්
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ
වෛද්‍ය චන්දන ධර්මරත්න
වෛද්‍ය ලාල් පනාපිටිය
වෛද්‍ය චන්දික එපිටකඩුව
වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ
වෛද්‍ය හරිත පුනු අලුත්ගේ
මහාචාර්ය නිර්මලී පල්ලේවත්ත
(අධ්‍යක්ෂ QAC)

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)
මහාචාර්ය ගෝමින්ද පොන්නම්පෙරුම
(ප්‍රධානී - ප්‍රතීතන අංශය)

## 4. විදේශ උපාධි කමිටුව

මෙම කමිටුවේ වගකීම වන්නේ විදේශ වෛද්‍ය / දන්ත වෛද්‍ය වැඩසටහන් පිළිගැනීම සඳහා බලය පැවරීම සහ අධීක්ෂණය, අවම ප්‍රමිති (වෛද්‍ය අධ්‍යාපන) නියෝගවල ප්‍රතිපාදන සහ විදේශ උපාධි වැඩසටහන් විධිමත් කිරීම සහ ප්‍රතිඵලදායක ලෙස පිළිගැනීම, නොපිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම සඳහා වන මාර්ගෝපදේශ භාවිතය නිරීක්ෂණය සහ සභාව වෙත උපාධි අනුමැතියන් යෝජනා කිරීමයි

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)

මහාචාර්ය සුරංගි යසවර්ධන
මහාචාර්ය මනෝරි ගමගේ
මහාචාර්ය මංජුල ආටිගල
වෛද්‍ය ජනක රාජපක්ෂ
වෛද්‍ය කපිල ජයරත්න
වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාතන්
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ
වෛද්‍ය චන්දන ධර්මරත්න
වෛද්‍ය චන්දික එපිටකඩුව
වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)

## 5. මූලික විමර්ශන කමිටුව

මෙම කමිටුවේ වගකීම වන්නේ විනය ක්‍රියා පිළිවෙළ සහ නියෝග ආරම්භ කිරීමත්, පැමිණිලි විමර්ශනය කිරීමත්, බැලූ බැල්මට විනිශ්චය පැහැදිලිව පෙනෙන ගැටලු සඳහා තීන්දු ගැනීමත්, ඔවුන් වෘත්තීය චර්යා කමිටුව වෙත යොමු කිරීමත් ය.

මහාචාර්ය රනිල් ප්‍රනාන්දු
(උප සභාපති)

මහාචාර්ය ජනක ද සිල්වා
වෛද්‍ය දුමින්ද සමරසිංහ
වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාතන්
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)

## 6. වෘත්තීය චර්යා කමිටුව

මෙම කමිටුවේ වගකීම වන්නේ බැලූ බැල්මට විනිශ්චය පැහැදිලිව පෙනෙන නඩු සඳහා චෝදනා පත්‍ර ඉදිරිපත් කිරීම හා නඩු ඇසීම, තීරණ ගැනීම සහ දඬුවම් පැනවීම ය.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)

මහාචාර්ය සුරංගී යසවර්ධන
මහාචාර්ය මනෝරි ගමගේ
වෛද්‍ය එස්.ආර්. විජේසිංහ
වෛද්‍ය ලාල් පනාපිටිය
වෛද්‍ය පී.ඒ.ජී. නවරත්න
වෛද්‍ය ජනක රාජපක්ෂ
වෛද්‍ය චන්දන ධර්මරත්න
වෛද්‍ය චන්දික එපිටකඩුව
වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
පුඞ් නනායක්කාර මහතා
(ප්‍රධානී - නීති අංශය)
රසික ජයසිංහ මහතා
(අභිචෝදක නිලධාරී)

## 7. සීමාවාසික පුහුණු කමිටුව

මෙම කමිටුවේ වගකීම වන්නේ සීමාවාසික පුහුණු ආයතන කළමනාකරණය සහ අනුමත කිරීම සහ සීමාවාසික පුහුණු වැඩසටහන් අධීක්ෂණය කිරීම සහ අගැයීම ය.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)

මහාචාර්ය සුරංගී යසවර්ධන
මහාචාර්ය ඒ.එම්. ආටිගල
මහාචාර්ය වසන්ති පින්තෝ
වෛද්‍ය ඒ.එන්. අරුල්ප්‍රගාසම්
වෛද්‍ය පී.ඒ.ජී. නවරත්න
වෛද්‍ය ලාල් පනාපිටිය
වෛද්‍ය ප්‍රියන්ත අතපත්තු
වෛද්‍ය අයන්ති කරුණාරත්න
වෛද්‍ය ඉන්දික ද ලැනරෝල්
වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)
මහාචාර්ය ආර්.බී. මාරසිංහ
(ප්‍රධානී - සීමාවාසික පුහුණු අංශය)

## 8. අතිරේක සුදුසුකම් කමිටුව

මෙම කමිටුවේ වගකීම වන්නේ සභාවට ඉදිරිපත් කරන අතිරේක සුදුසුකම් අනුමැතීන් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ යෝජනා කිරීම සහ අතිරේක සුදුසුකම් කාර්යක්ෂමව අනුමත කිරීම සඳහා ක්‍රමවේදයන් යෝජනා කිරීම වේ.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)
මහාචාර්ය සුරංගී යසවර්ධන
ජොෂ්ඨ මහාචාර්ය ටී.පී. වීරරත්න
මහාචාර්ය ඒ.එම්. ආටිගල
වෛද්‍ය ඉන්දික ද ලැනරෝල්
වෛද්‍ය ලාල් පනාපිටිය
වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ
වෛද්‍ය චන්දන ධර්මරත්න
වෛද්‍ය දර්ශන සිරිසේන

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)

## 10. තාවකාලික ලියාපදිංචි කමිටුව

මෙම කමිටුවේ වගකීම වන්නේ වෘත්තිකයන් විසින් ශ්‍රී ලංකාව තුළ වෘත්තියෙහි නියැලීමට තාවකාලික ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සලකා බැලීම සහ අනුමත කිරීම ය

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)
මහාචාර්ය සුරංගී යසවර්ධන
මහාචාර්ය සේනක රාජපක්ෂ
වෛද්‍ය එම්.ඩී. සමරසිංහ
වෛද්‍ය පී.ඒ.ජී. නවරත්න
වෛද්‍ය කපිල ජයරත්න
වෛද්‍ය ඉන්දික ද ලැනරෝල්
වෛද්‍ය ලාල් පනාපිටිය
වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ
වෛද්‍ය දර්ශන සිරිසේන

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)

## 11. තොරතුරු තාක්ෂණ / ජාල කමිටුව

මෙම කමිටුවේ වගකීම වන්නේ සියලු ම තොරතුරු තාක්ෂණ සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ජාලයට අදාළ කටයුතු කළමනාකරණය කිරීම, යෙදවීම සහ ක්‍රියාත්මක කිරීම ය. කඩදාසිවලින් තොර හරිත කාර්යාලයීය පරිසරයක් බිහි කිරීම මෙම කමිටුවේ ඉලක්කයයි.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)
මහාචාර්ය රනිල් ප්‍රනාන්දු
වෛද්‍ය කපිල ජයරත්න
වෛද්‍ය රොෂාන් හේවාපතිරණ
වෛද්‍ය චාමික සේනානායක
වෛද්‍ය ප්‍රසාද් රණතුංග
වෛද්‍ය ගුම්දු කුලතුංග
වෛද්‍ය දුමින්ද සමරසිංහ
වෛද්‍ය හරිත අලුත්ගේ
වෛද්‍ය ඉන්දික ද ලැනරෝල්
වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)
අමිල හේරත් මහතා
(තොරතුරු තාක්ෂණ පරිපාලක)

## 12. විශේෂඥ කමිටුව

මෙම කමිටුවේ වගකීම වන්නේ විශේෂඥයන් ලියාපදිංචි කිරීම සහ විශේෂඥයන් ලියාපදිංචි කිරීමේ නියෝගවල නිහඬ ප්‍රතිපාදන සක්‍රිය කිරීම සඳහා වෛද්‍ය ආඥා පනතට සංශෝධන යෝජනා කිරීම ය.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)
මහාචාර්ය සේනක රාජපක්ෂ
මහාචාර්ය සුරංගී යසවර්ධන
වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාතන්
වෛද්‍ය එස්.ආර්. විජේසිංහ
වෛද්‍ය දර්ශන සිරිසේන

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)
අමිල හේරත් මහතා
(තොරතුරු තාක්ෂණ පරිපාලක)

## 13. කෙටුම්පත් කිරීමේ කමිටුව

මෙම කමිටුව පිහිටුවා ඇත්තේ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය වෘත්තිය, ආචාර ධර්ම සහ අධ්‍යාපනය යන ඒවායේ ප්‍රමිතිය රටේ සෞඛ්‍යාරක්ෂණ පද්ධතියේ සංවර්ධනයට සහ දියුණුවට දායක වෙමින් ජාතික නීති සහ අන්තර්ජාතික සුභාවිතය හා සමගාමී වන බව සහතික කර ගැනීමට ය. කමිටුවේ වඩාත් ම වැදගත් කාර්යය වන්නේ රෝගී සුරක්ෂාව තහවුරු වන පරිදි වෛද්‍ය වෘත්තියේ අනුකූල භාවය සහ වෘත්තීයමය භාවය පවත්වා ගැනීම සහ වෛද්‍ය වෘත්තිකයන්ගේ අඛණ්ඩ පුහුණුව සහ නියාමනය සඳහා සහයෝගය දැක්වීම ය.

මහාචාර්ය ජනක ද සිල්වා
(සභාපති)
වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාදන්
වෛද්‍ය එස්.ආර්. විජේසිංහ
වෛද්‍ය ඩී.එස්. සමරවීර
වෛද්‍ය දුමින්ද සමරසිංහ
වෛද්‍ය චන්දික එපිටකඩුව

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)

## 14. ව්‍යවස්ථාදායක කමිටුව

මෙම කමිටුවෙහි වගකීම වන්නේ වෛද්‍ය ආඥා පනත සහ නියෝග අධ්‍යයනය කිරීම සහ වෛද්‍ය ආඥා පනත කෙටුම්පත් කිරීමට හෝ නව සෞඛ්‍ය පනතක් කෙටුම්පත් කිරීමට සංශෝධන යෝජනා කිරීම ය.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)

මහාචාර්ය ජයන්ත ජයවර්ධන
වෛද්‍ය එස්.ආර්. විජේසිංහ
වෛද්‍ය දර්ශන සිරිසේන
වෛද්‍ය චන්දන ධර්මරත්න
වෛද්‍ය චන්දික එපිටකඩුව
වෛද්‍ය ලාල් පනාපිටිය
වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ
වෛද්‍ය ඩී.එස්. සමරවීර

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)
ප්‍රබුධ නානායක්කාර මහතා
(ප්‍රධානී - නීති අංශය)
ශාලිනී සේනානායක මහත්මිය
(නීති නිලධාරි)
ෂමාරා ෆර්ඩියස් මහත්මිය
(නීති නිලධාරි)

## 15. ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන සහ සුළු)

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මිළ දී ගැනීම් සඳහා අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව උපරිම වන පරිදි ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරන බවට ප්‍රසම්පාදන කමිටුව වගකිව යුතු වේ.

**ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව**

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)
වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාතන්
ආර්.බී. නිරංජන් ප්‍රේමසිරි මහතා
(සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිත)

**සුළු ප්‍රසම්පාදන කමිටුව**

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)
වෛද්‍ය චන්දික එපිටකඩුව
ආර්.බී. නිරංජන් ප්‍රේමසිරි මහතා
(සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිත)

## 16. සම සෞඛ්‍ය කමිටුව

ශ්‍රී ලංකාවේ සම සෞඛ්‍ය වෘත්තිකයන්ගේ නියාමනය, ප්‍රමිතීන් සහ භාවිතය අධීක්ෂණය කිරීම මෙම කමිටුවේ වගකීම වේ. වෛද්‍යවරුන් සහ හෙද නිලධාරීන් හැරුණ කොට සෞඛ්‍යාරක්ෂණ භූමිකාවන්හි නිරත වන භෞත චිකිත්සකයන්, විකිරණ ශිල්පීන්, පර්යේෂණාගාර තාක්ෂණ ශිල්පීන් සහ වෘත්තීය චිකිත්සකයන් ඇතුළු තැනැත්තන් සම සෞඛ්‍ය වෘත්තිකයන්ට අයත් වේ. මෙම කමිටුවේ භූමිකාවට අදාළ වන්නේ සම සෞඛ්‍ය වෘත්තිකයන් විශේෂිත අධ්‍යාපනික, සදාචාරාත්මක සහ භාවිත ප්‍රමිතීන් සපුරා ඇති බවට සහතික වීම ය.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.පී. වීරරත්න
මහාචාර්ය සුරංගී යසවර්ධන
මහාචාර්ය වසන්ති පිත්තෝ
මහාචාර්ය ආර්. සුරේන්තිකුමාරන්
වෛද්‍ය සංජීව බෝවත්ත
වෛද්‍ය හරිත අලුත්ගේ
වෛද්‍ය දර්ශන සිරිසේන
වෛද්‍ය චන්දික එපිටකඩුව
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)

## 17. විගණන කමිටුව

සභාවේ මූල්‍ය වාර්තාකරණය, විගණන ක්‍රියාවලිය සහ අභ්‍යන්තර පාලනය අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් මෙම කමිටුව වගකිව යුතු වේ. සංවිධානයේ මූල්‍ය කළමනාකරණයේ විනිවිදභාවය, වගවීම සහ අවංකභාවය සහතික වීම එහි මූලික භූමිකාව වේ.

ඩී.එම්. වීරසේකර මහතා
(සභාපති)
බී.ජී. දර්ශන මහතා
(සහකාර විගණාධිපති (නිරීක්ෂක))
මහාචාර්ය ජයන්ත ජයවර්ධන
වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාතන්
වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ
වෛද්‍ය චන්දන ධර්මරත්න
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ
වෛද්‍ය චන්දික එපිටකඩුව
වෛද්‍ය හරිත අලුත්ගේ
වෛද්‍ය ඩී.එස්. සමරවීර

**සභාවේ පරිපාලනය**

වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)
ඒ. වෛද්‍යරත්න මහත්මිය
(ප්‍රධානී - මුදල් අංශය)

## 18. ගොඩනැඟිලි කමිටුව

මෙම කමිටුවට පවරා ඇත්තේ සභාවේ මෙහෙයුම්වලට අදාළ භෞතික යටිතලපහසුකම්වල සැලැසුම, සංවර්ධනය, නඩත්තුව සහ කළමනාකරණය අධීක්ෂණය කිරීම ය. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පහසුකම්, ක්‍රියාකාරිත්වය, ආරක්ෂාව සහ නියාමන අවශ්‍යතාවන් හා එකඟ වීම යන ඒවා සඳහා අවශ්‍ය වන ප්‍රමිතීන් සපුරා ලන බවට සහතික වීම ඊට ඇතුළත් වේ.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)

වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ
වෛද්‍ය ජනක රාජපක්ෂ
වෛද්‍ය චන්දික එපිටකඩුව
වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාතන්

**සභාවේ පරිපාලනය**
වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)

## 19. නැවත සනාථ කිරීමේ කමිටු රැස්වීම

නැවත සනාථ කිරීමේ කමිටුව මඟින් ජාතික අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සහතික කිරීමෙහි ලා වැදගත් භූමිකාවක් ඉටු වේ. සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නායකත්වය ගනු ලැබූ මෙම මූලාරම්භය, පුළුල් පරාසයක පාර්ශ්වකරුවන්ගේ ද සහභාගිත්වයෙන් ක්‍රියාවට නැඟී ඇත. සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන් ජාතික සහ අන්තර්ජාතික සුභාවිතයන් හා සමගාමීව අඛණ්ඩව සිය දැනුම සහ කුසලතා වර්ධනය කර ගන්නා බවට සහතික වෙමින් වෘත්තීය සංවර්ධනයේ ප්‍රමිතීන් සඳහා පහසුකම් සැලසීම, අධීක්ෂණය කිරීම සහ පවත්වා ගෙන යාම මෙම කමිටුවේ වගකීම වේ.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)
වෛද්‍ය එම්.ඒ.එස්.සී. සමරකෝන්
(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්)
(අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ) - සෞඛ්‍ය අමාත්‍යාංශය
වෛද්‍ය සමන්ත රණසිංහ (අධ්‍යක්ෂ - පුහුණු)
සෞඛ්‍ය අමාත්‍යාංශය
මහාචාර්ය මංජුල ආටිගල
වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාතන්
වෛද්‍ය ඩී.එස්. සමරවීර
වෛද්‍ය චන්දික එපිටකඩුව

**සභාවේ පරිපාලනය**
වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)

## 20. වෛද්‍ය හා දන්ත වෛද්‍ය අධ්‍යාපන කමිටුව

වෛද්‍ය සහ දන්ත වෛද්‍ය අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වා ගෙන යාම ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෙත පැවරී ඇති රාජකාරියයි. ප්‍රතිපත්ති පරතරයන් සහ කල්පිනූ නීති පද්ධති හේතුවෙන් වර්තමානයේ රෝගීන්ගේ සුරක්ෂාවට අවදානමක ප්‍රවණතාවක් පැන නැඟී ඇත. තොරතුරු තාක්ෂණයේ සහ සමාජ මාධ්‍යවල ශීඝ්‍ර දියුණුව තුළින්, විශේෂයෙන් පාර්ලිමේන්තුව මඟින් අනුමත කරන ලද රෝගීන්ගේ ආරක්ෂාව පිළිබඳ ප්‍රඥප්තිය කරණ කොට ගෙන, කඩිනම් පියවර ගැනීමට බලපෑමක් එල්ල වේ. වර්තමානයේ, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ඇතුළත වෛද්‍ය සහ දන්ත වෛද්‍ය අධ්‍යාපනයෙහි අනාගතයට මඟ පෙන්වීම සඳහා ම වෙන් වූ යාන්ත්‍රණයක් නොමැත. ප්‍රතිපත්ති මට්ටමේ ගැටලුවලට මුහුණදීමට සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට විශේෂිත කමිටුවක් ස්ථාපනය කිරීම ඉතා වැදගත් වේ.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)
මහාචාර්ය මනෝරි ගමගේ
මහාචාර්ය සුරංගී යසවර්ධන
මහාචාර්ය මාධව චන්ද්‍රතිලක
මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක
වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාතන්
වෛද්‍ය ජනක පුෂ්පකුමාර
වෛද්‍ය දර්ශන සිරිසේන
වෛද්‍ය හරිත අලුත්ගේ
වෛද්‍ය චන්දන ධර්මරත්න
වෛද්‍ය චන්දික එපිටකඩුව
වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ

**සභාවේ පරිපාලනය**
වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)

## 21. ආචාර ධර්ම කමිටුව

වෘත්තීයමය සහ සායනික ආචාර ධර්ම හා සම්බන්ධ සියලු ගැටලුවලට මුහුණදීම ආචාර ධර්ම කමිටුවේ වගකීමයි. එහි මූලික ක්‍රියාකාරකම්වලට, සදාචාරාත්මක ප්‍රමිතීන් තීරණය කිරීම, මාර්ගෝපදේශ සකස් කිරීම සහ සංශෝධනය කිරීම සහ වෛද්‍ය වෘත්තියේ සදාචාරාත්මක අවංක භාවය සහතික වීම සඳහා අදාළ වන විධිවිධාන නිකුත් කිරීම ඇතුළත් වේ. සදාචාරාත්මක ප්‍රතිපත්ති චිරස්ථායී කිරීමෙහි සහ සෞඛ්‍යාරක්ෂණ ක්ෂේත්‍රය ඇතුළත වෘත්තීයමය සංස්කෘතියක් බිහි කිරීමෙහි ලා මෙම කමිටුව මඟින් ඉතා වැදගත් භූමිකාවක් ඉටු කෙරේ.

මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක
(සභාපති)
මහාචාර්ය මනෝරි ගමගේ
මහාචාර්ය සුරංගී යසවර්ධන
මහාචාර්ය මාධව චන්ද්‍රතිලක
මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක
වෛද්‍ය ජනක පුෂ්පකුමාර
වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාතන්
වෛද්‍ය හරිත අලුත්ගේ
වෛද්‍ය චන්දික එපිටකඩුව
වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ
වෛද්‍ය චන්දන ධර්මරත්න
වෛද්‍ය ඩී.එස්. සමරවීර

**සභාවේ පරිපාලනය**
වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනූෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)
පූජා නානායක්කාර මහතා
(නීති අංශයේ ප්‍රධානී)

## 22. දේශසීමාන්තර ටෙලි වෛද්‍ය ක්‍රම පිළිබඳ අනුකමිටුව

දේශසීමාන්තර ටෙලි වෛද්‍ය ක්‍රම පිළිබඳ අනුකමිටුව යනු ටෙලි වෛද්‍ය ක්‍රම භාවිතයෙන් අන්තර්ජාතික දේශ සීමා හරහා සෞඛ්‍යාරක්ෂණ සේවා සැපයීම හා බැඳුණු නියාමනික, තාක්ෂණික, සදාචාරාත්මක සහ මෙහෙයුම් අභියෝගවලට මුහුණදීම ඉලක්ක කොට ගත් ඒ වෙනුවෙන් ම සැකසුණ ව්‍යුහයකි. මාර්ගෝපදේශ සකස් කිරීම, අන්තර්ප්‍රතිග්‍රහණය ප්‍රවර්ධනය කිරීම, නෛතික සහ දත්ත ආරක්ෂණ ව්‍යුහය හා එකඟ වන බවට සහතික වීම සහ විවිධ බලප්‍රදේශවල සිටින සෞඛ්‍යාරක්ෂණ සපයන්නන්, ප්‍රතිපත්ති සකස් කරන්නන් සහ පාර්ශ්වකරුවන් අතර සහයෝගිතාව සඳහා පහසුකම් සැපයීම සඳහා මෙම උපකමිටුව කටයුතු කරයි. එහි ඉලක්කය වන්නේ රෝගීන්ගේ සුරක්ෂිත බව, දත්තවල ආරක්ෂාව සහ අන්තර්ජාතික ප්‍රමිතීන් පිළිපැදීම සහතික කරමින් ප්‍රමිතියෙන් යුත් සෞඛ්‍යාරක්ෂණයක් සඳහා වන ප්‍රවේශය ගෝලීය වශයෙන් වර්ධනය කර ගැනීම ය.

මහාචාර්ය ආර්.බී. මාරසිංහ
(සභාපති)
වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාතන්
වෛද්‍ය චන්දන ධර්මරත්න
වෛද්‍ය ජනක පුෂ්පකුමාර
වෛද්‍ය හරිත අලුත්ගේ
වෛද්‍ය ලාල් පනාපිටිය
වෛද්‍ය ඩී.එස්. සමරවීර
වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ
වෛද්‍ය අනිල් සමරනායක
වෛද්‍ය ගුමිඳු කුලතුංග

**සභාවේ පරිපාලනය**
වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
(ලේඛකාධිකාරී)
අනුෂා සබානාතන් මහත්මිය
(සහකාර ලේඛකාධිකාරී)
ජුඩ් නානායක්කාර මහතා
(නීති අංශයේ ප්‍රධානී)

# ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පාර්ශ්වකරුවන්ට වටිනාකමක් නිර්මාණය කිරීම



## 4.1. රෝගීන්

### ලේඛන නඩත්තු කිරීම

රෝගීන්ගේ දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් පහත සඳහන් ලේඛන නඩත්තු කරනු ලැබේ:-

- විශේෂඥ වෛද්‍ය වෘත්තිකයන් (39 b වගන්තිය)
- විශේෂඥ දන්ත වෛද්‍ය වෘත්තිකයන් (39 b වගන්තිය)
- වෛද්‍ය වෘත්තිකයන් (29 වගන්තිය සහ ACT 15)
- දන්ත වෛද්‍ය වෘත්තිකයන් (43 වගන්තිය)
- ලියාපදිංචි වූ වෛද්‍ය වෘත්තිකයන් (41 වගන්තිය)
- වින්නඹු මාතාවන් (51 වගන්තිය)
- ඖෂධවේදීන් (56 වගන්තිය)
- පරිපූරක වෛද්‍ය සහකාරවරුන් (60 A වගන්තිය) - විද්‍යුත් කන්තු රේඛන සටහන් ශිල්පීන්, ශ්‍රවණවේදීන්, සායනික කායික විද්‍යාඥයන්, කථන චිකිත්සකයන්, පාද රෝග චිකිත්සනයන්, ආහාරවේදීන්, අක්ෂි සහායකයන්, විද්‍යුත් විච්ඡේදන සටහන් ශිල්පීන්, පෝෂණවේදීන්, සායනික මනෝ චිකිත්සකයන්
- පරිපූරක වෛද්‍ය වෘත්තිකයන් (60 F වගන්තිය) - විකිරණ ශිල්පීන්, වෛද්‍ය පර්යේෂණාගාර තාක්ෂණ ශිල්පීන්, භෞත චිකිත්සකයන්, වෘත්තීය චිකිත්සකයන්
- වෛද්‍ය වෘත්තිකයන්ගේ, දන්ත වෛද්‍ය වෘත්තිකයන්ගේ සහ හෙද නිලධාරීන්ගේ තාවකාලික ලියාපදිංචිය (67 A වගන්තිය)

### තහවුරු කිරීම්

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් පහත සඳහන් තහවුරු කිරීමේ සේවාවන් සලස්වනු ලැබේ:-

- විදේශ රැකියාවන් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයට නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික තහවුරු කිරීම
- සෞඛ්‍යාරක්ෂණ ආයතනවල සේවයට බඳවා ගැනීමට පෙර වෘත්තිකයන්ගේ ලියාපදිංචිය තහවුරු කිරීම

### සැලකිලිමත් බව නංවා ලීම

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සමඟ ලියාපදිංචි වී සිටින ඕනෑ ම වෘත්තිකයකුට එරෙහිව නඟන ලද පැමිණිල්ලක් විභාග කිරීමට සභාවට බලය ඇත.

පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම සඳහා:-

1.0 වෛද්‍ය වෘත්තිකයා/යන්ට එරෙහිව නඟා ඇති කරුණු / චෝදනා සඳහන් කරන ලද දිවුරුම් ප්‍රකාශයක් සමඟ සභාපති ඇමතූ ලිපියක් මාර්ගයෙන් පැමිණිල්ල ඉදිරිපත් කළ යුතු ය.

2.0 චෝදනා ලැබූ වෘත්තිකයා/යන්ගේ සම්පූර්ණ නම/නම් දිවුරුම් ප්‍රකාශයේ පැහැදිලිව සඳහන් කර තිබිය යුතු ය. පැමිණිලිකරු/වන්ගේ සම්පූර්ණ නම/නම් සම්බන්ධ කර ගත හැකි ලිපිනයන් හා දුරකතන අංක ආවරණ ලිපියේ පැහැදිලිව සඳහන් කර තිබිය යුතු ය.

## 4.2 ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ විමර්ශන ක්‍රියා පටිපාටිය

### මූලික විමර්ශනය:

මූලික විමර්ශන කමිටුවට පැමිණිල්ලක් යොමු කරනු ලැබූ විට, තමන්ට එරෙහිව නඟා ඇති පැමිණිල්ල පිළිබඳව වෘත්තිකයා වෙත දැනුම් දෙනු ලැබේ. ඉදිරිපත් කර ඇති සියලු ම දිවුරුම් ප්‍රකාශවල පිටපත් ද වෘත්තිකයාට දැක ගැනීමට සැලැස්විය යුතු ය. අනතුරුව, එම පැමිණිල්ල / වාර්තාව පිළිබඳව අදාළ වෘත්තිකයාගේ නිදහසට කීමට ඇති කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීමට එම වෘත්තිකයාට අවස්ථාවක් හිමි වේ. ඉන් අනතුරුව කමිටුව විසින් අදාළ පාර්ශ්වයන් සියල්ලගේ ම සාක්ෂිවලට සවන් දී මෙම ගැටලුව විමර්ශනය කර, සිය සොයා ගැනීම් අන්තර්ගත වාර්තාවක් සකස් කර වෘත්තීය චර්යා කමිටුව වෙත යොමු කරනු ලැබේ.

### වෘත්තීය චර්යා විමර්ශනය:

- මූලික විමර්ශන කමිටුවේ වාර්තාව සලකා බලන වෘත්තීය චර්යා කමිටුව, පැමිණිල්ලේ හෝ වාර්තාවේ චෝදනා නඟා ඇති කරුණු හෝ ගැටලු සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්විය යුතු ද නැත් දැයි තීන්දු කරයි. විමර්ශනයක් පැවැත්විය යුතු නැතැයි තීරණය කරන ලද හොත් පැමිණිලිකරුට සහ වෘත්තිකයාට එම තීරණය පිළිබඳව දැනුම් දීමට පියවර ගනු ලැබේ.
- ගැටලුව සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්විය යුතු යැයි වෘත්තීය චර්යා කමිටුව තීරණය කළ හොත්, වෘත්තිකයාට එරෙහිව නඟා ඇති චෝදනා විශේෂයෙන් දක්වමින් විමර්ශන දැනුම් දීමක් වෘත්තිකයා වෙත පිරිනමනු ලැබේ. මෙම විමර්ශන දැනුම් දීමේ පිටපතක් පැමිණිලිකරු වෙත ද යොමු කළ යුතු ය.
- අනතුරුව, ගැටලුව සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වනු ලබන අතර චෝදනා නඟා ඇති කරුණු සම්බන්ධයෙන් එහි දී සාක්ෂි ඉදිරිපත් කරනු ඇත. තමාට එරෙහිව නඟා ඇති එකී චෝදනා ප්‍රතික්ෂේප කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමට වෘත්තිකයාට ද අවස්ථාවක් සැලසිය යුතු ය.
- වෘත්තීය චර්යා කමිටුවට සතුටුදායක වන මට්ටමකින් චෝදනා ඔප්පු වී ඇත් දැයි නඩු විභාගය අවසානයේ දී වෘත්තීය චර්යා කමිටුව විසින් තීන්දු කරනු ඇත. වරදකරු බවට ඔප්පු වුව හොත් එම තීන්දුව වාර්තා කරනු ලබන අතර වෘත්තීය චර්යා කමිටුවට යෝග්‍ය යැයි සිතෙන ආකාරයකට එම තීරණය නිවේදනය කරනු ලැබේ. එකී වෘත්තිකයා වරදකරු බවට ඔප්පු වුව හොත් ඔහුට දිය හැකි දඬුවම්වලට, 1927 අංක 26 දරන වෛද්‍ය ආඥා පනතේ (105 පරිච්ඡේදය) 25 වගන්තියේ සඳහන් කර ඇති පරිදි, වෘත්තිකයාගේ නම ලේඛනයෙන් ඉවත් කිරීම
- සහ නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා වැඩ තහනම් කිරීම ද ඇතුළත් වේ.
- වෘත්තීය චර්යා කමිටුව විසින් මෙම තීරණය පිළිබඳව සභාව වෙත දැනුම් දෙන අතර ඉන් අනතුරුව මෙම තීරණය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස සභාව විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරීට නියම කරනු ඇත.

## 4.3. වෛද්‍ය / දන්ත වෛද්‍ය වෘත්තිකයෝ

### වෛද්‍ය වෘත්තිකයන්ට සහ දන්ත වෛද්‍ය වෘත්තිකයන්ට සපයන සේවා

- විශේෂඥයන් ලියාපදිංචි කිරීම
- අතිරේක සුදුසුකම් ලියාපදිංචි කිරීම
- ලේඛනයේ විස්තර යාවත්කාලීන කිරීම
- ලියාපදිංචියේ උද්ධෘත සහතික නිකුත් කිරීම
- ලියාපදිංචිය අලුත් කිරීම / ලේඛනයේ නම් ප්‍රතිස්ථාපනය කිරීම / ලියවිලි සඳහා ඉල්ලීම් ලිපි ඉදිරිපත් කිරීම
- ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ හැඳුනුම්පත් නිකුත් කිරීම
- වෘත්තීය මාර්ගෝපදේශනය
- වෘත්තීය ලියාපදිංචිය
- ස්ථිර ලියාපදිංචිය
- තාවකාලික ලියාපදිංචිය (පුරවැසියන් නොවන වෘත්තිකයන්)
- සීමාවාසික පුහුණු සහතික ලියවිලි නිකුත් කිරීම
- විනය ක්‍රියා මාර්ග

## 4.4. වෛද්‍ය වෘත්තිකයන් සඳහා මඟ පෙන්වීම, උපදෙස් සහ ආචාර ධර්ම

**වෛද්‍ය ප්‍රතිඥාව**

**1. සදාචාරාත්මක සහ වෘත්තීය විෂමාචාර මාර්ගෝපදේශනය**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සමඟ ලියාපදිංචි වී සිටින වෛද්‍ය හා දන්ත වෛද්‍ය වෘත්තිකයන් සඳහා සදාචාරාත්මක චර්යාව පිළිබඳ මාර්ගෝපදේශ

වෛද්‍ය හා දන්ත වෛද්‍ය වෘත්තිකයන් සඳහා බරපතල වෘත්තීයමය විෂමාචාරය පිළිබඳව වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ උපදෙස්

වෛද්‍ය හා දන්ත වෛද්‍ය වෘත්තිකයන් සඳහා මාර්ගෝපදේශ - වෛද්‍ය සහ මරණ සහතික

**2. සීමාවාසික පුහුණු මාර්ගෝපදේශ සංග්‍රහය**

සීමාවාසික පුහුණුව සඳහා මාර්ගෝපදේශ – 2013 දී සංශෝධිතයි. මේ සඳහා අන්තර්ජාල සබැඳිය :- *https://slmc.gov.lk/en/education/internship*

**3. ERPM මාර්ගෝපදේශ සංග්‍රහය**

ශ්‍රී ලංකාවේ වෛද්‍ය වෘත්තියෙහි නියැළීම සඳහා ලියාපදිංචි කිරීම උදෙසා වන පරීක්ෂණය [Examination for Registration to Practice Medicine (ERPM)] සඳහා වන මාර්ගෝපදේශනයට සභාවේ අධ්‍යාපන කමිටුව මඟින් සකස් කර ඇති විභාග නීති ඇතුළත් වේ. මෙම සංශෝධිත නව ආකෘතිය 2017 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන අතර 2021 මැයි මස 26 දින යාවත්කාලීන කර ඇත. මෙහි අන්තර්ජාල සබැඳිය:- *https://slmc.gov.lk/en/examinations/erpm*

## 4.5 ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වෛද්‍ය අධ්‍යාපනය, පුහුණුව, අධීක්ෂණය සහ තත්ත්ව ආරක්ෂණය

**1. අවම ප්‍රමිති නියෝග**

වෛද්‍ය  අධ්‍යාපනය සඳහා වන අවම ප්‍රමිතීන් පහත පෙළගස්වා ඇති ගැසට් නිවේදන මඟින් නියම කොට ඇත:-

- අංක 2055/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය - 2018 ජනවාරි 26, සිකුරාදා
- 2155/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය - 2019 දෙසැම්බර් 26, බ්‍රහස්පතින්දා
- 2222/69 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය - 2021 අප්‍රේල් 10, සෙනසුරාදා

## වෛද්‍ය / දන්ත වෛද්‍ය ශිෂ්‍යයන්

**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් අනුමත කරන ලද විදේශීය වෛද්‍ය උපාධිධාරීන්**

# 2024 වර්ෂය තුළ
# විවිධ අංශවල කාර්යසාධනය

# ලියාපදිංචි කිරීමේ අංශය
# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

## වෛද්‍ය / දන්ත වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම - 2024 වර්ෂය







## වෛද්‍ය / දන්ත වෛද්‍ය වෘත්තිකයන් තාවකාලිකව ලියාපදිංචි කිරීම - 2024







## වෛද්‍ය / දන්ත වෛද්‍ය ලියාපදිංචිය

| එක් එක් වසරේ දෙසැම්බර් 31 දිනට සක්‍රිය ලියාපදිංචි බලපත්‍ර අංකයක් සහිත වෛද්‍ය වෘත්තිකයන් ගණන | |
|---|---|
| 2023 | 2024 |
| 35520 | 37463 |

| එක් එක් වසරේ දෙසැම්බර් 31 දිනට සක්‍රිය ලියාපදිංචි බලපත්‍ර අංකයක් සහිත දන්ත වෛද්‍ය වෘත්තිකයන් ගණන | |
|---|---|
| 2023 | 2024 |
| 2499 | 2599 |

## දේශීය / විදේශීය වෛද්‍ය විද්‍යාලවල උපාධිධාරීන් - 2024 (29 වගන්තිය)




## වෛද්‍ය වෘත්තිකයන්ගේ තාවකාලික ලියාපදිංචිය - 2024 (29(2) වගන්තිය)




## විශේෂඥයන් ලියාපදිංචිය (39 B වගන්තිය)

**2023**

වෛද්‍ය – 245

දන්ත වෛද්‍ය – 18

**2024**

වෛද්‍ය – 752

දන්ත වෛද්‍ය – 24

## අනෙකුත් සෞඛ්‍යාරක්ෂණ වර්ගීකරණ ලියාපදිංචි කිරීම 2024.12.31 දක්වා

වින්නඹු මාතාවන්, පාද රෝග චිකිත්සනයන්, අතිරේක වෘත්තිකයන්, ඖෂධවේදීන්, ආහාරවේදීන් සිට වෛද්‍ය, පරිපූරක වෛද්‍ය, සහකාර අක්ෂි සහායකයන්, විකිරණ ශිල්පීන් විද්‍යුත් තන්තු රේඛන සටහන්, විද්‍යුත් විච්ඡේදන සටහන්, වෛද්‍ය පර්යේෂණාගාර තාක්ෂණ ශිල්පීන්

**ලියාපදිංචි වූවන් ගණන – 2024**

| ලියාපදිංචි වූවන් වර්ගීකරණය | ලියාපදිංචි වූවන් ගණන – 2024 |
|---|---|
| SEC51 - (වින්නඹු මාතාවන්) | 1937 |
| SEC56 - (ඖෂධවේදීන්) | 6162 |
| SEC60E - (විද්‍යුත් තන්තු රේඛන සටහන් ශිල්පීන්) | 0015 |
| SEC60F - (ශ්‍රව්‍යවේදීන්) | 0046 |
| SEC60G - (සායනික කායික විද්‍යාඥයන්) | - |
| SEC60H - (කථන චිකිත්සකයන්) | 0094 |
| SEC60I - (පාද රෝග චිකිත්සනයන්) | - |
| SEC60J - (ආහාරවේදීන් ) | 0047 |
| SEC60K - ( අක්ෂි සහායකයන් ) | 0044 |
| SEC60L - (විද්‍යුත් විච්ඡේදන සටහන් ශිල්පීන්) | 0008 |
| SEC60M - (පෝෂණවේදීන්) | 0120 |
| SEC60N - (සායනික මනෝ චිකිත්සකයන්) | 0027 |
| SEC60A - (විකිරණ ශිල්පීන්) | 0494 |
| SEC60B - (වෛද්‍ය පර්යේෂණාගාර තාක්ෂණ ශිල්පීන්) | 1989 |
| SEC60C - (භෞත චිකිත්සකයන්) | 0698 |
| SEC60D - (වෘත්තීය චිකිත්සකයන්) | 0067 |

ප්‍රතීතන අංශය

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

**ප්‍රමුඛ වගකීම**

- 2018 අංක 01 දරන වෛද්‍ය (වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතීන් පවත්වා ගෙන යාම) නියෝගවලට සහ ඊට කලින් කලට සිදු කරන සංශෝධනයන්ට අනුව ශ්‍රී ලංකාව තුළ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක හෝ වැඩසටහනක ප්‍රතීතන තීරණ ගැනීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකස් කිරීම.

- වෛද්‍ය සහ දන්ත වෛද්‍ය පාසල්වල වසර පහකට වරක් මෙවැනි ප්‍රතීතනයන් ක්‍රියාත්මක කිරීම

**ප්‍රතීතන අංශයේ කාර්ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| මහාචාර්ය ගෝමින්ද පොන්නම්පෙරුම | - | අංශ ප්‍රධානි |
| වෛද්‍ය පාලිත අබේකෝන් | - | සාමාජික |
| මහාචාර්ය සුරංගී යසවර්ධන | - | සාමාජික |
| මහාචාර්ය මාධව චන්ද්‍රතිලක | - | සාමාජික |
| මහාචාර්ය පණ්ඩුල සිරිබද්ධන | - | සාමාජික |
| නදීකා විජේදාස මහත්මිය | - | කළමනාකරණ සහකාර |

**ප්‍රතීතන අංශයේ වෙබ් අඩවිය**

ප්‍රතීතන අංශයට ම වෙන් වූ වෙබ් අඩවිය (www.au.slmc.gov.lk) 2021 සැප්තැම්බර් මස දියත් කරන ලදි. මෙම වෙබ් අඩවිය මඟින් ප්‍රතීතන අංශයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් යාවත්කාලීන තොරතුරු, ක්‍රියාවලි, අදාළ ලියවිලි මෙන් ම වෛද්‍ය විද්‍යාල ප්‍රතීතනයට අදාළ වෙනත් වැදගත් විස්තර සපයනු ලැබේ. මෙම වෙබ් අඩවිය ජංගම මෙවලම් භාවිතයෙන් පවා භාවිතයට සහ ප්‍රවේශයට පහසු වන පරිදි සැලසුම් කර ඇත.

**රැස්වීම්**

ප්‍රතීතන අංශයේ සාමාජිකයන් නිත්‍ය සහ තත්කාලීන ප්‍රතීතන අංශ රැස්වීම්වලට සහභාගි වූ අතර සභාවේ සාමාජිකයෝ කිහිපදෙනෙක් ප්‍රතීතන කමිටු රැස්වීම්වලට සහභාගි වූහ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂ ද කමිටුවේ රැස්වීම් සඳහා ආරාධනා ලැබුවේ ය. සෑම රැස්වීමකට ම පෙර, න්‍යාය පත්‍රය සහ පසුගිය රැස්වීමේ වාර්තාව සියලු ම සාමාජිකයන් අතර බෙදා හරින ලදි. සෑම රැස්වීමක් සඳහා ම සාකච්ඡා කිරීම සඳහා අදාළ කාර්ය සටහන් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනිණ. සමහර රැස්වීම් මාර්ගගත / මිශ්‍ර ක්‍රමයට පවත්වන ලද අතර අනෙක් ඒවා භෞතික රැස්වීම් විය.

| | | |
|---|---|---|
| ප්‍රතීතන අංශයේ රැස්වීම් ගණන | - | 17 |
| ප්‍රතීතන අංශයේ විශේෂ රැස්වීම් ගණන | - | 01 |
| ප්‍රතීතන කමිටුවේ රැස්වීම් ගණන | - | 10 |
| වෛද්‍ය පීඨවල පීඨාධිපතින් සමඟ රැස්වීම් ගණන | - | 01 |

## ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යාල ප්‍රතීතනය කිරීම

ස්වයං අගැයීම් වාර්තා සම්පූර්ණ කොට අදාළ ඇමුණුම් සමඟ ඒවා ප්‍රතීතන අංශය වෙත භාර දෙන ලෙස පීඨාධිපතිවරුන්ගෙන් ඉල්ලීමක් කරන ලදි. සම්පූර්ණ කරන ලද ස්වයං අගැයීම් වාර්තා පීඨාධිපතිවරු වෙනස් වූ අවස්ථාවන්හි දී භාර දුන්හ. ඒවා ලැබුණ විට ප්‍රතීතන අංශය විසින් සමාලෝචන කණ්ඩායම් පත් කරන ලදි. මේස සමාලෝචනයක් සහ අදාළ පීඨයට සහ ශික්ෂණ රෝහලට කරන ලද දින තුනක සමාලෝචන චාරිකාවක් (නිරීක්ෂණ චාරිකාවක්) මෙම සමාලෝචන ක්‍රියාවලියට ඇතුළත් විය. නිරීක්ෂණ චාරිකාව අවසානයේ දී සමාලෝචන කණ්ඩායමේ නායක විසින් සමාලෝචන වාර්තාවේ කෙටුම්පත ප්‍රතීතන අංශයට භාර දෙන ලදි. සමාලෝචකයන් සහ පීඨාධිපති සමඟ සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව ප්‍රතීතනය පිළිබඳ තීරණය ද සමඟ අවසාන සමාලෝචන වාර්තාව සහතික කිරීම සඳහා සභාව වෙත යොමු කරන ලදි. සභාව මඟින් සහතික කිරීමෙන් අනතුරුව ප්‍රතීතන තීන්දුව අදාළ උප කුලපති සහ පීඨාධිපති වෙත දැනුම් දෙන ලදි. ප්‍රතීතන තීරණය (විනිශ්චය) යනු ප්‍රතීතනය පිරිනැමීම හෝ ප්‍රතික්ෂේප කිරීම ය. පීඨ නවය ම මෙම චක්‍රය සම්පූර්ණ කළ අතර 'සතුටුදායක ශ්‍රේණියේ සාමාන්‍ය ලකුණු රැස් කිරීමක්' සහිතව සියලු ම පීඨවලට 'ප්‍රතීතනය' ප්‍රදානය කරන ලදි.

ඉහත දක්වා ඇති ප්‍රතීතන සමාලෝචනවලට අමතරව, ප්‍රතීතන අංශය මඟින් වෙනත් ආකාරවල සමාලෝචනයන් දෙකක් ද ක්‍රියාත්මක කරන ලදි.

1. මෑතක දී ස්ථාපනය කරන ලද වෛද්‍ය විද්‍යාල සමාලෝචනය කිරීම
   මෙම වෛද්‍ය විද්‍යාල විසින් ප්‍රතීතන සමාලෝචනය සඳහා සුදුසුකම් සපුරන කාලය වන විට අවශ්‍ය ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීමට එම වෛද්‍ය විද්‍යාලවලට උපකාර කිරීම සඳහා වන ආකෘතික සමාලෝචනයකි. නිර්දේශ ද සමඟ සමාලෝචන වාර්තාවක් සමාලෝචනය අවසානයේ දී අදාළ විද්‍යාලයට සපයන ලදි.
2. ස්ථාපනය කිරීමට පෙර අනුමැතිය සඳහා යෝජිත වෛද්‍ය විද්‍යාල සමාලෝචනය කිරීම
   මෙය, මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා නව වෛද්‍ය විද්‍යාලයක් අනුමත කිරීමේ යෝග්‍යතාව අගැයීම උදෙසා ප්‍රතීතන අංශය විසින් පවත්වනු ලබන විධිමත් සමාලෝචනයකි.

| | | |
|---|---|---|
| දෙවන සමාලෝචන චාරිකාව පසුවිපරම් කිරීම | - | 01 |
| පීඨ වෙත ප්‍රාථමික සමාලෝචන චාරිකා | - | 04 |
| පීඨ වෙත ප්‍රාථමික දෙවන සමාලෝචන චාරිකා | - | 02 |
| රාජ්‍ය නොවන වෛද්‍ය විද්‍යාල අදියර 1 - සමාලෝචන චාරිකා | - | 03 |

(මේස අගැයීම, සමාලෝචන චාරිකාව, අවසාන සමාලෝචන වාර්තාව සහ උප කුලපතිට සහ පීඨාධිපතිට අවසාන තීරණය දැනුම් දීම)

*ප්‍රාථමික සමාලෝචන චාරිකාව, වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්වවිද්‍යාලය*

*ප්‍රාථමික සමාලෝචන චාරිකාව, වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලය*

**සමාලෝචකයෝ**

එක් එක් සමාලෝචන කණ්ඩායම් සඳහා වන සමාලෝචකයන් (එක් කණ්ඩායමක සාමාජිකයන් පස් දෙනා බැගින්) එවැනි පත් කිරීම් සඳහා වන පිරිවිතර පදනම් කොට ගෙන සමාලෝචක සංචිතයෙන් තෝරා ගන්නා ලදී.

| | | |
|---|---|---|
| ලැබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාව | - | 45 |
| පත් කරන ලද සමාලෝචකයන් සංඛ්‍යාව | - | 35 |
| පත් කරන ලද සමාලෝචන කණ්ඩායම් ගණන | - | 14 |

## පුහුණු වැඩසටහන්

ප්‍රතීතන අංශයේ සාමාජිකයන් සඳහා පුහුණු වැඩසටහන් තුනක් 2024.06.03 සිට 2024.06.08 දක්වා පවත්වන ලදි. පළමු පුහුණු වැඩසටහන සිංගප්පූරුවේ ද, ඉන් අනතුරුව අනෙක් පුහුණු වැඩසටහන් දෙක තායිලන්තයේ සහ ඉන්දුනීසියාවේ පවත්වන ලදි. මෙම පුහුණු වැඩසටහන්වලට සහභාගි වූ ප්‍රතීතන අංශයේ සාමාජිකයෝ එම රටවල් විසින් ප්‍රතීතනය හා සම්බන්ධයෙන් අනුගමනය කරන අන්‍යෝන්‍ය වශයෙන් ඵලදායී ප්‍රතිපත්ති සහ ක්‍රියා පිළිවෙළ සමාලෝචනය කළහ. ප්‍රතීතන අංශයේ සාමාජිකයෝ ඉන්දුනීසියාවේ ප්‍රතීතන නිරීක්ෂණ චාරිකාවකට ද සහභාගි වූහ. මෙම පුහුණුව සඳහා අනුග්‍රහය දක්වන ලද්දේ ලෝක සෞඛ්‍ය සංවිධානයයි.

| | | |
|---|---|---|
| ප්‍රතීතන අංශය සහ සමාලෝචකයන් සඳහා පුහුණු වැඩසටහන් ගණන | - | 03 |
| ප්‍රතීතන අංශයේ සාමාජිකයන් සහ සමාලෝචකයන් සඳහා පුහුණු වැඩසටහන් ගණන (සිංගප්පූරුවේ) | - | 02 |
| ප්‍රතීතන අංශයේ සාමාජිකයන් සහ සමාලෝචකයන් සඳහා පුහුණු වැඩසටහන් ගණන (තායිලන්තයේ) | - | 02 |
| ප්‍රතීතන අංශයේ සාමාජිකයන් සහ සමාලෝචකයන් සඳහා පුහුණු වැඩසටහන් ගණන (ඉන්දුනීසියාවේ) | - | 02 |

*ප්‍රතීතන අංශයේ සාමාජිකයන් සහ සමාලෝචකයන් සඳහා සිංගප්පූරුවේ පුහුණු වැඩමුළුව*

*ප්‍රතීතන අංශයේ සාමාජිකයන් සහ සමාලෝචකයන් සඳහා තායිලන්තයේ පුහුණු වැඩමුළුව*

*ප්‍රතීතන අංශයේ සාමාජිකයන් සහ සමාලෝචකයන් සඳහා ඉන්දුනීසියාවේ පුහුණු වැඩමුළුව*

වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ ලෝක සංවිධානයේ නිර්දේශ ආමන්ත්‍රණය කිරීම පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරන ලද අතර වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ ලෝක සංවිධානය විසින් එය ලද බව දැනුම් දී ඇත. ඊට අමතරව, වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ ලෝක සංවිධානය විසින් 2025 මැයි මස පැවැත්වීමට නියමිත සිය අන්තර්ජාතික සම්මන්ත්‍රණය සඳහා ප්‍රතීතන අංශයේ සාමාජිකයන් දෙදෙනකුට ආරාධනා කර ඇත.

**වියදම් වාර්තාව**

අවශ්‍ය අරමුදල් සභාව මගින් වෙන් කරන ලදි. සාධාරණීකරණය සමඟ කරන ලද ඉල්ලීම අනුව කළමනාකරණ කමිටුව සහ සභාව මගින් අදාළ වියදම් අනුමත කරන ලදි. ප්‍රසම්පාදන සහ අවසාන ගෙවීම් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මුදල් අංශය මගින් සිදු කරන ලදි. ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලැබුණ අරමුදල් ප්‍රතීතන අංශයේ ප්‍රධානී විසින් ලබා ගත් අතර ප්‍රසම්පාදනය කරන ලද්දේ ලෝක සෞඛ්‍ය සංවිධානය විසිනි.

| | | |
|---|---|---|
| වැටුප් සහ පුනරාවර්තන වියදම් | - | රු. මිලියන 2.8 |
| ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් ලැබුණ මුළු ප්‍රතිපාදන | - | රු. මිලියන 3.0 |
| ප්‍රතීතන අංශයේ කණ්ඩායම සහ සමාලෝචකයන් පුහුණු කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලැබුණ මුළු ආධාරය (සිංගප්පූරුව / තායිලන්තය / ඉන්දුනීසියාව) | - | USD 26,000 |

මහාචාර්ය ගෝමින්ද පොන්නම්පෙරුම
ප්‍රධානී, ප්‍රතීතන අංශය

# විභාග අංශය
# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

# වාර්ෂික වාර්තාව - 2024
## විභාග අංශය - ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

**ERPM / ERPDS විභාග**

වසරක් ඇතුළත එක් ERPM විභාගයක් සම්පූර්ණ කිරීමට ද, A සහ D කොටස් විභාග එකක් ද, B හා C කොටස් විභාග එකක් ද, සම්පූර්ණ ERPDS විභාග දෙකක් ද පැවැත්වීමට විභාග අංශයට හැකි විය.

2023 ඔක්තෝබර් / නොවැම්බර් මාසවල A සහ D කොටස් පවත්වන ලද ERPM විභාගයේ ඉතිරි B හා C කොටස්, රජයේ වෛද්‍ය පීඨ 8 තුළ දී (කොළඹ, පේරාදෙනිය, යාපනය, රුහුණ, කැලණිය, ශ්‍රී ජයවර්ධනපුර, රජරට සහ නැඟෙනහිර) 2024 ජනවාරි සිට මාර්තු දක්වා පවත්වන ලදි. මෙම විභාගයට අපේක්ෂකයෝ 582 ක් පෙනී සිටියහ. සුදුසුකම් ලැබූ වෛද්‍ය උපාධිධාරීන් 162 ගේ කුසලතා ලේඛනය 2024 ජූනි 06 වැනි දා සෞඛ්‍ය අමාත්‍යාංශයට යවන ලදි.

දෙවන ERPM විභාගයේ A සහ D කොටස් 2024 ජූනි මස කොළඹ 08, ඇක්වයිනාස් උසස් අධ්‍යාපන විද්‍යාලයේ දී පවත්වන ලද අතර අපේක්ෂකයෝ 868 දෙනෙක් ඊට පෙනී සිටියහ. ප්‍රතිඵල 2024 ජූලි මස නිකුත් කරන ලදි. ඉතිරි B හා C කොටස් 2024 අගෝස්තු / සැප්තැම්බර් මාසවල රජයේ වෛද්‍ය පීඨ 8 තුළ දී (කොළඹ, පේරාදෙනිය, යාපනය, රුහුණ, කැලණිය, ශ්‍රී ජයවර්ධනපුර, රජරට සහ නැඟෙනහිර) පවත්වන ලදි. මෙම විභාගයට අපේක්ෂකයෝ 733 දෙනෙක් පෙනී සිටියහ. සුදුසුකම් ලැබූ වෛද්‍ය උපාධිධාරීන් 3252 දෙනකුගේ කුසලතා ලේඛනය 2024 ඔක්තෝබර් 16 වැනි දා සෞඛ්‍ය අමාත්‍යාංශයට යවන ලදි.

තුන්වන ERPM විභාගයේ A සහ D කොටස් 2024 නොවැම්බර් මස කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යාපන පීඨයේ පවත්වන ලද අතර අපේක්ෂකයෝ 784 දෙනෙක් මෙම විභාගයට පෙනී සිටියහ. ප්‍රතිඵල 2024 දෙසැම්බර් මස නිකුත් කරන ලදි. ඉතිරි B හා C කොටස් 2025 පෙබරවාරි-මාර්තු මාසවල පැවැත්වීමට සැලසුම් කර ඇත.

පළමු ERPDS විභාගයේ I කොටස 2024 මාර්තු මස කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ දී පවත්වන ලද අතර අපේක්ෂකයෝ 14 දෙනෙක් මෙම විභාගයට පෙනී සිටියහ. ඉතිරි II කොටස 2024 අප්‍රේල් මස පේරාදෙනිය දන්ත වෛද්‍ය පීඨයේ පවත්වන ලදි. අපේක්ෂකයන් 14 දෙනෙක් මෙම විභාගයට පෙනී සිටි අතර 2024 මැයි මාසයේ දී ප්‍රතිඵල නිකුත් කරන ලදි. සුදුසුකම් ලැබූ දන්ත වෛද්‍ය උපාධිධාරීන් 4දෙනකුගේ කුසලතා ලේඛනය 2024 මැයි 03 වැනි දා සෞඛ්‍ය අමාත්‍යාංශයට යවන ලදි.

දෙවන ERPDS විභාගයේ I කොටස 2024 සැප්තැම්බර් මස කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ දී පවත්වන ලද අතර අපේක්ෂකයෝ 7 දෙනෙක් මෙම විභාගයට පෙනී සිටියහ. ඉතිරි II කොටස 2024 නොවැම්බර් මස විභාග මධ්‍යස්ථාන තුනක (කොළඹ ජාතික දන්ත වෛද්‍ය රෝහල, කොළඹ රිජ්වේ ආර්යා රෝහල, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දන්ත වෛද්‍ය පීඨය) දී පවත්වන ලදි. අපේක්ෂකයන් 14 දෙනෙක් මෙම විභාගයට පෙනී සිටි අතර 2024 දෙසැම්බර් මාසයේ දී ප්‍රතිඵල නිකුත් කරන ලදි. සුදුසුකම් ලැබූ දන්ත වෛද්‍ය උපාධිධාරීන් 8 දෙනකුගේ කුසලතා ලේඛනය 2025 ජනවාරි 06 වැනි දා සෞඛ්‍ය අමාත්‍යාංශයට යවන ලදි.

.

# විදේශ උපාධි අංශය
# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව
# විදේශ උපාධි අංශයේ සාරාංශ වාර්ෂික වාර්තාව - 2024

## ප්‍රමුඛ වගකීම

පහත දැක්වෙන කරුණු මත පිළිගැනීම සහ අනුමැති තීරණ ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ අයදුම්පත් සකස් කිරීම සහ ඒවා අවසාන තීරණය ගැනීම සඳහා අදාළ ස්ථාවර කමිටුවලට සහ සභාවට ඉදිරිපත් කිරීම:-

1. විදේශ විශ්වවිද්‍යාල / ආයතන මඟින් යොමු කරන ලද 1 සහ 2 අයදුම්පත් පිළිගැනීම සහ ඒවා 2018 අංක 01 දරන වෛද්‍ය (වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතීන් පවත්වා ගෙන යාම) නියෝගවලට සහ ඊට කලින් කලට සිදු කරන සංශෝධනයන්ට අනුව අගැයීම
2. විදේශ උපාධිධාරීන්ගේ උපාධි, ඔවුන්ට ERPM විභාග සඳහා ලියාපදිංචි වීමට හැකි වන පරිදි සභාව විසින් තීරණය කරන ලද අවශ්‍යතාවන් අනුව අනුමත කිරීම
3. ලියාපදිංචි වී ඇති වෛද්‍ය වෘත්තිකයන් විසින් ලබා ගෙන ඇති විදේශ සහ දේශීය අතිරේක සුදුසුකම් ඔවුන්ගේ නමට ඉදිරියෙන් සඳහන් කිරීමට ඇතුළත් කිරීම සඳහා ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්, ආඥා පනතට සහ සභාව විසින් තීරණය කරන ලද මාර්ගෝපදේශවලට අනුව අගැයීම
4. **67A** යටතේ තාවකාලික ලියාපදිංචිය සඳහා විදේශ විශේෂඥයන් විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත්, ආඥා පනතට සහ සභාව විසින් තීරණය කරන ලද මාර්ගෝපදේශවලට අනුව අගැයීම

## විදේශ උපාධි අංශයේ කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| රොෂානි දිසානායක මහත්මිය | - | කළමනාකරණ සහකාර |
| වයි.එම්. මාදුගල මහත්මිය | - | කළමනාකරණ සහකාර |

## විදේශ විශ්වවිද්‍යාල / ආයතනවල අයදුම්පත් සමාලෝචකයෝ

2024 වර්ෂයේ දී අගැයීම් කරන ලද විශ්වවිද්‍යාල / වෛද්‍ය හා දන්ත වෛද්‍ය විද්‍යාල සඳහා සමාලෝචකයන් ලෙස පහත සඳහන් සමාලෝචන මණ්ඩල සාමාජිකයෝ සමාලෝචකයන් ලෙස සේවය කළහ.

**වෛද්‍ය විද්‍යාල සමාලෝචක මණ්ඩලය**

- මහාචාර්ය මනෝරි ගමගේ
- මහාචාර්ය වසන්ති පින්තෝ
- වෛද්‍ය ආර්. සුරේන්තිරකුමාරන්
- වෛද්‍ය ජනක පුෂ්පකුමාර
- මහාචාර්ය මාධව චන්ද්‍රතිලක
- මහාචාර්ය ගෝමින්ද පොන්නම්පෙරුම
- මහාචාර්ය අංජන ද සිල්වා
- මහාචාර්ය ආරියරාණී ඥාණතාසන්
- වෛද්‍ය සංජීව බෝවත්ත
- වෛද්‍ය ආර්.කේ.ජේ.එස්. රාජපක්ෂ
- මහාචාර්ය රසිකා පෙරේරා
- මහාචාර්ය කෝසල වීරකෝන්
- මහාචාර්ය ශ්‍යාමලී සමරනායක
- වෛද්‍ය උමංගා සූරියාරච්චි
- වෛද්‍ය කපිල ජයරත්න
- වෛද්‍ය ඩබ්ලිව්.ඒ.ඩී. තෙනුවන් තරංග වික්‍රමසිංහ
- වෛද්‍ය චන්දික එපිටකඩුව
- වෛද්‍ය ආර්.එන්.ඒ.එම්.යූ.කේ. බණ්ඩාර වරකාගොඩ

**දන්ත වෛද්‍ය විද්‍යාල සමාලෝචක මණ්ඩලය**

- වෛද්‍ය එස්. ෂන්මුගනාතන්
- මහාචාර්ය මංජුලා ආටිගල
- මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක
- වෛද්‍ය ගාමිණී නවරත්න

**රැස්වීම්**

විදේශ උපාධි කමිටුවේ රැස්වීම් සංඛ්‍යාව - 12

**පිළිගැනීම සඳහා විදේශ විශ්වවිද්‍යාල / ආයතනවලින් ලැබුණු අයදුම්පත්**

| | |
|---|---|
| අයදුම්පත් අංක 1 | |
| ලැබුණු මුළු සංඛ්‍යාව | 17 |
| අගයන ලද මුළු සංඛ්‍යාව | 17 |
| අනුමත කරන ලද මුළු සංඛ්‍යාව | 13 |
| කටයුතු කර ගෙන යන මුළු සංඛ්‍යාව | 04 |
| ප්‍රතික්ෂේප කරන ලද මුළු සංඛ්‍යාව | 01 |
| | |
| අයදුම්පත් අංක 2 | |
| ලැබුණු මුළු සංඛ්‍යාව | 10 |
| අගයන ලද මුළු සංඛ්‍යාව | 10 |
| අනුමත කරන ලද මුළු සංඛ්‍යාව | 09 |
| කටයුතු කර ගෙන යන මුළු සංඛ්‍යාව | 08 |
| | |

**උපාධි අනුමැතිය සඳහා අයදුම්පත්**

ERPM විභාගය

පවත්වන ලද වට ගණන

- 2023 නොවැම්බර් 01 සිට 2024 පෙබරවාරි 01 (1 වටය)
- 2024 මැයි 06 සිට 2024 ජූලි 15 (2 වටය)

අයදුම්පත් සාරාංශය

- 1 වටය
  - මුළු අයදුම්පත් ගණන - 417
  - අනුමත කිරීම් - 414
  - ප්‍රතික්ෂේප කිරීම් - 03

- 2 වටය
  - මුළු අයදුම්පත් ගණන - 401
  - අනුමත කිරීම් - 395
  - ප්‍රතික්ෂේප කිරීම් - 06

ERPDS විභාගය

පවත්වන ලද වට ගණන

- 2023 නොවැම්බර් 01 සිට 2024 පෙබරවාරි 15 (1 වටය)
- 2024 මැයි 06 සිට 2024 ජූලි 15 (2 වටය)

අයදුම්පත් සාරාංශය

- 1 වටය
    - මුළු අයදුම්පත් ගණන - 10
    - අනුමත කිරීම් - 09
    - ප්‍රතික්ෂේප කිරීම් - 01

- 2 වටය
    - මුළු අයදුම්පත් ගණන - 01
    - අනුමත කිරීම් - 01
    - ප්‍රතික්ෂේප කිරීම් - 00

**උපාධි අනුමැති අයදුම්පත්**

පවත්වන ලද වට ගණන - 02
සියලු වටවලට අදාළ මුළු කාලය - මාස 08
(විවෘත කිරීමේ සිට අවසන් කිරීම දක්වා)

1 වටය (2023 අප්‍රේල්) - මෙම වටය 2023 ජනවාරිවලට පෙර අවසන් විය. මෙහි සාරාංශය 2022 වාර්ෂික වාර්තාවෙහි දැනටමත් සඳහන් කර ඇත.

2 වටය (2023 ඔක්තෝබර්)
ලැබුණු මුළු අයදුම්පත් ගණන - 382
අනුමත කිරීම් - 353
ප්‍රතික්ෂේප කිරීම් - 09

**අතිරේක සුදුසුකම් අයදුම්පත් (2023 ජනවාරි - දෙසැම්බර්)**
ලැබුණු දේශීය සුදුසුකම් - 411 (145/2023/L -555/ 2023/L)
අනුමත කිරීම් - 409
ප්‍රතික්ෂේප කිරීම් - 02

ලැබුණු විදේශීය සුදුසුකම් - 78
අනුමත කිරීම් - 63
ප්‍රතික්ෂේප කිරීම් - 02
පොරොත්තු - 13

67A අයදුම්පත් (2023 ජනවාරි - දෙසැම්බර්)
ලැබුණු - 75
අනුමත කිරීම් - 73
ප්‍රතික්ෂේප කිරීම් - 02

# තොරතුරු තාක්ෂණ අංශය
# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව - තොරතුරු තාක්ෂණ අංශයේ වාර්ෂික වාර්තාව 2024

**තොරතුරු තාක්ෂණ අංශයේ වගකීම සහ භූමිකාව**

තොරතුරු තාක්ෂණ අංශය යනු ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ තාක්ෂණික කාර්යරාමුව සිය දැවැන්ත ඉලක්ක සහ අරමුණු හා සමගාමී වන බවට සහතික වීමෙහි ලා අතිශය වැදගත් ව්‍යුහයකි. මෙයට, ක්‍රියාකාරිත්වයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ ආයතනයේ මෙහෙවරට උපකාරී වීම සඳහා සකස් කරන ලද තාක්ෂණික විසඳුම්වල සැලකිලිමත් සංකල්පීයකරණය සහ උපායමාර්ගික ක්‍රියාත්මක කිරීම් සම්බන්ධ වේ. මෙම අංශය වෙත, නව පද්ධති ස්ථාපනය කිරීම, දැනට පවත්නා යටිතලපහසුකම් නිතිපතා නඩත්තු කිරීම සහ යල්පිනූ තාක්ෂණය කලට වේලාවට වැඩි දියුණු කිරීම ඇතුළු පුළුල් වගකීම් සම්භාරයක් පැවරී ඇත. ඊට අමතරව, තොරතුරු තාක්ෂණ අංශය විසින් කාර්ය ප්‍රවාහය විධිමත් කිරීම, ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ උද්ගත වන අභියෝගවලට මුහුණදීම සඳහා නවෝත්පාදන ක්‍රමවේද සහ මෙවලම් සක්‍රියව අත්හදා බලනු ලැබේ. තාක්ෂණ කළමනාකරණයට ක්‍රියාකාරී ප්‍රවේශයක් තෝරා ගැනීම මඟින්, සභාවේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයට දායක වන විශ්වාසදායී, කාර්යක්ෂම සහ අනාගතයට ඔරොත්තු දෙන විසඳුම් තොරතුරු තාක්ෂණ අංශය විසින් සහතික කරයි.

පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා තොරතුරු තාක්ෂණ අංශය අවශ්‍ය පරිදි වගකියනු ලැබේ:-

- දුරකතන සහ හඬ පද්ධතිය
- අන්තර්ජාල ප්‍රවේශය සහ විද්‍යුත් තැපැල
- පරිගණක / ලැප්ටොප් දෘඩාංග
- වැඩසටහන් මෘදුකාංග
- පිටපත් යන්ත්‍ර / ෆැක්ස් / පරිලෝකන යන්ත්‍ර - සියලු ම පර්යන්තයන්
- ශ්‍රව්‍ය හා දෘශ්‍ය මෙවලම්
- ජාල සුරක්ෂාව සහ කාර්යසාධනය පවත්වා ගෙන යාම; ක්‍රියා කළ හැකි නාමාවලි ආකෘතියක්, ජාල සුරක්ෂාව සහ තැටි අවකාශය වෙන් කිරීම යනාදිය ස්ථාපනය කරයි
- ස්ථාපනය කරන ලද ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ සීමා කිරීම් හා ගැලපෙන පරිදි පරිශීලක ගිණුම් සකසයි
- කාර්ය ඇණවුම් ඔස්සේ සියලු ප්‍රශ්න සහ ගැටලු සොයා ගනියි
- අවශ්‍ය වන විට නව දුරකතන මාර්ග සහ දත්ත කෙවෙණි සැලසුම් කරයි
- ජාල නඩත්තු, වෙනස් කිරීම් සහ උසස් කිරීම් ක්‍රියාත්මක කරයි

මෙම අංශය මඟින් තොරතුරු තාක්ෂණ සේවාවේ අඛණ්ඩ සැපයුම සහතික වන අතර ප්‍රසම්පාදන සඳහා වෙළෙන්දන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කරයි. නවෝත්පාදන සහ ඵලදායී සම්පත් කළමනාකරණය තුළින් අඛණ්ඩ අභිසංවර්ධනයක් සඳහා උපකාරී වෙයි.

## ව්‍යාපෘති සහ වැඩි දියුණු කිරීම - 2024 වසර

### 1. <u>වෛද්‍ය වෘත්තිකයන් සහ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සඳහා ලියාපදිංචිය අලුත් කිරීමේ මාර්ගගත ක්‍රමවේදය</u>

වෛද්‍ය වෘත්තිකයන් සහ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සඳහා වන ලියාපදිංචිය අලුත් කිරීමේ මාර්ගගත ක්‍රමවේදය යනු බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රියාවලිය නවීකරණය කිරීම සහ විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් භාර ගන්නා ලද ප්‍රමුඛතම ව්‍යාපෘතියකි. නියාමන ප්‍රමිතීන්ට කලට වේලාවට එකඟ වීමට පහසුකම් සැලසීම සඳහා ආරක්ෂිත, කාර්යක්ෂම සහ භාවිතයට පහසු ඩිජිටල් කරළියක නැඟී එන අවශ්‍යතාවට මෙම මූලාරම්භය මඟින් ආමන්ත්‍රණය කෙරේ.

අවසාන පරිශීලක සිහියේ තබා ගෙන සකස් කර ඇති මෙම පද්ධතිය මඟින්, භෞතිකව පෙනී සිටීමේ සහ ලියකියවිලි පිරවීමේ අවශ්‍යතාවකින් තොරව අලුත් කිරීමේ ක්‍රියාවලිය මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කිරීමට වෘත්තිකයන්ට ඉඩ සලසා දීම මඟින් පහසුව සහ ප්‍රවේශ්‍යතාව සහතික කෙරේ. දත්ත සුරක්ෂිතතාවේ සහ මෙහෙයුම් විශ්වාසනීයත්වයේ උසස් ප්‍රමිතීන් පවත්වා ගනිමින් එහි පරිශීලකයන්ගේ නානා විධ අවශ්‍යතාවන් පිරිමැසෙන ආකාරයේ වැඩි දියුණු කරන ලද මුහුණුවරකින් සමන්විත මෙම කරළියට renewal.slmc.gov.lk ඔස්සේ ප්‍රවේශ විය හැකි ය.

අරමුණු

- 35,000කට අධික ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයන් සහ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සඳහා පහසු අලුත් කිරීමේ ක්‍රියාවලියක් සහතික වීම
- නිරවද්‍ය සහ යාවත්කාලීන කරන ලද වෘත්තිකයන්ගේ දත්තමූලයක් පවත්වා ගැනීම
- අලුත් කිරීමේ විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම
- අලුත් කිරීමේ ක්‍රියාවලිය අවසානයේ දී වෘත්තිකයන්ට අලුත් කිරීමේ ඉ-සහතිකය බාගත කර ගත හැකි වේ.
- ඉ-සහතිකයට ඇතුළත් කර ඇති QR කේතය භාවිත කරමින් වෛද්‍ය වෘත්තිකයන් සහ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් තහවුරු කර ගැනීමට පහසුකම් සැලසීම
- අලුත් කිරීමේ ක්‍රියාවලිය අවසානයේ දී වෘත්තිකයන්ගේ දත්ත යාවත්කාලීන වන බවට සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වෙබ් අඩවියේ (slmc.gov.lk) සඳහන් වන ලේඛනය මඟින් තහවුරු කර ගැනීමට හැකි වන බවට සහතික වීම
- අතින් සිදු කරන කාර්යභාරය සහ ලියකියවිලි කටයුතු අඩු කිරීම
- අලුත් කිරීමේ ක්‍රියාවලියට 24/7 ප්‍රවේශය සහතික වීම

- දත්ත සුරක්ෂිතතාව සහ පෞද්ගලිකත්වය සුරැකීම ශක්තිමත් කිරීම
- බලපත්‍ර අලුත් කිරීම අනුමත කිරීමේ ප්‍රමාදයන් අවම කිරීම
- පහසු ගෙවීම් කටයුතු සහ තහවුරු කිරීම සොයා ගැනීම සඳහා පහසුකම් සැලසීම

**විෂය පථය**

- බලපත්‍ර අලුත් කිරීම සඳහා අවසානය දක්වා ම මාර්ගගත වූ ක්‍රමවේදයක් සකස් කිරීම
- ගාස්තු ගෙවීම සඳහා ආරක්ෂිත ගෙවීමේ ක්‍රමයන් ඇතුළත් කිරීම
- සාර්ථක අලුත් කිරීමක් අවසානයේ වෘත්තිකයන්ගේ තොරතුරු ක්ෂණිකව යාවත්කාලීන වීම
- අලුත් කිරීම් අධීක්ෂණය සඳහා විස්තීර්ණ වාර්තාකරණය

**තාක්ෂණික විස්තර**

- **දත්තමූල කළමනාකරණය:** වෘත්තිකයන්ගේ දත්ත විශාල පරිමාවකින් දරා ගැනීමට සහ ගනුදෙනුවන සුරක්ෂිත භාවය සහතික වීමට හැකි වන පරිදි ශක්තිමත් පරිමාණය කළ හැකි දත්තමූලයක් ආරම්භ කරන ලදි.
- **සර්වර් උපකරණ:** සමගාමී පරිශීලක ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සහ පද්ධතියට පිවිසීමේ හැකියාව පවත්වා ගෙන යාම සඳහා උසස් කාර්යසාධනයකින් යුත්, විශ්වාසවන්ත සර්වර් උපකරණ යොදවා ඇත.
- **ආරක්ෂාව:** පරිශීලකයන්ගේ දත්ත සහ ගනුදෙනු සුරක්ෂිත කිරීම සඳහා වැඩි දියුණු කරන ලද කේතන ක්‍රමවේදයන් සහ බහුසාධක සත්‍යාපනය කිරීම්

**සහයෝගීතාව**

ලේඛකාධිකාරී, තොරතුරු තාක්ෂණ අංශය සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කැප වූ කණ්ඩායම විසින් සිදු කරන ලද සක්‍රිය මැදිහත් වීම් සමඟින් කලට වේලාවට පහසුකම් සැපයීම සහතික වෙමින් සහ තත්ත්ව ආරක්ෂණයේ උසස් ප්‍රමිතීන් පවත්වා ගෙන යමින් මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාවට නැංවීමට හැකි විය.

**ක්‍රියාවලිය පිළිබඳ විශ්ලේෂණය**

වෘත්තිකයෝ ආරක්ෂාව පිළිබඳ විශ්වාසයකින් යුතුව පද්ධතියට පිවිස, සිය විස්තර යාවත්කාලීන කර, අනුමැතියට අවශ්‍යතාවන් සම්පූර්ණ කර, මාර්ගගත ක්‍රමයට අලුත් කිරීමේ ගාස්තු තැන්පත් කරති. අනුමැතිය ලැබීමෙන් අනතුරුව තහවුරු කිරීමේ විද්‍යුත් ලිපියක් යවන අතර අලුත් කරන ලද බලපත්‍රය ඔවුන්ගේ තොරතුරු පිටුවෙහි යාවත්කාලීන වේ.

ප්‍රතිලාභ

- ඕනෑ ම තැනක සිට අලුත් කිරීමේ පහසුව
- අතින් සිදු කරන ක්‍රියාවලිය අඩු කොට විධිමත් කරන ලද පරිපාලනය
- වැඩි දියුණු කරන ලද දත්ත සුරක්ෂිතතාව සහ මෙහෙයුම් විනිවිදභාවය

- ලියාපදිංචි වූ සියලු ම වෛද්‍යවරුන්ගේ සහ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ යාවත්කාලීන මධ්‍යගත දත්තමූලයක්
- පහසුව සහ කාර්යක්ෂමතාව සහිතව ලබා දෙන සම්පූර්ණයෙන් ම ඩිජිටල්කරණය වූ අලුත් කිරීමේ ක්‍රියා පිළිවෙළ
- අලුත් කිරීම පිළියෙළ කිරීමට වැය වන කාලය අඩු වීම මඟින් කලට වේලාවට බලපත්‍ර නිකුත් කිරීම සහතික වීම
- ලියකියවිලි භාවිතය අවම කිරීම මඟින් පරිසර හිතකාමී ප්‍රවේශය
- බුද්ධිමත් පද්ධති නිර්මාණයක් තුළින් වැඩි දියුණු කරන ලද පරිශීලක අත්දැකීමක්
- වෘත්තිකයන් සඳහා ක්ෂණික යාවත්කාලීන කිරීම් සහ දැනුවත් කිරීම්
- පද්ධතිමය දත්ත කළමනාකරණය තුළින් ශක්තිමත් කරන ලද නියාමන එකඟතාව

**කෙරෙමින් පවත්නා ක්‍රියාකාරකම් සහ නඩත්තුව**

- අනාගතයේ දී සිදු විය හැකි විස්තෘත කිරීම්වලට සහය වීම සඳහා පද්ධතියේ කාර්යසාධනය අධීක්ෂණය සහ වැඩි දියුණු කිරීම
- පරිශීලකයන්ගේ ප්‍රතිචාර සහ නියාමන සංශෝධන ඇතුළත් කිරීම සඳහා renewal.slmc.gov.lk කරළිය නිතිපතා යාවත්කාලීන කිරීම
- පද්ධතියේ උපරිම භාවිතය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලය අඛණ්ඩව පුහුණු කිරීම

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පරිකල්පනය වන්නේ අලුත් කිරීමේ ක්‍රියා පිළිවෙළ විධිමත් කිරීමට පමණක් නොව මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ සහ සේවා සැපයීමේ නව මිනුම්දඬු සකස් කිරීමට පවා හැකි අඛණ්ඩව වැඩි දියුණු වන ඩිජිටල් පරිසර පද්ධතියකි. වඩාත් පුළුල් පරාසයක වෘත්තිකයන් වර්ගීකරණයක් ඇතුළත් කිරීමට සහ කෘත්‍රිම බුද්ධියෙන් සිදු කරනු ලබන විශ්ලේෂණයන් එකතු කිරීමට හැකි වන පරිදි මෙම මාර්ගගත අලුත් කිරීමේ ක්‍රමවේදය විස්තාරණය කිරීම තුළින් තීරණ ගැනීම සහ සම්පත් ප්‍රශස්තකරණය වැඩි දියුණු කිරීමට සභාව ඉලක්ක කරයි. වෛද්‍ය ප්‍රජාවට සේවා සැපයීම තුළ විශිෂ්ටත්වය සහ නව්‍යකරණය සඳහා වන සභාවේ කැපවීම ශක්තිමත් කරමින්, ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් සමඟ අනාගත සහයෝගීතාව මඟින් වඩාත් සුදුසු තාක්ෂණය යොදා ගනු ලැබීම වැඩි දුරටත් සහතික වීමට හැකි වනු ඇත.

## 2. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ WhatsApp නාලිකාව දියත් කිරීම

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් 2024 දී රාජකාරී WhatsApp නාලිකාවක් දියත් කිරීම මඟින් වෛද්‍ය ප්‍රජාව සමඟ සන්නිවේදනය වැඩි දියුණු කිරීම උදෙසා අතිශය වැදගත් පියවරක් තබන ලදි. මෙම මූලාරම්භය වනාහී, ප්‍රවේශ වීමේ හැකියාව, ප්‍රතිචාර දැක්වීමේ හැකියාව සහ වෛද්‍ය වෘත්තිකයන්ට, ශිෂ්‍යයන්ට සහ මහජනතාවට අත්‍යවශ්‍ය තොරතුරු සම්ප්‍රේෂණය කිරීම වැඩි දියුණු කිරීම සඳහා නවීන තාක්ෂණය සහ ඩිජිටල් ක්‍රමවේදයන් යොදා ගැනීම යන සභාවේ පුළුල් උපායමාර්ගයෙහි කොටසකි. WhatsApp වැනි පුළුල්ව භාවිත කරනු ලබන පණිවිඩ හුවමාරු ක්‍රමවේදයක ශක්තිය යොදා ගැනීම තුළින්, පිටිසරබද හෝ පහසුකම් අඩු ප්‍රදේශ ද ඇතුළත්ව වඩාත් පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත ළඟා වීම මඟින් වැදගත් යාවත්කාලීනයන් සහ නිවේදනයන් ක්ෂණිකව සම්ප්‍රේෂණය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ඉලක්ක කරයි.

**වැදගත් කරුණු**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සන්නිවේදන උපායමාර්ග වැඩි දියුණු කිරීම සඳහා ගෙන යනු ලබන උත්සාහයන්හි වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් WhatsApp නාලිකාව නිල වශයෙන් ජනගත කරන ලද්දේ 2024 ජූනි මාසයේ දී ය. ජනගත කිරීමේ සිට නාලිකාව විසින් තනි පුද්ගලයන් 20,000කට ආසන්න සිත්ගන්නාසුලු අනුගාමික පදනමක් වර්තමානයේ අත් කර ගනිමින් සැලකිය යුතු ප්‍රතිචාරයක් එක් රැස් කර ගෙන ඇත. මෙම ක්ෂණික වර්ධනය මඟින් නාලිකාවේ ජනප්‍රියත්වය කැපී පෙනෙන අතර ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් තොරතුරු ලබා ගැනීමට වඩාත් සෘජු සහ කාර්යක්ෂම ක්‍රමයක් සඳහා ඇති ඉල්ලුම ද හුවා දක්වයි.

WhatsApp නාලිකාව පිටුපස ඇති මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සහ එහි පාර්ශ්වකරුවන් අතර සන්නිවේදනය විධිමත් කිරීම ය. නියාමන වෙනස්කම්, විභාග කාලසටහන්, ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම් සහ වෙනත් වැදගත් ප්‍රවෘත්තිවලට අදාළ යාවත්කාලීන කිරීම් සෘජුව ම ග්‍රාහකයන්ගේ ජංගම මෙවලම්වලට ක්ෂණිකව යැවීමට මෙම නාලිකාව තුළින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට හැකියාව ලැබේ. වෛද්‍ය වෘත්තිකයන් සහ ශිෂ්‍යයන් නව ප්‍රගතීන් පිළිබඳව දැනුවත් වීම තහවුරු කිරීම තුළින් මෙම ක්ෂණික සහ සෘජු සන්නිවේදන යාන්ත්‍රණය සිය අමිලත්වය ඔප්පු කොට ඇත.

**අභිප්‍රාය සහ ක්‍රියාකාරිත්වය**

**මෙම WhatsApp නාලිකාව පහත දැක්වෙන කරුණු ඇතුළත් බහුකාර්ය සේවයක් ඉටු කරයි:-**

- නව මාර්ගෝපදේශ, ප්‍රතිපත්ති වෙනස්කම් සහ වෛද්‍ය විභාග හෝ සහතික කිරීම් සම්බන්ධ නිවේදන වැනි වැදගත් නියාමනමය යාවත්කාලීනයන් ලබා දීම
- සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සාකච්ඡා වැනි ශ්‍රී ලංකා වෛද්‍ය සභාව හා සම්බන්ධ සිදු වීම් සහ ක්‍රියාකාරකම් පිළිබඳව කාලීන තොරතුරු ලබා දීම
- විමසීම් සඳහා පොරොත්තු කාලය අඩු කොට නිතර අසන ප්‍රශ්නවලට පිළිතුරු ඉක්මනින් සොයා ගැනීමට මහජනතාවට සහ වෛද්‍ය වෘත්තිකයන්ට කාර්යක්ෂම වේදිකාවක් පිරිනැමීම
- තාක්ෂණික ගැටලු සඳහා වඩා වේගවත් විසඳුම් සහ විමසීම්වල දී සහාය ලබා ගැනීමට ඉඩ සැලසීම මඟින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ තොරතුරු තාක්ෂණ සහායක කණ්ඩායම සමඟ සෘජුව සන්නිවේදනය කිරීමට පහසුකම් සැලසීම

**බලපෑම**

මෙම WhatsApp නාලිකාවේ සමාරම්භයේ පටන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සන්නිවේදන කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමෙහි ලා වැදගත් බලපෑමක් එල්ල කොට ඇත. WhatsApp යෙදුමෙහි ඇති ක්ෂණික ස්වභාවය හේතු කොට ගෙන, වැදගත් යාවත්කාලීනයන් ග්‍රාහකයන්ට එසැණින් ලැබීම සහතික වන බැවින් තොරතුරු වේගයෙන් බෙදා හැරීමට ඉඩකඩ සැලසේ. මේ මඟින් වඩාත් දැඩි විශ්වාසයක් සහ විනිවිද භාවයක් ගොඩ නැඟීම ඔස්සේ, සිය ප්‍රේක්ෂකයන් සමඟ කාර්යක්ෂම ලෙස කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට ඇති හැකියාව වැඩි දියුණු වී ඇත. මෙම නාලිකාව මඟින් වෛද්‍ය වෘත්තිකයන්ට සහ ශිෂ්‍යයන්ට වැදගත් තොරතුරුවලට ප්‍රවේශ වීම වඩාත් පහසු කර ඇති නිසා වෛද්‍ය ප්‍රජාව ඇතුළත සන්නිවේදනයේ තත්ත්වයේ සමස්ත වැඩි දියුණු වීමකට ඉන් දායකත්වය සපයා ඇත.

ඊට අමතරව, WhatsApp වේදිකාවේ අන්තර් ක්‍රියාකාරී ස්වභාවය නිසා, වඩාත් පුද්ගලාරෝපිත අත්දැකීමක් පරිශීලකයන්ට ලබා දෙමින් විමසුම්වලට සෘජුව ම මුහුණදීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට හැකි වී ඇත. මේ හේතුවෙන් පරිශීලකයන්ට සිය ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගැනීමට ගත වන කාලය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇති බැවින් තොරතුරු හුවමාරුව සඳහා ඉහළ කාර්යක්ෂමතාවක් සහිත මෙවලමක් බවට මෙම නාලිකාව පත් වී ඇත.

**අනාගත සැලසුම්**

අනාගතයේ දී සිය අනුගාමිකයන්ට වඩාත් යහපත් සේවාවක් සැලසීම සඳහා WhatsApp නාලිකාව වර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම අඛණ්ඩව සිදු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සැලසුම් කරයි. අනුග්‍රාහකයන් සංඛ්‍යාව වැඩි කිරීම සහ පරිශීලක සම්බන්ධතාව වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් මෙම නාලිකාවේ පැතිරීම පුළුල් කිරීමට සභාව ඉලක්ක කරයි. දෘශ්‍ය පට යාවත්කාලීන කිරීම්, අන්තර් ක්‍රියාකාරී මත විමසීම් සහ අනුග්‍රාහකයන්ගෙන් ප්‍රතිචාර එක් රැස් කිරීම සහ ඔවුන්ගේ අවශ්‍යතා වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම සඳහා සමීක්ෂණ පැවැත්වීම් වැනි නව මුහුණුවරයන් හඳුන්වා දීම මෙම සැලසුම්වල අන්තර්ගත ය.

දීර්ඝකාලීන වශයෙන් ගත් කල, පරිශීලකයන්ට වඩාත් පුළුල් සහ පරිපූර්ණ අත්දැකීමක් නිර්මාණය කරමින් WhatsApp නාලිකාව අනෙකුත් ඩිජිටල් සන්නිවේදන වේදිකාවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව අදහස් කරයි. සියලු ම පාර්ශ්වකරුවන්ට විශ්වාසදායී, කාලීන සහ සුගම තොරතුරු ලබා දෙමින් වෛද්‍ය ක්ෂේත්‍රයේ ඩිජිටල් සන්නිවේදනයේ පෙරමුණෙහි ශ්‍රී ලංකා වෛද්‍ය සභාව රැඳී සිටින බව මෙම සහයෝගිතාවය මඟින් සහතික කෙරෙනු ඇත.

# නීති අංශය

# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව
# නීති අංශයේ වාර්ෂික වාර්තාව - 2024

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නීති අංශය මඟින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව හා සම්බන්ධ සියලු නෛතික කටයුතු හසුරුවනු ලබයි. අධිකරණයේ පෙනී සිටීම, විනය පරීක්ෂණ ආරම්භ කිරීම සහ පැවැත්වීම, නීතිමය උපදෙස් ලබා දීම සහ නීතිමය සහයෝගය ලබා දීම එහි විෂය පථයට ඇතුළත් වේ. මෙම අංශය, නීති ප්‍රධානී, නීති නිලධාරීන්, අභිචෝදක නිලධාරී සහ කළමනාකරණ සහකාර යන නිලධාරීන්ගෙන් සමන්විත වේ.

2024 දී නීති අංශය මඟින් නව්‍යකරණ පියවර සහ උපායමාර්ගික තීරණ ගනු ලැබූ අතර ඒ මඟින් නීත්‍යානුකූල සහ ඵලදායී පාලන තන්ත්‍රයක විශ්වාසවන්ත කොටස්කරුවකු ලෙස අපගේ ස්ථාවරය ශක්තිමත් කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පුළුල්ව වර්ධනය වන අරමුණු හා සමගාමී වෙමින් නීති සහ ලේඛනගත අංශයේ හැකියාවන් සහ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා පසුගිය වසර පුරා අප විසින් වැදගත් පියවර කිහිපයක් ගන්නා ලදී.

නීති අංශය මඟින් ගෙන ගිය සියලු ම ක්‍රියාකාරකම් අතුරින් ඉදිරියෙන් ම තිබෙන්නේ වෛද්‍ය සහ දන්ත වෛද්‍ය වෘත්තිකයන්ට එරෙහි විනය පරීක්ෂණ ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම ය. මෙහි දී අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙළ 1990 වෛද්‍ය විනය (ක්‍රියා පටිපාටි) නියෝග මඟින් සකස් කරනු ලැබ ඇත. ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියා පිළිවෙළ පහත පරිදි වේ:-

පැමිණිල්ල

- පැමිණිල්ල කළ යුත්තේ වෘත්තිකයාට එරෙහිව චෝදනා නඟා ඇති කරුණු හෝ ගැටලු සඳහන් කර ලේඛකාධිකාරී ඇමතූ ලේඛනගත ප්‍රකාශයක් මාර්ගයෙනි.
- මෙවැනි පැමිණිල්ලක් / වාර්තාවක් මඟින් දක්වන්නේ වෘත්තීයමය යුතුකම් හා සම්බන්ධ වෘත්තීයමය විෂමාචාරයක් / නොසැලකිල්ලක් / අයෝග්‍යතාවක් නම් එම පැමිණිල්ලෙහි චෝදනා කර ඇති කරුණු සනාථ කරන දිවුරුම් ප්‍රකාශයක් මඟින් එය තහවුරු කළ යුතු ය.
- මෙම පැමිණිල්ල සභාව අභිමුඛයෙහි තැබූ විට, එහි බැලූ බැල්මට මූලික විමර්ශන කමිටුවට ඉදිරිපත් කළ යුතු කාරණයක් ඇත් දැයි සභාව විසින් තීරණය කරනු ඇත. එවැනි කාරණයක් ඇතැයි හඳුනාගතහොත් එවැනි කාරණයක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මූලික විමර්ශන කමිටුවට ඉදිරිපත් කළ යුතු ය.
- බැලූ බැල්මට පෙනෙන වරදක් නොමැති බැවින් යම් පැමිණිල්ලක් / වාර්තාවක් මූලික විමර්ශන කමිටුවට ඉදිරිපත් නොකළ යුතු යැයි තීරණය කරන ලද හොත්, එම තීරණය සම්බන්ධයෙන් පැමිණිලිකරු දැනුවත් කිරීමට ලේඛකාධිකාරී විසින් පියවර ගනු ඇත.

**මූලික විමර්ශන කමිටුව**

මූලික විමර්ශන කමිටුවට පැමිණිල්ලක් යොමු කරනු ලැබූ විට, තමන්ට එරෙහිව නඟා ඇති පැමිණිල්ල පිළිබඳව වෘත්තිකයා වෙත දැනුම් දෙනු ලැබේ. ඉදිරිපත් කර ඇති සියලු ම දිවුරුම් ප්‍රකාශවල පිටපත් ද වෘත්තිකයාට දැක ගැනීමට සැලැස්විය යුතු ය. අනතුරුව, එම පැමිණිල්ල / වාර්තාව පිළිබඳව අදාළ වෘත්තිකයාගේ නිදහසට කීමට ඇති කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීමට එම වෘත්තිකයාට අවස්ථාවක් හිමි වේ. ඉන් අනතුරුව කමිටුව විසින් අදාළ පාර්ශ්වයන් සියල්ලගේ ම සාක්ෂිවලට සවන් දී මෙම ගැටලුව විමර්ශනය කර, සිය සොයා ගැනීම් අන්තර්ගත වාර්තාවක් සකස් කර වෘත්තීය චර්යා කමිටුව වෙත යොමු කරනු ලැබේ.

**වෘත්තීය චර්යා කමිටුව**

- මූලික විමර්ශන කමිටුවේ වාර්තාව සලකා බලන වෘත්තීය චර්යා කමිටුව, පැමිණිල්ලේ හෝ වාර්තාවේ චෝදනා නඟා ඇති කරුණු හෝ ගැටලු සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්විය යුතු ද නැත් දැයි තීන්දු කරයි. විමර්ශනයක් පැවැත්විය යුතු නැතැයි තීරණය කරන ලද හොත් පැමිණිලිකරුට සහ වෘත්තිකයාට එම තීරණය පිළිබඳව දැනුම් දීමට පියවර ගනු ලැබේ.
- ගැටලුව සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්විය යුතු යැයි වෘත්තීය චර්යා කමිටුව තීරණය කළ හොත්, වෘත්තිකයාට එරෙහිව නඟා ඇති චෝදනා විශේෂයෙන් දක්වමින් විමර්ශන දැනුම් දීමක් වෘත්තිකයා වෙත පිරිනමනු ලැබේ. මෙම විමර්ශන දැනුම් දීමේ පිටපතක් පැමිණිලිකරු වෙත ද පිරිනැමිය යුතු ය.
- අනතුරුව, ගැටලුව සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වනු ලබන අතර චෝදනා නඟා ඇති කරුණු සම්බන්ධයෙන් එහි දී සාක්ෂි ඉදිරිපත් කරනු ඇත. තමාට එරෙහිව නඟා ඇති එකී චෝදනා ප්‍රතික්ෂේප කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමට වෘත්තිකයාට ද අවස්ථාවක් සැලසිය යුතු ය.
- වෘත්තීය චර්යා කමිටුවට සතුටුදායක වන මට්ටමකින් චෝදනා ඔප්පු වී ඇත් දැයි නඩු විභාගය අවසානයේ දී වෘත්තීය චර්යා කමිටුව විසින් තීන්දු කරනු ඇත. වරදකරු බවට ඔප්පු වුව හොත් එම තීන්දුව වාර්තා කරනු ලබන අතර වෘත්තීය චර්යා කමිටුවට යෝග්‍ය යැයි සිතෙන ආකාරයකට එම තීරණය නිවේදනය කරනු ලැබේ. එකී වෘත්තිකයා වරදකරු බවට ඔප්පු වුව හොත් ඔහුට දිය හැකි දඬුවම්වලට, 1927 අංක 26 දරන වෛද්‍ය ආඥා පනතේ (105 පරිච්ඡේදය) 25 වගන්තියේ සඳහන් කර ඇති පරිදි, වෘත්තිකයාගේ නම ලේඛනයෙන් ඉවත් කිරීම හෝ නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා වැඩ තහනම් කිරීම ද ඇතුළත් වේ.
- වෘත්තීය චර්යා කමිටුව විසින් මෙම තීරණය පිළිබඳව සභාව වෙත දැනුම් දෙන අතර ඉන් අනතුරුව මෙම තීරණය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස සභාව විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරීට නියම කරනු ඇත.

**මූලික විමර්ශන කමිටුවේ විමර්ශනවල 2024.12.31 දිනට සාරාංශය**

| මූලික විමර්ශන කමිටුව | | |
|---|---|---|
| 2024 වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් | 2024 වර්ෂයේ දී විභාගය ආරම්භ කළ නඩු | 2024 වර්ෂය තුළ අවසන් කළ නඩු |
| ජනවාරි 11 වන දා | PPC 525 | PPC 505 |
| පෙබරවාරි 08 වන දා | PPC 526 | PPC 510 |
| පෙබරවාරි 29 වන දා | PPC 527 | PPC 511 |
| මාර්තු 14 වන දා | PPC 528 | PPC 513 |
| මාර්තු 26 වන දා | PPC 529 | PPC 514 |
| අප්‍රේල් 18 වන දා | PPC 530 | PPC 515 |
| මැයි 9 වන දා | PPC 531 | PPC 516 |
| මැයි 30 වන දා | PPC 532 | PPC 517 |
| ජූනි 13 වන දා | PPC 533 | PPC 518 |
| ජූනි 27 වන දා | PPC 534 | PPC 519 |
| ජූලි 11 වන දා | PPC 535 | PPC 520 |
| ජූලි 25 වන දා | PPC 536 | PPC 522 |
| අගෝස්තු 8 වන දා | PPC 537 | PPC 523 |
| අගෝස්තු 22 වන දා | PPC 538 | PPC 524 |
| සැප්තැම්බර් 26 වන දා | PPC 539 | PPC 525 |
| ඔක්තෝබර් 10 වන දා | | PPC 526 |
| ඔක්තෝබර් 24 වන දා | | PPC 528 |
| නොවැම්බර් 07 වන දා | | |
| නොවැම්බර් 21 වන දා | | |
| දෙසැම්බර් 19 වන දා | | |
| **20** | **15** | **17** |

2024.12.31 දිනට නිම නොකළ නඩු - 12

**වෘත්තීය චර්යා කමිටුවේ විමර්ශනවල 2024.12.31 දිනට සාරාංශය**

| වෘත්තීය චර්යා කමිටුව | | |
|---|---|---|
| 2024 වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් | 2024 වර්ෂයේ දී විභාගය ආරම්භ කළ නඩු | 2024 වර්ෂය තුළ අවසන් කළ නඩු |
| ජනවාරි 27 වන දා | PPC 495 | PPC 495 |
| පෙබරවාරි 10 වන දා | PPC 496 | PPC 499 |
| මැයි 11 වන දා | PPC 497 | PPC 507 |
| ජූනි 15 වන දා | PPC 498 | PPC 508 |
| ජූලි 13 වන දා | PPC 500 | PPC 509 |
| සැප්තැම්බර් 28 වන දා | PPC 505 | PPC 510 |
| ඔක්තෝබර් 12 වන දා | PPC 510 | PPC 511 |
| නොවැම්බර් 30 වන දා | PPC 514 | PPC 476 |
| | PPC 517 | PPC 515 |
| | PPC 521 | PPC 516 |
| | PPC 522 | PPC 518 |
| | PPC 524 | PPC 519 |
| | PPC 525 | PPC 520 |
| | PPC 526 | PPC 523 |
| | | PPC 525 |
| | | PPC 528 |
| | | PPC 480 –2024.01.29 සිට මාස හතරක් (04) බල පැවැත්වෙන පරිදි වෘත්තිකයාගේ වැඩ තහනම් කරන ලදි. |
| **08** | **14** | **17** |

2024.12.31 දිනට නිම නොකළ නඩු - 11

**වාවස්ථාදායක කමිටුව**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සභාපතිගේ සභාපතිත්වයෙන් යුත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ව්‍යවස්ථාදායක කමිටුව, නෛතික කටයුතු හා සම්බන්ධ සියලු ම කටයුතුවල දී නීති අංශයට උපදෙස් ලබා දීමේ දී, නව රෙගුලාසි සහ මාර්ගෝපදේශ පිළියෙළ කිරීමේ දී සහ නව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පනත කෙටුම්පත් කිරීමේ දී සක්‍රිය භූමිකාවක් ඉටු කරයි

| **ව්‍යවස්ථාදායක කමිටුව - 2024** |
|---|
| **2024 වර්ෂයේ දී** |
| **පවත්වන ලද රැස්වීම්** |
| ජනවාරි 17 වන දා |
| පෙබරවාරි 14 වන දා |
| මාර්තු 14 වන දා |
| අප්‍රේල් 17 වන දා |
| මැයි 15 වන දා |
| ජූනි 12 වන දා |
| ජූලි 10 වන දා |
| අගෝස්තු 14 වන දා |
| සැප්තැම්බර් 18 වන දා |
| ඔක්තෝබර් 18 වන දා |

| | |
|---|---|
| | නොවැම්බර් 20 වන දා |
| | එකතුව - **11** |

<u>ආචාර ධර්ම කමිටුව</u>

ශ්‍රී ලංකාවේ වෛද්‍ය වෘත්තිකයන්ගේ සදාචාරාත්මක ප්‍රමිතීන් සහ වෘත්තීයමය චර්යාව අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ආචාර ධර්ම කමිටුව ස්ථාපනය කරන ලදි. රෝගී සුහසාධනයේ වටිනාකම්, ස්වාධීනත්වයට ගරු කිරීම සහ සාධාරණත්වය සමඟ වෛද්‍ය භාවිතයන් එක් තලයක පිහිටුවීම සහතික කරමින්, සෞඛ්‍යාරක්ෂණ සපයන්නන් විසින් මුහුණපාන සදාචාරාත්මක උභතෝකෝටිකයන්වල දී මෙම කමිටුව මඟින් උපදේශන සපයනු ලැබේ. ඊට අමතරව, සදාචාරාත්මක ගැටලුවල දී වෛද්‍ය අධ්‍යාපනය අඛණ්ඩව පවත්වා ගෙන යාම ප්‍රවර්ධනය කිරීමෙහි සහ ශ්‍රී ලංකාවේ වෛද්‍ය වෘත්තියෙහි අවංක භාවය ඉහළින් පවත්වා ගැනීමෙහි ලා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ආචාර ධර්ම කමිටුව භූමිකාවක් ඉටු කරයි.

ආචාර ධර්ම කමිටුවේ මංගල රැස්වීම 2024 නොවැම්බර් 20 වන දා පවත්වන ලදි. කමිටුවට පත් කරන ලද සාමාජිකයන් පහත පරිදි වේ:-

- මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක (සභාපති)
- මහාචාර්ය මනෝරි ගමගේ
- මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක
- මහාචාර්ය මුදිත විදානපතිරණ
- වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාතන්
- වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ
- වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ
- වෛද්‍ය චන්දන ධර්මරත්න
- වෛද්‍ය ජනක පුෂ්පකුමාර
- වෛද්‍ය හරිත අලුත්ගේ
- වෛද්‍ය චන්දික එපිටකඩුව

## <u>දේශසීමාන්තර ටෙලි වෛද්‍ය ක්‍රම පිළිබඳ අනුකමිටුව</u>

දේශසීමාන්තර ටෙලි වෛද්‍ය ක්‍රම පිළිබඳ අනුකමිටුවක් ස්ථාපනය කරන ලද්දේ, විවිධ රටවල් ඔස්සේ ටෙලි වෛද්‍ය ක්‍රම භාවිතයන් ක්‍රියාත්මක කිරීම, නියාමනය කිරීම සහ වැඩි දියුණු කිරීම අධීක්ෂණය කිරීමට සහ කළමනාකරණය කිරීමට ව්‍යුහගත කණ්ඩායමක් නිර්මාණය කිරීම සඳහා ය. අන්තර්ජාතික සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම, පැහැදිලි මාර්ගෝපදේශ ස්ථාපනය කිරීම සහ දේශසීමා හරහා දුරස්ථ සෞඛ්‍යාරක්ෂණ සේවාවන් කාර්යක්ෂම ලෙස සැපයීම සහතික වීම මෙම අනුකමිටුව මඟින් ඉලක්කය කොට ඇත.

දේශසීමාන්තර ටෙලි වෛද්‍ය ක්‍රම පිළිබඳ අනුකමිටුවේ මංගල රැස්වීම 2024 නොවැම්බර් 22 වන දා පවත්වන ලදි. කමිටුවට පත් කරන ලද සාමාජිකයන් පහත පරිදි වේ:-

- මහාචාර්ය ආර්.බී. මාරසිංහ (සභාපති)
- වෛද්‍ය සුරේෂ් ෂන්මුගනාතන්
- වෛද්‍ය චන්දන ධර්මරත්න
- වෛද්‍ය ජනක පුෂ්පකුමාර
- වෛද්‍ය හරිත අලුත්ගේ
- වෛද්‍ය ලාල් පනාපිටිය
- වෛද්‍ය ඩී.එස්. සමරවීර
- වෛද්‍ය බණ්ඩාර වරකාගොඩ
- වෛද්‍ය අනිල් සමරනායක
- වෛද්‍ය ගුමිදු කුලතුංග

# සීමාවාසික පුහුණු අංශය

# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

## ශ්‍රී ලංකා වෛද්‍ය සභාව
## සීමාවාසික පුහුණු අංශයේ සාරාංශ වාර්ෂික වාර්තාව - 2024

**1. සීමාවාසික පුහුණු අංශ ප්‍රධානී සාරාංශය**

අ. අංශ ප්‍රධානී (අර්ධ කාලීන පදනම යටතේ) ලෙස මහාචාර්ය ආර්.බී. මාරසිංහ සේවය කරයි. මහාචාර්ය ආර්.බී. මාරසිංහ, MBBS (කොළඹ), MPhil in Medical Education (ශ්‍රීජපුර), සහ ආචාර්ය උපාධිය (UQ-ඕස්ට්‍රේලියාව) හොබවයි.

ආ. වර්තමානයේ විශේෂඥ වෛද්‍ය සුනිල් ද අල්විස් උපදේශක (පැවරුම් පදනම) වශයෙන් සීමාවාසික පුහුණු මධ්‍යස්ථාන අගැයීම සඳහා සේවය ලබා දෙයි.
විශේෂඥ වෛද්‍ය සුනිල් ද අල්විස් MD (LVOV) USSR, MSc. (Comm Med) (කොළඹ) හොබවයි.

**2. සීමාවාසික පුහුණු අංශය පිළිබඳ දළ විශ්ලේෂණය**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ඇතුළත 645 වන සභාවේ අනුමැතිය යටතේ 2022 නොවැම්බර් මස සීමාවාසික පුහුණු අංශයක් ආරම්භ කිරීම මඟින්, සීමාවාසික වෛද්‍ය නිලධාරීන්ට - දේශීය වශයෙන් හෝ විදේශීය ආයතන ඔස්සේ හෝ සිය MBBS සහ BDS උපාධිය සම්පූර්ණ කරන ලද පුද්ගලයන්ට - ලබා දෙන පුහුණුව ප්‍රමිතිගත කිරීමෙහි ලා වැදගත් පියවරක් සනිටුහන් කරන ලදී. මෙම විශේෂිත අංශය ස්ථාපනය කරන ලද්දේ පැහැදිලි අරමුණක් සහිතව ය. එනම් සීමාවාසික පුහුණු වැඩසටහනට නව ප්‍රතිරූපයක් ලබා දී විධිමත් කිරීම සඳහා ය.

දැනට පවත්නා කාර්ය රාමුව පුළුල් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා මෙම අංශය එහි ප්‍රධානියාගේ මඟ පෙන්වීම යටතේ අභිලාෂකාමී චාරිකාවකට ගමනාරම්භ කර ඇත. මෙහි මූලික ඉලක්කය වන්නේ මතුපිට පැතිකඩ උඩුයටිකුරු කිරීම නොව පුහුණු අත්දැකීම මූලික වශයෙන් වැඩි දියුණු කිරීම ය. මෙම නවීකරණයට, දැනට පවත්නා විෂය මාලාව සියුම් ලෙස අගැයීම, දියුණු වන සෞඛ්‍යාරක්ෂණ අවශ්‍යතා හා සරිලන පරිදි එය සංශෝධනය කිරීම, වෛද්‍ය භාවිතයේ නවතම වර්ධනයන් ඇතුළත් කිරීම සහ වඩාත් පරිපූර්ණ, වෛද්‍ය හා දන්ත වෛද්‍ය වෘත්ති අපේක්ෂකයන්ට සාරවත් අධ්‍යයන පරිසරයක් සහතික වීම යන සියල්ල ඇතුළත් වේ.

මෙම පරිවර්තන මූලාරම්භය පිටුපස ඇති අභිලාෂය හුදෙක් වෙනස් කිරීමක් අවශ්‍ය බැවින් වෙනස් කිරීම නොව, සීමාවාසික පුහුණුවේ තත්ත්වය සහ ඵලදායීතාව ඉහළ නංවා ලීම තුළින් වෛද්‍ය ක්ෂේත්‍රය ඇතුළත දී එල්ල වන විවිධාකාර අභියෝගයන්ට මුහුණදීමට හැකියාව ඇති, වඩාත් කුසලතා පූර්ණ, දක්ෂ සහ සානුකම්පික සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන් බිහි කිරීම ය.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අනාගත ඉල්ලුමට මුහුණදීමට හැකි වන පරිදි වෛද්‍ය සීමාවාසික පුහුණු අවස්ථාවන් වැඩි කිරීම සඳහා ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. මේ සම්බන්ධයෙන්, පහසුකම් පිළිබඳ අගැයීමක් කොට වාර්තා කිරීමටත්, ඒ මඟින් සීමාවාසික පුහුණු මධ්‍යස්ථානවල (පුහුණු රෝහල් / අංශ) තත්ත්වය උසස් කිරීම මඟින් සීමාවාසික පුහුණුව ලබා දීම සඳහා භාවිත කළ හැකි භව්‍ය මධ්‍යස්ථානවල ලේඛනයක් සැපයීමටත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් උපදේශකවරයකු (පැවරුම් පදනම යටතේ) පත් කර ඇත.

## 3. ජයග්‍රහණයන්

| අංකය | ජයග්‍රහණය | දිනය |
|---|---|---|
| 1 | ඩිජිටල් වේදිකාවෙහි ආධාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා නව සීමාවාසික පුහුණු අගැයීම් ආකෘතිපත්‍ර සකස් කිරීම | සීමාවාසික පුහුණු කමිටුව 2024 මාර්තු 01 දින අනුමත කරන ලදි. |
| 2 | තාවකාලික ලියාපදිංචිය සම්පූර්ණ කිරීම සඳහා සීමාවාසික වෛද්‍ය නිලධාරීන්ගේ වැඩමුළු අගැයීම | 2024 අප්‍රේල් 05 |
| 3 | දන්ත වෛද්‍ය උපාධිධාරීන් සඳහා සීමාවාසික පුහුණු සැපයීම පිළිබඳ විශේෂ රැස්වීම | 2024 මැයි |
| 4 | දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ සීමාවාසික පත්වීම් ලේඛනය සහ මධ්‍යස්ථාන සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් අනුමැතිය ලබා ගැනීම | 2024 මැයි |
| 5 | වෛද්‍ය සීමාවාසික පුහුණු සඳහා සීමාවාසික ප්‍රතිඵල ප්‍රකාශය සකස් කිරීම | සීමාවාසික පුහුණු කමිටුව 2024 ජූනි 14 |
| 6 | සීමාවාසික පුහුණු අගැයීමේ ක්‍රියාවලිය සඳහා ඩිජිටල් වේදිකාවක් හඳුන්වා දීම | සීමාවාසික පුහුණු කමිටුව අනුමත කළේ 2024 ජූනි 14 |
| 7 | සීමාවාසික පුහුණු මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම සඳහා වන වැඩමුළුව (යාවත්කාලීන කරන ලද සංස්කරණය පළ කරන ලදි) | 2024 සැප්තැම්බර් 06 |
| 8 | වර්තමානයේ ශ්‍රී ලංකාවේ සීමාවාසික වෛද්‍ය නිලධාරීන් සුපරීක්ෂා කරන්නන් සඳහා සීමාවාසික පුහුණු වැඩසටහන පිළිබඳ මාර්ගගත දැනුවත් කිරීමේ වැඩමුළුව | 2024 දෙසැම්බර් 04 සහ 05 |
| 9 | සීමාවාසික පුහුණුව සඳහා මධ්‍යස්ථාන අගැයීම සඳහා විශේෂඥ වෛද්‍ය සුනිල් ද අල්විස් සීමාවාසික පුහුණු අංශයට පත් කිරීම | 2024 දෙසැම්බර් 09 |
| 10 | වෛද්‍ය මණ්ඩලයක් ස්ථාපනය කිරීම - මානසික ගැටලු පැමිණිලි පිළිබඳව කටයුතු කිරීමේ යාන්ත්‍රණයක් සහිත වෛද්‍ය සීමාවාසික පුහුණුවට අදාළ පැමිණිලි ලැබීම | 2024 දෙසැම්බර් 23 |
| 11 | සාමාන්‍ය සීමාවාසික පුහුණු කමිටු රැස්වීම් | |

## 4. සීමාවාසික පුහුණු අංශය සඳහා අනාගත සැලසුම්

I. සීමාවාසික පුහුණුව අධීක්ෂණය කිරීම සහ අගැයීම සඳහා ඩිජිටල් වේදිකාවක්
සක්‍රිය සීමාවාසික වෛද්‍ය නිලධාරීන් ලියාපදිංචි කිරීම, ස්වයං-අගැයීම සඳහා දත්ත ඇතුළත් කිරීමට ඔවුන්ට ඩිජිටල් ප්‍රවේශය ලබා දීම, ඔවුන්ගේ සුපරීක්ෂක උපදේශක විසින් අගැයීම සහ අවසානයේ ආයතන ප්‍රධානීන් සමඟ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට ඉදිරිපත් කිරීම මෙයට අන්තර්ගත වේ. සීමාවාසික පුහුණුවෙහි තත්ත්වය අධීක්ෂණය කිරීමට සහ අගැයීමටත්, ඒ මඟින් අදාළ වන පරිදි තොරතුරු මත පදනම් වූ නිර්දේශයන් ලබා දීමටත් මෙම දත්ත උපයෝගී කර ගත හැකි අතර ය.

II. නව පනතට අනුකූල වන පරිදි නව සීමාවාසික පුහුණු මාර්ගෝපදේශ ලේඛන සකස් කිරීම

## 5. අවසානය

සීමාවාසික පුහුණු අංශය ස්ථාපනය කිරීම සහ ඒ මඟින් වෛද්‍ය උපාධිධාරීන් සහ දන්ත වෛද්‍ය උපාධිධාරීන් සඳහා වන සීමාවාසික පුහුණු වැඩසටහන නවීකරණය කිරීමට දරමින් පවතින උත්සාහයන් තුළින්, අනාගත වෛද්‍ය වෘත්තිකයන්ට සහ දන්ත වෛද්‍යවරුන්ට දෙන පුහුණුවෙහි ප්‍රමිතිය නංවා ලීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ඉලක්ක කරයි. සෞඛ්‍යාරක්ෂණයේ ඇති සංකීර්ණතාවන්ට කුසලතාවයෙන් සහ සානුකම්පිකව මුහුණදීමට හැකියාව ඇති, හොඳින් සන්නද්ධ වූ වෘත්තිකයන් පෝෂණය කිරීමටත්, අවසානයේ වඩාත් සෞඛ්‍ය සම්පන්න සහ කුසලතා පූර්ණ වෛද්‍ය ශ්‍රම බලකායක් බිහි කිරීමට දායක වීමට ඇති වගකීම, නවීකරණයට දක්වන මෙම කැපවීම තුළින් මොනවට පිළිබිඹු වේ.

# FINANCE UNIT
# SRI LANKA MEDICAL COUNCIL

**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව**

**මූල්‍ය ප්‍රකාශන**

**2024 දෙසැම්බර් 31**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. MED/B/SLMC/01/2024/32

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026 අගෝස්තු 18 දින

ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

**ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 27 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන (මුදල් ප්‍රවාහ ප්‍රකාශය හැර) උපචිත පදනම මත පිළියෙළ කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු. 10,599,325 ක් වූ වියදම් අයිතම 13 ක් ආදායම් ප්‍රකාශනයේ වියදම් ලෙස හා ඒවාට අදාළ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු වියදම් ලෙසද හඳුනාගෙන නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 හි 20 ඡේදයට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීම සඳහා වෙනත් ක්‍රියාකාරකම්වලට අදාළ ආදායම් ගැළපීම් කිරීමේදී රු.173,562,645 ක්වූ පොලී ආදායම වෙනුවට රු.152,953,478 ක් ලෙස රු.20,609,167ක් අඩුවෙන් ගැළපීම් කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 හි 28 ඡේදය ප්‍රකාරව විදේශ විනිමය අනුපාත වෙනස්වීම් හේතුවෙන් ඇති වී තිබූ රු. 22,584,145ක් වූ විනිමය අලාභය, මුදල් නොවන ක්‍රියාකාරකම් ලෙස ගැළපීම් කළයුතු වුවද මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනයේදී ගැලපීම් කර නොතිබුණි.

(ඈ) පෙර වර්ෂ සඳහා ලද රු. 89,157,814 ක් වූ ආදායම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 8 හි 42 ඡේදය ප්‍රකාරව අතීතානුයෝගීව නිවැරදි නොකර සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් නමුත් තවදුරටත් භාවිතයේ පවතින පිරිවැය රු. 30,628,206 ක්වූ ගොඩනැගිලි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය හා ප්‍රමිති 08 ප්‍රකාරව ඵලදායී ජීව කාලය නැවත සමාලෝචනය කර ගිණුම්ගතකළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 79 (ආ) ඡේදය ප්‍රකාරව මෙම වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) රු.74,266,084ක වටිනාකමක් සහිත ඉඩමක් රු.73,949,175ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ස්ථාවර වත්කම් රු. 316,909 කින් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් වෛද්‍ය සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස

දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සභාවේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සභාවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන්නෙමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අදාළ වන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත | |
| i. 10 (5) වගන්තිය | විසර්ජනයන් සිදුකිරීමෙන් පසුව ඉතිරිවන ශුද්ධ අතිරික්තය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| ii. 11 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ සහ අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මිස රජයේ නීතිගත සංස්ථාවක කිසිම මුදලක් ආයෝජනය කරණු නොලැබිය යුතු වුවද, සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ස්ථාවර තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත්වල පිළිවෙලින් රු. 1,150,724,550 ක් හා රු. 314,036,489 ක් ආයෝජනය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 225 | නියමිත ආකාරයට නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් පුරවා පිළියෙල කරන ලද වවුචර සියළුම ගෙවීම් සඳහා ඉදිරිපත් කළ යුතු බව සඳහන් වුවද, සමාලෝචිත වර්ෂයේ දී මාර්ග ගත ක්‍රමයට රු. 42,849,131 ක් ගෙවීම් කර තිබුණද එම ගෙවීම්වලට අදාළ ගෙවීම් වවුචර් පත් පිළියල කර නොතිබුණි. |
| (ඇ) 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහයේ 6 පරිච්ඡේදයේ 6.6 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ වර්ෂ 01 මාස 02ක් ප්‍රමාද වී එනම් 2026 මැයි 11 දින වන අතර සභාව විසින් වාර්ෂික වාර්තා සභාව ආරම්භයේ සිට පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. තවද ඉකුත් වර්ෂයේ වාර්ෂික වාර්තාව පිළියෙල කර සභාවේ වෙබ් අඩවියේ පළකර තිබුණද මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට අදාළ විගණකාධිපති වාර්තාව ඊට ඇතුළත් කර නොතිබුණි |

2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොත

| | | |
|---|---|---|
| i. | 3 පරිච්ඡේදයේ 3.1 ඡේදය | සියලුම රාජ්‍ය ව්‍යවසායයන්, කාර්ය මණ්ඩල සහ වැටුප් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවද, සභාව එහි කාර්ය මණ්ඩල සහ වැටුප් සඳහා එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| ii. | 3 පරිච්ඡේදයේ 3.2 (i) ඡේදය | සේවක සංඛ්‍යාව, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය, වැටුප් ව්‍යුහය සහ දීමනා සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| iii. | 3 පරිච්ඡේදයේ 3.2 (v) ඡේදය | දිරිදීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය සඳහා ආයක වන නිලධාරීන් කාණ්ඩ 04 ක් වෙනුවෙන් දිරිදීමනා ලෙස 2024 වර්ෂයේදී රු.1,293,018 ක් වැයකර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 2024 දෙසැම්බර් 23 දිනැති අංක 03/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01(03) ඡේදය | සියළුම රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතන තම කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා ගෙවන්නේ නම් 2023 වර්ෂය තුළ ලාභ උපයා ඇති විට බදු පසු ලාභයෙන් අවම වශයෙන් සියයට 30 ක් හෝ ඒකාබද්ධ අරමුදලට අයබදු ලෙස ගෙවිය යුතු වුවද, සභාව ඒ අනුව කටයුතු සිදුනොකර කාර්ය මණ්ඩලය සඳහා 2024 අප්‍රේල් මාසයේදී රු.581,129 ක් හා දෙසැම්බර් මාසයේදී රු.929,050 වශයෙන් එකතුව රු.1,510,179 ක් ප්‍රසාද දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. |
| (ඉ) | ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II ඡේදය | වැටුප් හා දීමනා පිළිබඳ තීරණය කිරීමේ බලය පාලක මණ්ඩලය වෙත ලබාදී නොමැති අතර අමතර ගෙවීම් ලෙස සිදු කරනු ලබන සියලු දීමනා සඳහා මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, 2018 පෙබරවාරි 23 හා 2022 අප්‍රේල් 20 දිනැති පාලක මණ්ඩල අනුමැතිය මත පිළිවෙලින් රු.8,700 ක් හා රු.10,000 ක් වශයෙන් එකතුව රු.18,700 ක් මාසික |

දීමනාවක් ලෙස සමාලෝචිත වර්ෂයේදී සියලුම සේවකයින් හට රු.6,942,261 ක් ගෙවීම් කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) වෛද්‍ය ආඥා පනතේ 12 (1) වගන්තියේ (g) උප වගන්තිය ප්‍රකාරව සභාවේ පාලක මණ්ඩලයට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා නිල බලයෙන් තේරී පත්වුවද, සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද කිසිදු රැස්වීමකට ඔහු සහභාගී වී නොතිබුණි.

(ආ) වෛද්‍ය ආඥා පනතේ 19(c) උප වගන්තිය ප්‍රකාරව සභාවේ නිලධාරීන් සහ සේවකයන් පත්කිරීම, අත්හිටුවීම, ඉවත් කිරීම, රාජකාරි හා වේතන සම්බන්ධව රෙගුලාසි පිළියෙල කළ යුතු බව දක්වා තිබුණද 2014 පෙබරවාරි 28 දිනැති අංක 1851/31 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී පත්කිරීමට අදාළව පළකරන ලද රෙගුලාසි පමණක් විගණනය වෙත ඉදිරිපත් කරන ලදී.

(ඇ) වෛද්‍ය ආඥා පනතේ 19 (d) උප වගන්තිය ප්‍රකාරව ලැබීම් සහ වියදම් පිළිබඳ ගිණුම් තැබීම සහ එවැනි ගිණුම් විගණනය සම්බන්ධව රෙගුලාසි පිළියෙල කළ යුතු බව දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) වෛද්‍ය ආඥා පනතේ 19 (f) උප වගන්තිය ප්‍රකාරව විශ්ව විද්‍යාල සහ අනෙකුත් ආයතනවල පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතීන් පවත්වාගැනීම සම්බන්ධව රෙගුලාසි පිළියෙල කළ යුතු බව දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) වෛද්‍ය ආඥා පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව රෙජිස්ට්‍රාර්වරයා විසින් එක් එක් ලේඛනය නිවැරදිව යාවත්කාලීනව තබා ගත යුතු බවත් ලේඛනයේ නම සඳහන් අයකු මිය ගිය විට ඔහුගේ නම අදාළ නාම ලේඛනයෙන් ඉවත්කළ යුතු බවත් දක්වා තිබුණද එසේ මිය ගිය අයගේ නම් අදාළ ලේඛනවලින් ඉවත්කිරීම සඳහා හඳුනාගැනීමේ ක්‍රමවත් වැඩපිළිවෙළක් නොතිබුණි. වර්ෂ 05 කට වරක් ලියාපදිංචිය අලුත් කිරීම හේතුවෙන් මියගිය වෛද්‍යවරුන්ගේ නාමයන් යොදාගැනීම තුළින් අක්‍රමිකතා සිදුකිරීමේ හැකියාවක් පැවතියද සභාව ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

(ඊ) වෛද්‍ය ආඥා පනතේ 26 (A) (1) වගන්තිය ප්‍රකාරව මෙම ආඥාපනත යටතේ ලියාපදිංචි වී සිටින පුද්ගලයින්ට ලියාපදිංචිය අලුත් කිරීම සඳහා නියමිත වලංගු කාලයන්ද, ගාස්තුද අමාත්‍යවරයා විසින් නියම කළ හැකි වන නමුත් එම නියමිත වලංගු කාලය හා ගාස්තු දක්වමින් රෙගුලාසි නිකුත් නොකිරීම තුළ ආදායම් රැස් කිරීමේ නීත්‍යානුකූල බව ගැටලු සහගත විය. තවද විදේශීය මුදල් ඒකකයක් තුළින් ගාස්තු නියම කර තිබුණද මෙලෙස විදේශීය මුදල් ඒකකයක් තුළින් ගාස්තු නියම කිරීමට අදාළ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) වෛද්‍ය ආඥා පනතේ 70 වගන්තිය මගින් පවරනු ලබන සියලුම ගාස්තු කාලයෙන් කාලයට රෙගුලාසි මගින් වැඩිකිරීමට හෝ අඩු කිරීමට හැකියාව පවතින නමුත්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 72 (4) වගන්තිය අනුව ඕනෑම රෙගුලාසියක් පාර්ලිමේන්තුව විසින් අනුමත කර රජයේ ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්කරන තෙක් බලාත්මක නොවූවද සභාව ඒ අනුව කටයුතු සිදු නොකර ගාස්තු වැඩිකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව එලෙස නීත්‍යානුකූල ක්‍රමවේදයකින් තොරව රැස්කළ ආදායම රු. 338,381,882 ක් වී තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 3. වෙනත් කරුණු

(අ) සේවය හැරගිය රජයේ වෛද්‍ය නිලධාරින්ගෙන් රජයට අයවිය යුතු හිඟ මුදල් හා විදෙස් පුහුණුව ලද විශේෂඥ වෛද්‍ය නිලධාරින් අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් වූ 2025 සැප්තැම්බර් 29 දිනැති අංක MED/MH/SR/2023/78 දරන විශේෂ විගණන වාර්තාවට අනුව 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සේවය හැරගිය වෛද්‍ය නිලධාරින් සංඛ්‍යාව 1437 ක් වුවද එම වෛද්‍ය නිලධාරින්ගෙන් 860 ක් 2024 වර්ෂය දක්වා ලියාපදිංචිය යාවත්කාලීනව පවත්වාගෙන ගෙන ගොස් තිබුණි. තවද සේවය හැරයාමේ නිවේදන නිකුත් කරන ලද වෛද්‍ය නිලධාරින් 288 දෙනෙකුගේ ලියාපදිංචි තොරතුරු වෛද්‍ය සභාවේ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු පද්ධතියේ නොමැති බව දක්වා තිබුණු බැවින් ලියාපදිංචි අංකයක් රහිතව වෛද්‍ය නිලධාරින් සේවයේ නියුක්තව තිබුණි.

(ආ) සභාවේ සභාපතිගේ හා රෙජිස්ට්‍රාර්වරයාගේ උපදෙස් මත වෛද්‍ය සභාව හා සම්බන්ධ සියලුම සීමාවාසික කටයුතු පිළිබඳව සමස්ථ අධීක්ෂණය සඳහා සීමාවාසික ඒකකයේ ප්‍රධානි තනතුරට මාසිකව රු.100,000 ක දීමනාවක් මත කොන්ත්‍රාත් පදනමට 2023 ජනවාරි 01 වන දින සිට වර්ෂ 02ක කාලයක් සඳහා නිලධාරියෙකු බඳවාගෙන තිබියදී සීමාවාසික ඒකකයේ ප්‍රධානියා වෙත පවරන ලද කාර්යභාරයෙන් කොටසක් ඉටුකරවා ගැනීම සඳහා තවත් උපදේශකවරයෙකු බඳවාගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. 2024 ජනවාරි 10 දිනැති අංක BD/CBP/01/01/01-2024 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 12.5 ඡේදය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිසි අනුමැතියකින් තොරව අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීම හෝ නව බඳවාගැනීම් සිදු නොකළ යුතු බව සඳහන් වුවද ඒ අනුව කටයුතු සිදු නොකර කාර්ය පැවරුම් පදනමින් මාස 06 ක කාලයක් සඳහා සීමාවාසික ඒකකයේ උපදේශක තනතුරට උපදේශකයකු බඳවාගෙන තිබුණි.

ii. 2024 නොවැම්බර් 29 දිනැති වෛද්‍ය සභාවේ පාලන මණ්ඩල අනුමැතිය මත යථෝක්ත උපදේශකවරයාට 2024 දෙසැම්බර් 09 වන දින සිට දිනකට රු. 30,000 බැගින් ද, (උපරිමය මසකට දින 20 ) ක්ෂේත්‍ර චාරිකා සඳහා නවාතැන් ගාස්තු ප්‍රතිපූර්ණය රාත්‍රියකට රු.15,000 බැගින් රාත්‍රී 25 ක් වෙනුවෙන් රු.375,000 ක්ද, මාස 06 ක කාලය සඳහා උපරිම කිලෝ මීටර් 10000 ක් සඳහා උපරිම ඉන්ධන ලීටර් 1000 කට රු.311,000 ක් සහ වාහන සේවා ගාස්තු ලෙස රු.50,000 බැගින් දෙවතාවක්ද ලබාදීමට පාලක මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. උපදේශකයාගේ පත්වීම් ලිපිය අනුව මෙය මාස හයක පූර්ණ කාලීන කාර්ය පැවරුමක් වන අතර උපරිමය දින 20 ක් ලෙස දක්වා තිබුණි. එසේ වුවද 2024 දෙසැම්බර් 09 වන දින බඳවාගත්

මෙම උපදේශකවරයා දින 03 ක් පමණක් දෙසැම්බර් මාසයේදී සේවය කර තිබුණද දින 20 ක් සඳහා රු.600,000 ක් ගෙවීම් කර තිබුණි.

iii. එසේම 2024 දෙසැම්බර් මාසයේ දින 03 කදී කිලෝමීටර් 1138ක් ධාවනය කළ බව දක්වා තිබුණු අතර එම මුදල් ප්‍රතිපූර්ණය සඳහා බිල්පත් ඉදිරිපත් කර නොතිබුණ ද රු. 36,895ක් ගෙවීම් කර තිබුණි. තවද උපදේශකවරයා විසින් සංවිධානය කරනු ලබන රැස්වීම් සඳහා සහභාගී වන්නන්ට සංග්‍රහ වියදම් ලෙස එක් පුද්ගලයෙකුට රු.500 බැගින් අතිරේක ප්‍රතිලාභ අනුමත කර තිබුණි. මෙම ලබාදෙන ප්‍රතිලාභයට අදාළව උපරිම සීමාවක් සඳහන් නොවුණු අතර බාහිර ආයතනයක් වෙත ගොස් රැස්වීම් පැවැත්වීමේදී සංග්‍රහ කටයුතු අදාළ උපදේශකවරයා විසින් සිදුකිරීම ප්‍රායෝගික නොවීමද නිරීක්ෂණය විය.

iv. 2020 අගෝස්තු 28 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 06 ඡේදය අනුව රජයට අවශ්‍ය හදිසි සේවාවන් සපයාගනු පිණිස ආයතනය තුළ සුදුසු පුද්ගලයකු නොමැති බවට අමාත්‍යාංශ ලේකම් පෞද්ගලිකව සෑහීමකට පත්වන්නේ නම් බාහිර පුද්ගලයෙකුගේ සේවය ලබාගත හැකිය. එම කාර්යය දින 90 ක් නොඉක්මවන්නා වූ කෙටිකාලීන පදනමක් මත ලබාගත යුතු හදිසි සේවාවක් විය යුතු අතර එවැනි සේවාවක් සඳහා ගෙවිය හැකි උපරිම මුදල රු.150,000 ක් වේ. මෙම සීමාවන් ඉක්මවන අවස්ථාවලදී එම වෙනස්වීම් වලට හේතු වූ කරුණු පැහැදිලි කරමින් ගණන්දීමේ නිලධාරියාගේ හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශ සහිත ඉල්ලීමක් මහා භාණ්ඩාගාර අනුමැතිය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද මෙම පත් කිරීම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

එල්.එස්.අයි. ජයරත්න
විගණකාධිපති

**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**
**2024 දෙසැම්බර් 31 දිනට**

| **වත්කම්** | සටහන | **2024 (රු.)** | **2023 (රු.)** |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 4 | 97,122,847 | 93,436,746 |
| අස්පෘශ්‍ය වත්කම් | 5 | 13,365,103 | 17,929,431 |
| WFME පිළිගැනීම | 5, 8 | 28,321,706 | 31,743,246 |
| ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ ඇති මූල්‍ය වත්කම් | 6 | 66,707,990 | 1,124,820,856 |
| කාර්ය මණ්ඩල ණය | 7.1 | 1,526,954 | — |
| විලම්භිත බදු වත්කම් | 9.2 | 3,634,249 | 925,016 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **210,678,848** | **1,268,855,296** |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| අයවිය යුතු රැඳවුම් බදු | | 145,163 | 3,198,031 |
| කාර්ය මණ්ඩල ණය | 7.1 | 833,250 | 1,832,825 |
| ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ ඇති මූල්‍ය වත්කම් | 6 | 1,398,053,049 | 181,162,390 |
| අත්තිකාරම්, පෙරගෙවුම් සහ ආපසු ගෙවන ඇප තැන්පතු | 8 | 2,767,505 | 4,001,424 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 13 | 77,142,949 | 71,271,938 |
| **මුළු ජංගම වත්කම්** | | **1,478,941,916** | **261,466,609** |
| **මුළු වත්කම්** | | **1,689,620,765** | **1,530,321,904** |
| | | | |
| **අරමුදල් සහ වගකීම්** | | | |
| **සංචිත අරමුදල සහ සංචිත** | | | |
| වර්ෂය ආරම්භයේදී ශේෂය | | 1,330,560,815 | 1,130,298,164 |
| සමුච්චිත අරමුදල | | - | |
| වෙනත් විස්තීරණ ආදායම් සංචිතය | | (756,638) | |
| වියදමට වඩා වැඩි ආදායම් අතිරික්තය | | 236,094,453 | 200,262,651 |
| **මුළු සංචිත අරමුදල සහ සංචිත** | | **1,565,898,630** | **1,330,560,815** |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන් | 10 | 14,575,212 | 12,086,368 |
| විලම්භිත ආදායම් | 11.2 | 36,353,738 | 59,252,751 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **50,928,949** | **71,339,119** |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| විලම්භිත ආදායම් | 11.3 | 14,780,456 | 30,224,172 |
| ගෙවිය යුතු ආදායම් බදු | 9.1 | 55,497,435 | 32,640,590 |
| ගෙවිය යුතු දෑ සහ රඳවා ගැනීම් | 11.1 | 1,093,288 | 51,908,375 |
| උපචිත වියදම් | 11.4 | 1,422,006 | 13,648,835 |
| **මුළු ජංගම වගකීම්** | | **72,793,185** | **128,421,971** |
| | | | |
| **මුළු අරමුදල් සහ වගකීම්** | | **1,689,620,765** | **1,530,321,904** |

05 සිට 40 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

අත්. අපැහැදිලියි.
කේ. වඩුගේ මහතා
මූල්‍ය ප්‍රධානී

අත්. අපැහැදිලියි.
වෛද්‍ය එච්.ඩී.බී. හේරත්
ලේඛකාධිකාරී

**වෛද්‍ය එච්.ඩී.බී. හේරත්**
**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව**

මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා පාලක මණ්ඩලය වගකීම දරනු ලබයි. සභාව වෙනුවෙන් අත්සන් තබන ලද්දේ:

අත්. අපැහැදිලියි.
මහාචාර්ය ජයන්ත ජයවර්ධන
සභාපති

**මහාචාර්ය ජයන්ත ජයවර්ධන**
**MBBS, FRCOG, FSLCOG**
**සභාපති**
**ශ්‍රී ලංකා වෛද්‍ය සභාව**

අත්. අපැහැදිලියි.
වෛද්‍ය ඊ.ජී.ඩී.සී. එපිටකඩුව
උප සභාපති

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

| | සටහන | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | **3** | 338,381,882 | 231,618,081 |
| මෙහෙයුම් වියදම් | **18** | (51,641,606) | (38,140,372) |
| **මෙහෙයුම් ආදායම** | | **286,740,276** | **193,477,709** |
| **වෙනත් ආදායම්** | **12** | 105,057 | 1,171,986 |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | | **286,845,333** | **194,649,695** |
| පරිපාලන වියදම් | **19** | (113,132,289) | (101,212,388) |
| මූල්‍ය සහ අනෙකුත් වියදම් | **20** | (26,738,526) | (36,218,271) |
| **පොලී සහ බදු වලට පෙර වර්ෂය සඳහා වියදමට වඩා වැඩි ආදායම** | | **146,974,518** | **57,219,036** |
| මූල්‍ය ආදායම | **17.1** | 173,562,645 | 220,180,698 |
| මූල්‍ය පිරිවැය | **17.2** | (61,528) | (52,242) |
| **බදු වලට පෙර වර්ෂය සඳහා වියදමට වඩා වැඩි ආදායම** | | **320,475,635** | **277,347,492** |
| ආදායම් බදු වියදම | **9** | (84,381,181) | (77,084,841) |
| බදු වලට පසු වියදමට වඩා ආදායමේ අතිරික්තය | | **236,094,453** | **200,262,651** |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | | | |
| **පසුකාලීනව ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකරන අයිතම** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මත ආයුගණක (අලාභය)/ලාභය | **10.1** | (756,638) | - |
| **බදු වලට පසු වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | **235,337,815** | **200,262,651** |

05 සිට 40 දක්වා පිටුවල ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

## අරමුදල් සහ සංචිතවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය
**2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වර්ෂය

| | **සමුච්චිත අරමුදල** රු. | OCI **සංචිතය** රු. | **එකතුව** රු. |
|---|---|---|---|
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | 1,130,298,164 | - | 1,130,298,164 |
| බදු ගෙවීමෙන් පසු වියදම් ඉක්මවා ආදායමේ අතිරික්තය | 200,262,651 | - | 200,262,651 |
| නිර්වචනය කරන ලද ප්‍රතිලාභ බැඳීම මත ආයුකාල අලාභය | - | - | - |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,330,560,815** | **-** | **1,330,560,815** |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | 1,330,560,815 | - | 1,330,560,815 |
| බදු ගෙවීමෙන් පසු වියදම් ඉක්මවා ආදායමේ අතිරික්තය | 236,094,453 | | 236,094,453 |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මත ආයුගණක (අලාභය) /ලාභය | - | (756,638) | (756,638) |
| **2024** දෙසැම්බර් **31** දිනට ශේෂය | **1,566,655,268** | **(756,638)** | **1,565,898,630** |

පිටු 05 සිට 40 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය
## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

| | සටහන | 2024 | 2023 |
|---|---|---|---|
| | | රු | රු |
| **බදුකරණයට පෙර වියදමට වඩා වැඩි ආදායම** | | | |
| ගැලපීම් | | | |
| ක්ෂයවීම් | **4.2** | 9,535,439 | 6,103,712 |
| අස්පෘශ්‍ය වත්කම් ක්ෂය කිරීම | **5.2** | 4,564,328 | 1,055,527 |
| WFME ක්ෂය කිරීම | **5.8** | 3,421,540 | 2,584,955 |
| පොළී ආදායම | **17.1** | (152,953,478) | (197,918,781) |
| වසර සඳහා පොළිය - පාරිතෝෂිකය | **10.1** | 1,080,395 | - |
| පාරිතෝෂිත ප්‍රතිපාදන | **10.1** | 1,293,018 | 986,042 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය / (හිඟය)** | | **187,416,878** | **90,158,946** |
| ලැබිය යුතු රඳවා ගැනීමේ බදු අඩුවීම/ (වැඩි වීම) | | 3,052,868 | (198,714) |
| අත්තිකාරම් සහ පෙරගෙවුම් අඩුවීම/ (වැඩි වීම) | | 1,233,919 | 33,284,428 |
| ලැබිය යුතු දේ අඩුවීම/ (වැඩි වීම) | | (527,379) | (265,357) |
| සාමාජිකයින්ගෙන් සහ අනෙකුත් අයගෙන් අත්තිකාරම් වැඩි වීම/ (අඩු වීම) | | (50,815,086) | 39,274,873 |
| උපචිත වියදම් වැඩි වීම/ (අඩු වීම) | | (12,226,829) | 6,656,795 |
| විලම්භිත ආදායම වැඩි වීම/ (අඩු වීම) | | (38,342,728) | (26,703,101) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය කරන ලද/ (භාවිතා කරන ලද) මුදල්** | | **89,791,643** | **142,207,870** |
| ගෙවන ලද ආදායම් බදු | **9.1** | (64,233,570) | (88,661,731) |
| ගෙවන ලද පාරිතෝෂික | **10** | (641,208) | (389,769) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් / (භාවිතා කරන ලද) ශුද්ධ මුදල්** | | **24,916,865** | **53,156,370** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින්/(භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහ** | | | |
| පොළී ආදායම | **17.1** | 152,953,478 | 197,918,781 |
| ස්ථාවර තැන්පතු වල ශුද්ධ චලනය | **6.1** | (307,582,258) | (120,553,831) |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වල ශුද්ධ චලනය | **6.2** | 148,804,466 | (67,267,881) |
| ප්‍රතීතනය - WFME පිළිගැනීම | **5.8** | - | (34,328,201) |
| දේපල පිරියත සහ උපකරණ මිලදී ගැනීම | **4.1** | (13,221,540) | (2,205,225) |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම | **5.1** | - | (17,936,248) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින්/(භාවිතා කරන ලද) ශුද්ධ මුදල්** | | **(19,045,855)** | **(44,372,605)** |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | 5,871,011 | 8,783,766 |
| **වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ** | **13** | 71,271,938 | 62,488,172 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ** | **13** | **77,142,949** | **71,271,938** |

05 සිට 40 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

## 1. ආයතනික තොරතුරු

### 1.1. සාමාන්‍ය

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ("සභාව") 1927 අංක 26 දරන වෛද්‍ය ආඥාපනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ලියාපදිංචි කර ඇත. සභාවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 10, නොරිස් කැනල් පාර, අංක 31 දරන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වෛද්‍ය සභාවේ ලියාපදිංචි සෞඛ්‍ය වෘත්තිකයන්ගේ අධ්‍යයන හා වෘත්තීය ප්‍රමිතීන්, විනය සහ ආචාර ධර්ම පිළිවෙත් පවත්වාගෙන යාම සහතික කිරීම මඟින් සෞඛ්‍ය සේවා අපේක්ෂා කරන්නන් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව සභාව පිහිටුවා ඇත.

### 1.3. බැංකු ලැයිස්තුව

- ලංකා බැංකුව
- මහජන බැංකුව
- ජාතික ඉතිරිකිරීමේ බැංකුව
- හැටන් නැෂනල් බැංකුව

### 1.4. විගණකවරුන්

ජාතික විගණන කාර්යාලය

## 2. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

### 2.1. පිළියෙල කිරීමේ පදනම

### 2.1.1 අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව පිළියෙල කර ඇත.

### 2.1.2 මූල්‍ය ප්‍රකාශනවල සංරචක

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, අරමුදල් සහ සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් වලින් සමන්විත වේ.

### 2.1.3 මූල්‍ය කාලපරිච්ඡේදය

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මූල්‍ය කාලපරිච්ඡේදය 2024 ජනවාරි 01 වන දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වන මාස දොළහක කාලපරිච්ඡේදයක් නියෝජනය කරයි.

### 2.1.4 මිනුම් පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් සුදුසු අනාවරණයන් සිදු කරන අවස්ථාවන්හි දී හැර, උපචිත පදනම සහ ඓතිහාසික පිරිවැය සම්මුතිය මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

### 2.1.5 සංසන්දනාත්මක තොරතුරු

වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සහ සංසන්දනාත්මක බව ඉහළ නැංවීම සඳහා, මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියලුම මුදල් ප්‍රමාණයන් සම්බන්ධයෙන් පසුගිය කාලපරිච්ඡේදයට අදාළ ප්‍රමාණාත්මක, ආඛ්‍යානමය සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කර ඇත. වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය සෑම අවස්ථාවකදීම පූර්ව වර්ෂයේ ඇතැම් සංඛ්‍යාලේඛන සහ ප්‍රකාශන නැවත සකස් කර ඇත.

### 2.1.6 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරය තුළ, ආයතනයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කෙරේ.

### 2.1.7 වටයෑම

වෙනත් ආකාරයකින් දක්වා ඇති විට හැර, ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට (රු.) වටයා ඇත.

### 2.1.8 හිලව් කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS සහ LKAS) මඟින් අවශ්‍ය නම් හෝ අවසර දී නොමැති නම්, වත්කම් සහ වගකීම් හෝ ආදායම් සහ වියදම් එකිනෙකට හිලව් කිරීම සිදු කර නොමැත.

### 2.1.9 ප්‍රමාණාත්මක වැදගත්කම සහ සමූහගත කිරීම

මූල්‍ය ප්‍රකාශනවල සමාන අයිතමවල සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයක් හෝ කාර්යභාරයක් සහිත අයිතමයන්, ප්‍රමාණාත්මක නොවන ඒවා හැර, වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

## 2.1.10 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම සහ අනුමැතිය

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වන ඔවුන්ගේ වගකීම පිළිගනු ලබයි. 2024/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන, 2026 අප්‍රේල් 24 වැනි දින පැවැත්වුණු රැස්වීමේදී සභාව විසින් අනුමත කර නිකුත් කිරීම සඳහා බලය පවරන ලදී.

## 2.1.11 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

ගිණුම්කරණ ඇස්තමේන්තු යනු මැනීමේ අවිනිශ්චිතතාවයට යටත් වන, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මුදල් ප්‍රමාණයන් වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා, ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමට මෙන්ම වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ලෙස වාර්තා කර ඇති මුදල් ප්‍රමාණයන්ට බලපෑම් ඇති කරන තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම කළමනාකාරිත්වය වෙතින් අපේක්ෂා කෙරේ. සත්‍ය ප්‍රතිඵල, මෙලෙස භාවිත කරන ලද ඇස්තමේන්තු සහ තීරණවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ ඒවාට පාදක වන උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල සංශෝධන හඳුනාගනු ලබනුයේ එම ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබන කාලපරිච්ඡේදය තුළදීය. එනම්, එම සංශෝධනය එම කාලපරිච්ඡේදයට පමණක් බලපාන්නේ නම් සංශෝධනය සිදු කරන කාලපරිච්ඡේදය තුළදීත්, එම සංශෝධනය වත්මන් මෙන්ම අනාගත කාලපරිච්ඡේද යන දෙකටම බලපාන්නේ නම් සංශෝධනය සිදු කරන කාලපරිච්ඡේදය සහ අනාගත කාලපරිච්ඡේද තුළදීත් එය ගිණුම්ගත කරනු ලබයි. ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමේදී මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති මුදල් ප්‍රමාණයන්ට වඩාත්ම සැලකිය යුතු බලපෑමක් ඇති කරන වැදගත් ඇස්තමේන්තුගත ක්ෂේත්‍ර, අවිනිශ්චිතතාවයන් සහ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

### 2.1.11.අ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

සේවකයන්ගේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම සඳහා වන පිරිවැය තීරණය කරනු ලබන්නේ ප්‍රක්ෂේපිත ඒකක ණය (Projected Unit Credit - PUC) ක්‍රමවේදය භාවිත කිරීමෙනි. මෙම ක්‍රමවේදයේදී වට්ටම් අනුපාතිකය සහ අනාගත වැටුප් වර්ධක අනුපාතිකය වැනි කරුණු සම්බන්ධ උපකල්පනයන් උපයෝගී කර ගැනීම සිදු වේ. මෙම සැලසුම දිගුකාලීන ස්වභාවයකින් යුක්ත වීම හේතුවෙන්, එවැනි ඇස්තමේන්තුගත කිරීම් සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ.

### 2.1.11.ආ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණවල වෙනස්වීම්

ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණාත්මක විනිශ්චයන්හි සිදුවන යම් වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් යටතේ අනාවරණය කරනු ලැබේ.

## 2.1.12 අඛණ්ඩ පැවැත්ම

සභාවට සිය මෙහෙයුම් කටයුතු අපේක්ෂිත අනාගතය තුළ අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකිවනු ඇතැයි යන උපකල්පනය මත සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. එපමණක් නොව, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්මේ හැකියාව කෙරෙහි සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු සිදුවීමකට හෝ තත්ත්වයකට අදාළ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව සභාව දැනුවත් වී නොමැත. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පවත්වාගෙන යාමේ පදනම මත අඛණ්ඩව සකස් කරනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

වාර්තාගත මුදල් ප්‍රමාණයන් කෙරෙහි බලපෑමක් ඇති කරන සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මූල්‍ය ප්‍රකාශනවල වැදගත් ගැලපීමක් සිදු වීමට සැලකිය යුතු අවදානමක් පවතින විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තුගත අවිනිශ්චිතතාවයන් පිළිබඳ තොරතුරු පහත සඳහන් සටහන්වලට ඇතුළත් වේ:

අ) දේපළ, පිරියත සහ උපකරණවල (PPE) ඵලදායී කාලසීමාවන් ඇස්තමේන්තු කිරීම
ආ) ආදායම් බදු (ජංගම බදු සහ විලම්භිත බදු)
ඇ) නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවන් මැනීම
ඈ) ප්‍රතිපාදන සහ හදිසි අවස්ථා හඳුනාගැනීම සහ මැනීම: සම්පත් බාහිරට ගලායෑමක ඇති සම්භාවිතාව සහ එහි විශාලත්වය පිළිබඳ මූලික උපකල්පනය

**2.1.13 ජංගම වත්කම්වලට එදිරිව ජංගම නොවන වත්කම් වර්ගීකරණය**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වත්කම් සහ වගකීම් ඉදිරිපත් කරනු ලබන්නේ ජංගම/ජංගම නොවන වර්ගීකරණය මත පදනම්වය.

වත්කමක් ජංගම වත්කමක් ලෙස වර්ගීකරණය කරනු ලබනුයේ එය:

අ) සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී මුදල් බවට පත් කර ගැනීමට අපේක්ෂා කරන, හෝ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අදහස් කරන අවස්ථාවකදී;

ආ) ප්‍රධාන වශයෙන් වෙළඳාම් කිරීමේ අරමුණ සඳහාම තබා ගෙන ඇති අවස්ථාවකදී;

ඇ) වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු මාස දොළහක් ඇතුළත මුදල් බවට පත් කර ගැනීමට අපේක්ෂා කරන අවස්ථාවකදී; හෝ

ඈ) වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු අවම වශයෙන් මාස දොළහක් යනතුරු, වගකීමක් පියවීම සඳහා භාවිත කිරීමට හෝ හුවමාරු කිරීමට සීමාවන් පනවා නොමැති මුදල් හෝ මුදල් හා සමාන දෑ ය.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අනෙකුත් සියලුම වත්කම් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබයි.

**2.1.14 ජංගම වගකීම්වලට එදිරිව ජංගම නොවන වගකීම් වර්ගීකරණය**

වගකීමක් ජංගම වගකීමක් ලෙස වර්ග කරනු ලබන්නේ, එය:

අ) සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ පියවීමට අපේක්ෂා කරන්නේ නම්;
ආ) ප්‍රධාන වශයෙන්ම වෙළඳාම් කිරීමේ අරමුණ සඳහාම රඳවා තබාගෙන තිබෙන්නේ නම්;
ඇ) වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව එළඹෙන මාස දොළහක් ඇතුළත පියවීමට නියමිතව තිබෙන්නේ නම්; හෝ
ඈ) වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව අවම වශයෙන් මාස දොළහක් යනතුරු එම වගකීම පියවීම කල් දැමීම සඳහා කොන්දේසි විරහිත අයිතියක් නොමැති නම් වේ.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අනෙකුත් සියලුම වගකීම් ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලබයි. විලම්භිත බදු වගකීම් පවතින්නේ නම්, ඒවා ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

### 2.1.15 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය, 'මුදල් ප්‍රවාහ ප්‍රකාශන' පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - LKAS 7 ට අනුකූලව 'වක්‍ර ක්‍රමය' භාවිතයෙන් පිළියෙල කර ඇත. මුදල් සහ මුදල් හා සමාන දෑ සඳහා අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ දන්නා මුදල් ප්‍රමාණයක් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි, එමෙන්ම ඒවායේ අගය වෙනස් වීමේ නොසැලකිය යුතු අවදානමකට යටත් වන කෙටි කාලීන ආයෝජන ඇතුළත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා, ලැබුණු පොලිය ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබුණු මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කර ඇති අතර ගෙවන ලද පොලිය මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වර්ගීකරණය කර ඇත.

ඉල්ලුම් කළ සැනින් ආපසු ගෙවිය යුතු සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මුදල් කළමනාකරණයේ අනිවාර්ය කොටසක් වන බැංකු අයිරා සහ කෙටි කාලීන ණය ගැනීම් පවතින්නේ නම්, ඒවා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ හි සංරචකයක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

## 2.2. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

පූර්ව වර්ෂයේදී භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සභාව විසින් මෙම වර්ෂයේදී ද අනුකූලව සහ අඛණ්ඩව අදාළ කර ගෙන ඇත.

## 2.3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ කර ගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, මෙම ප්‍රතිපත්ති ඉදිරිපත් කර ඇති සියලුම වර්ෂයන් සඳහා අනුකූලව සහ අඛණ්ඩව අදාළ කර ගෙන ඇත.

### 2.3.1 වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම්

#### 2.3.1.1. දේපළ, පිරියත සහ උපකරණ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් සේවාවන් සැපයීම සඳහා හෝ පරිපාලනමය අරමුණු සඳහා තබාගෙන සිටින සහ වසරකට වැඩි කාලයක් භාවිත කිරීමට අපේක්ෂා කරන, තමන් සතු වත්කම් ගිණුම්ගත කිරීමේදී ‘දේපළ, පිරියත සහ උපකරණ’ පිළිබඳ LKAS 16 හි අවශ්‍යතාවයන් අදාළ කර ගනු ලබයි.

#### 2.3.1.1. (අ) හඳුනා ගැනීම සහ මැනීම

වත්කම හා අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෙත ගලා ඒමට සම්භාවිතාවක් පවතින්නේ නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැක්කේ නම් පමණක් දේපළ, පිරියත සහ උපකරණ වත්කම් ලෙස හඳුනා ගනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

සියලුම දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් ආරම්භයේදී පිරිවැය මත වාර්තා කරනු ලබන අතර, පසුව සමුච්චිත ක්ෂයවීම් සහ කිසියම් හානිදායක අලාභයන් අඩු කළ පිරිවැය මත මනිනු ලැබේ. අලුත්වැඩියා සහ නඩත්තු පිරිවැය, ඒවා දරනු ලබන අවස්ථාවේදීම විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව දේපළ, පිරියත සහ උපකරණ සඳහා පිරිවැය ආකෘතිය අදාළ කර ගන්නා අතර, මිලදී ගැනීමේ හෝ ඉදිකිරීම් පිරිවැය සමඟ ඊට අදාළ ඕනෑම අනුෂංගික වියදම් ද ඇතුළත් කර, ඉන් සමුච්චිත ක්ෂයවීම් සහ කිසියම් සමුච්චිත හානිදායක අලාභයන් අඩු කර වාර්තා කරනු ලබයි. සිදුවීම් හෝ තත්ත්වයන්ගේ වෙනස්වීම් මඟින් දරන අගය නැවත අය කර ගත නොහැකි බව පෙන්නුම් කරන අවස්ථාවන්හිදී, දේපළ, පිරියත සහ උපකරණවල දරන අගයන් හානියට පත්ව ඇත්දැයි සමාලෝචනය කරනු ලැබේ.

### 2.3.1.1. (ආ) සින්නක්කර වත්කම්

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක පිරිවැය, එහි මිලදී ගැනීමේ මිල සහ එම වත්කම අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම සඳහා ඍජුවම අදාළ කර ගත හැකි ඕනෑම පිරිවැයකින් සමන්විත වේ. ස්වයං-ඉදිකරන ලද වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යමය පිරිවැය, ඍජු ශ්‍රම පිරිවැය සහ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම සඳහා ඍජුවම අදාළ කර ගත හැකි වෙනත් ඕනෑම පිරිවැයක් ඇතුළත් වේ. මීට අමතරව, එම අයිතමයන් ගලවා ඉවත් කිරීමේ සහ ඒවා පිහිටුවා තිබූ ස්ථානය යථා තත්ත්වයට පත් කිරීමේ පිරිවැය මෙන්ම සුදුසුකම් ලබන වත්කම් සඳහා වන ණය පිරිවැය ද මෙයට ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක විවිධ කොටස් සඳහා වෙනස් ඵලදායී ආයු කාලයන් පවතින විට, ඒවා දේපළ, පිරියත සහ උපකරණවල වෙනම අයිතමයන් (ප්‍රධාන සංරචක) ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

තෙවන පාර්ශ්වයන්ගෙන් පවරා දෙනු ලබන දේපළ, පිරියත සහ උපකරණ, ඒවායේ පාලනය ලබා ගන්නා දිනයේ පවතින සාධාරණ අගය මත ආරම්භයේදී මනිනු ලැබේ. අදාළ උපකරණවල ක්‍රියාකාරිත්වය සමඟ ඒකාබද්ධ කර ඇති මිලදී ගත් මෘදුකාංග, එම උපකරණවලම කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

### 2.3.1.1. (ඇ) කල්බදු වත්කම්

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෙත අයිතිය සතු සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පැවරෙන බදුදීම්, මූල්‍ය බදු ලෙස වර්ගීකරණය කෙරේ. මූලික හඳුනාගැනීමෙන් පසු, කල්බදු වත්කම එහි සාධාරණ අගය හෝ අවම බදු ගෙවීම්වල වත්මන් වටිනාකම යන දෙකෙන් අඩු අගයට සමාන මුදලකින් මනිනු ලබන අතර ප්‍රාග්ධනීකරණය කරනු ලබයි. මූලික හඳුනා ගැනීමෙන් පසුව, එම වත්කම ඊට අදාළ වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව ගිණුම්ගත කරනු ලැබේ. මෙම මූල්‍ය කාලපරිච්ඡේදය අවසානයේදී ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සතුව කිසිදු කල්බදු වත්කමක් නොතිබුණි.

### 2.3.1.1. (ඇ) පසුකාලීන පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෙත ගලා ඒමට සම්භාවිතාවක් පවතින්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැක්කේ නම්, එම අයිතමයේ ධාරණ අගය තුළ හඳුනා ගනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසේ ධාරණ අගය හඳුනා ගැනීමෙන් ඉවත් කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා සැපයීමේ පිරිවැය, ඒවා දරනු ලබන විට විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

### 2.3.1.1.(ඉ) හඳුනා ගැනීමෙන් ඉවත් කිරීම

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමකදී හෝ ඒවා භාවිතයෙන් තවදුරටත් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීමෙන් ඉවත් කරනු ලැබේ. වත්කම හඳුනා ගැනීමෙන් ඉවත් කිරීමේදී පැන නගින යම් ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ බැහැර කිරීමේ ප්‍රතිලාභ සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරනු ලබන), එම වත්කම හඳුනා ගැනීමෙන් ඉවත් කරන වර්ෂයේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

### 2.3.1.1.(ඊ) ක්ෂයවීම්

ක්ෂයවීම්, දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක එක් එක් කොටසෙහි ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය පුරාවට සරල රේඛීය පදනම මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ. බදු කාලසීමාව අවසානයේදී ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අයිතිය ලබා ගන්නා බවට සාධාරණ ලෙස නිශ්චිතව පවතින්නේ නම් මිස, බදුගත් වත්කම්, බදු කාලසීමාව සහ ඒවායේ ඵලදායී ආයු කාලය යන දෙකෙන් කෙටි කාලසීමාව පුරාවට ක්ෂය කරනු ලැබේ. වත්කමක් භාවිතය සඳහා පවතින විට එහි ක්ෂයවීම් ආරම්භ වන අතර, වත්කම විකිණීම සඳහා තබා ඇති වත්කමක් ලෙස වර්ගීකරණය කරන දිනය හෝ වත්කම හඳුනා ගැනීමෙන් ඉවත් කරන දිනය යන දෙකෙන් වඩාත් කලින් එළඹෙන දිනයේදී වත්කමක ක්ෂයවීම් නතර කරනු ලැබේ.

සින්නක්කර ඉඩම් සහ සිදුවෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු සඳහා ක්ෂයවීම් අය නොකෙරේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ:

| **වත්කම් කාණ්ඩය** | **ප්‍රයෝජනවත් ආයු කාලය (වසර)** |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | වසර 4 |
| කාර්යාල උපකරණ | වසර 4 |
| වෛනත් උපකරණ | වසර 4 |
| දුරකථන පද්ධතිය | වසර 4 |
| පරිගණක | වසර 4 |
| සමානුකාරක සහ විභාග පුහුණුකාරක (Simulators and Examination Trainer) | වසර 4 |
| මෝටර් රථ | වසර 5 |

ව්‍යාපාරික සැලසුම් සහ උපාය මාර්ග, අපේක්ෂිත භාවිත මට්ටම සහ අනාගත වර්ධනයන් වැනි සාධක මත පදනම්ව, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලයන් වාර්ෂිකව සමාලෝචනය කරනු ලබයි. සඳහන් කරන ලද සාධකවල සිදුවන වෙනස්වීම් හේතුවෙන් මෙම ඇස්තමේන්තුවල ඇතිවන වෙනස්වීම් මඟින්, අනාගත මෙහෙයුම් ප්‍රතිඵල සැලකිය යුතු ලෙස බලපෑමට ලක්විය හැකිය. දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය අඩු වීමක් මඟින්, වාර්තාගත ක්ෂයවීම් ගාස්තුව වැඩි වන අතර දේපළ, පිරියත සහ උපකරණ ශේෂය අඩු වේ.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

වත්කමක අවශේෂ වටිනාකම හෝ ඵලදායී ආයු කාලය වෙනස් වී ඇති බවට සලකුණු පවතින විට, වත්කම්වල ක්ෂය කිරීමේ ක්‍රමය සහ අවශේෂ වටිනාකම් සමාලෝචනය කරනු ලැබේ. වත්මන් අපේක්ෂාවන්හි සැලකිය යුතු වෙනසක් සිදුවී ඇත්නම්, එම වෙනස්වීම් පිළිබිඹු කිරීම සඳහා අවශේෂ වටිනාකම, ක්ෂය කිරීමේ ක්‍රමය හෝ ඵලදායී ආයු කාලය සංශෝධනය කරනු ලැබේ.

### 2.3.1.1.(උ) කෙරෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු - දේපළ, පිරියත සහ උපකරණ

වාර්තාකරණ දිනය වන විට අවසන් කර නොමැති, වර්ෂය තුළ දරන ලද ප්‍රාග්ධන වියදම්, කෙරෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු ලෙස පෙන්වනු ලබන අතර, වර්ෂය තුළ අවසන් කර භාවිතය සඳහා පවතින ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත සහ උපකරණ වෙත පවරා ඇත. එනම්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක වීමට හැකි වීම සඳහා අවශ්‍ය ස්ථානයේ සහ කොන්දේසි යටතේ එය පවතින විටය.

### 2.3.1.2. අස්පෘශ්‍ය වත්කම්

වෙන් වෙන්ව අත්පත් කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම්, ආරම්භක මූලික හඳුනාගැනීමේදී පිරිවැය මත මනිනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි අලාභයන් අඩු කළ පිරිවැයට ගෙන යනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ආයු කාලය සීමිත ලෙස තක්සේරු කරනු ලබයි. සීමිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්, ඵලදායී ආර්ථික ආයු කාලය පුරාවට ක්‍රමක්ෂය කරනු ලබන අතර, අස්පෘශ්‍ය වත්කම හානියට පත්ව තිබිය හැකි බවට ඇඟවීමක් පවතින සෑම අවස්ථාවකදීම හානියක් පවතින්නේදැයි තක්සේරු කරනු ලැබේ. සීමිත ඵලදායී ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහා වන ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමය, අවම වශයෙන් එක් එක් මූල්‍ය වර්ෂ අවසානයේදීම සමාලෝචනය කරනු ලැබේ. වත්කම තුළ ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාවෙහි හෝ අපේක්ෂිත ඵලදායී ආයු කාලයෙහි සිදුවන වෙනස්වීම්, සුදුසු පරිදි ක්‍රමක්ෂය කාලසීමාව හෝ ක්‍රමක්ෂය ක්‍රමය වෙනස් කිරීම මඟින් ගිණුම්ගත කරනු ලබන අතර, ඒවා ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙස සලකනු ලැබේ. සීමිත ආයු කාලයන් සහිත අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය වියදම, අස්පෘශ්‍ය වත්කම්වල කාර්යභාරයට අනුකූල වන වියදම් ප්‍රවර්ගය යටතේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

### 2.3.1.2. (අ) පරිගණක මෘදුකාංග

අත්පත් කර ගන්නා ලද පරිගණක මෘදුකාංග බලපත්‍ර, ඒවා අත්පත් කර ගැනීමට සහ භාවිතය සඳහා සූදානම් කිරීමට දරන ලද පිරිවැය පදනම් කර ගනිමින් ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. මෙම පිරිවැය, ඒවායේ වසර හතරක් වූ ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. පරිගණක මෘදුකාංග වැඩසටහන් නඩත්තු කිරීමට අදාළ පිරිවැය, ඒවා දරනු ලබන විට වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගනු ලබන පිරිවැය, ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලයන් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. මෘදුකාංග සංවර්ධනයට අදාළ පිරිවැය, මෘදුකාංගය භාවිතය සඳහා සූදානම් වන තෙක් කෙරෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු ලෙස ගෙන යනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

### 2.3.1.3. වෛද්‍ය අධ්‍යාපනය සඳහා වූ ලෝක සම්මේලනයේ (WFME) පිළිගැනීම

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ප්‍රතීතන ඒකකය විසින් 2023 වර්ෂයේදී රු. 34,328,201.37 ක් වියදම් කරමින් කීර්තිමත් වෛද්‍ය අධ්‍යාපනය සඳහා වූ ලෝක සම්මේලනයේ (WFME) පිළිගැනීමේ තත්ත්වය අත්පත් කර ගන්නා ලද අතර එය 2033 මාර්තු 31 දක්වා වලංගු වේ. වෛද්‍ය අධ්‍යාපනය සඳහා වූ ලෝක සම්මේලනයේ පිළිගැනීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වෙන් වෙන්ව අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලබන අතර වසර 10 ක් පුරාවට කාලානුරූපව ක්‍රමක්ෂය කරනු ලැබේ.

### 2.3.1.4. මූල්‍ය නොවන වත්කම් හායනය

වත්කමක් හානියට පත්ව තිබිය හැකි බවට සලකුණක් පවතින්නේදැයි ශ්‍රී ලංකා වෛද්‍ය සභාව එක් එක් වාර්තාකරණ දිනයේදී තක්සේරු කරනු ලබයි. එවැනි සලකුණක් පවතින්නේ නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හායන පරීක්ෂණයක් අවශ්‍ය වන විට, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් එම වත්කමේ අයකරගත හැකි අගය පිළිබඳ ඇස්තමේන්තුවක් සිදු කරනු ලබයි.

වත්කමක අයකරගත හැකි අගය යනු, වත්කමක විකිණීමේ පිරිවැය අඩු කළ සාධාරණ වටිනාකම සහ එහි භාවිත වටිනාකම යන දෙකෙන් වඩා වැඩි අගය වන අතර, වත්කම මඟින් වෙනත් වත්කම් හෝ වත්කම් කාණ්ඩවලින් බොහෝ දුරට ස්වාධීන වූ මුදල් ලැබීම් ජනනය නොකරන්නේ නම් මිස, එය තනි වත්කමක් සඳහා තීරණය කරනු ලැබේ.

වත්කමක ධාරණ අගය එහි අයකරගත හැකි අගය ඉක්මවා යන විට, එම වත්කම හායනයට පත්ව ඇති ලෙස සලකනු ලබන අතර එය එහි අයකරගත හැකි අගය දක්වා අඩු කර ලියනු ලැබේ. භාවිත වටිනාකම තක්සේරු කිරීමේදී, මුදලේ කාලීන වටිනාකම සහ වත්කමට විශේෂිත වූ අවදානම පිළිබඳ වත්මන් වෙළඳපොළ තක්සේරුව පිළිබිඹු කරන වට්ටම් අනුපාතිකයක් භාවිත කරමින්, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ. අඛණ්ඩ මෙහෙයුම්වල හායන අලාභයන්, හායනයට පත් වත්කමේ කාර්යභාරයට අනුකූල වන වියදම් ප්‍රවර්ගයන් යටතේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

කලින් හඳුනා ගන්නා ලද හායන අලාභයක් ආපසු හරවනු ලබන්නේ, අවසන් වරට හායන අලාභය හඳුනා ගැනීමෙන් පසුව, වත්කමේ අයකරගත හැකි අගය තීරණය කිරීම සඳහා භාවිත කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදුවී ඇත්නම් පමණි. එසේ වන්නේ නම්, වත්කමේ ධාරණ අගය එහි අයකරගත හැකි අගය දක්වා වැඩි කරනු ලැබේ. එලෙස වැඩි කරන ලද අගය, පූර්ව වර්ෂයන්හිදී එම වත්කම සඳහා කිසිදු හායන අලාභයක් හඳුනා නොගත්තේ නම් ක්ෂයවීම් අඩු කිරීමෙන් පසුව තීරණය වීමට තිබූ ධාරණ අගය "ඉක්මවා" යා නොහැක. එවැනි ආපසු හැරවීමක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

### 2.3.1.5. මූල්‍ය වත්කම් - මූලික හඳුනා ගැනීම සහ මැනීම

### 2.3.1.5. (අ) මූල්‍ය වත්කම්

මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලබන්නේ, මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීම සඳහා වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ව්‍යාපාරික ආකෘතිය මත පදනම්වය. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ප්‍රායෝගික විකල්පය අනුගමනය කර ඇති, සැලකිය යුතු මූල්‍යකරණ සංරචක අඩංගු නොවන වෙළඳ ලැබිය යුතු දෑ හැර, අනෙකුත් මූල්‍ය වත්කම් ඒවායේ සාධාරණ වටිනාකමට ගනුදෙනු පිරිවැය එකතු කළ අගය මත ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් මූලික වශයෙන් මනිනු ලබයි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ප්‍රායෝගික විකල්පය අනුගමනය කර ඇති, සැලකිය යුතු මූල්‍යකරණ සංරචකයක් අඩංගු නොවන වෙළඳ ලැබිය යුතු දෑ, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 15 (SLFRS 15) යටතේ තීරණය කරනු ලබන ගනුදෙනු මිල මත මනිනු ලැබේ. මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂිත පිරිවැය මත හෝ OCI හරහා සාධාරණ වටිනාකම මත වර්ගීකරණය කර මැනීම සඳහා, එය හිඟව පවතින ප්‍රාග්ධන මුදල මත 'ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් පමණක්' වන මුදල් ප්‍රවාහයන් ඇති කිරීමට අවශ්‍ය වේ.

මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ව්‍යාපාරික ආකෘතිය මඟින් අදහස් කරනු ලබන්නේ, මුදල් ප්‍රවාහයන් ජනනය කිරීම සඳහා එය මූල්‍ය වත්කම් කළමනාකරණය කරන ආකාරයයි. මුදල් ප්‍රවාහයන් ලැබෙන්නේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීමෙන්ද, මූල්‍ය වත්කම් විකිණීමෙන්ද නැතහොත් එම දෙකෙහිම එකතුවකින්ද යන්න මෙම ව්‍යාපාරික ආකෘතිය මඟින් තීරණය කරනු ලබයි. හඳුනා ගන්නා ලද මුදල හිලව් කිරීම සඳහා දැනට බලාත්මක කළ හැකි නීත්‍යානුකූල අයිතියක් පවතින්නේ නම් සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් සාක්ෂාත් කර ගැනීම සහ වගකීම් පියවීම එකවිට සිදු කිරීමට අදහසක් පවතින්නේ නම් පමණක්, මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන අතර, එහි ශුද්ධ මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වාර්තා කරනු ලැබේ.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මූල්‍ය වත්කම්වලට ලැබිය යුතු දෑ, කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්, ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීම සඳහා පවතින ස්ථාවර තැන්පතු, රජයේ සුරැකුම්පත්, ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මෙන්ම මුදල් සහ මුදල් සමාන දෑ ඇතුළත් වේ. පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලීම මත, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මූල්‍ය වත්කම් පසුව ක්‍රමක්ෂිත පිරිවැය මත මනිනු ලැබේ:

අ) ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කර ගැනීමේ අරමුණ සහිත ව්‍යාපාරික ආකෘතියක් තුළ මූල්‍ය වත්කම් සන්තකයේ තබා ගැනීම සහ

ආ) මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි මඟින් නිශ්චිත දිනවලදී, හිඟව පවතින ප්‍රාග්ධන මුදල මත 'ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් පමණක්' වන මුදල් ප්‍රවාහයන් ඇති කිරීම.

ඒ අනුව, ක්‍රමක්ෂිත පිරිවැය යටතේ වන මූල්‍ය වත්කම් පසුව ඵලදායී පොලී අනුපාතික (EIR) ක්‍රමය භාවිතයෙන් මනිනු ලබන අතර ඒවා හායනයට යටත් වේ. වත්කම හඳුනා ගැනීම අවලංගු කිරීමේදී, සංශෝධනය කිරීමේදී හෝ හායනයට ලක්වන විට ඇතිවන ලාභ සහ අලාභ, ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

### 2.3.1.5. (i) ආයෝජන ප්‍රතිපත්තිය:

අරමුදල් ආයෝජනය කරනු ලබන්නේ රජයේ සුරැකුම්පත්වල සහ රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල පමණි. ආයෝජනය මත ඉහළ ප්‍රතිලාභ, ද්‍රවශීලතාව සහ නැවත ආයෝජනය සඳහා වන පොලී අනුපාතික අවදානම පිළිබඳව සලකා බැලීමෙන් පසුව ආයෝජන සිදු කරනු ලැබේ. සියලුම නව ආයෝජන සහ නැවත ආයෝජන තීරණ සඳහා කළමනාකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය වේ.

### 2.3.1.5. (ii) මුදල් ආපසු ගැනීමේ ප්‍රතිපත්තිය:

කල් පිරීමේදී මිස වෙනත් අවස්ථාවලදී මුදල් ආපසු ගැනීම් සිදු කරනු නොලැබේ. ඕනෑම කලින් මුදල් ආපසු ගැනීමක් සඳහා කළමනාකරණ කමිටුවේ සහ සභාවේ අනුමැතිය අවශ්‍ය වේ.

### 2.3.1.5. (ආ) මූල්‍ය වගකීම්

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකම යටතේ වන මූල්‍ය වගකීම් හැර, සියලුම මූල්‍ය වගකීම් ක්‍රමක්ෂිත පිරිවැය මත මනිනු ලැබේ. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගෙවිය යුතු දෑ හැර වෙනත් මූල්‍ය වගකීම් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සතුව නොමැත.

### 2.3.1.6. වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ, අකර්මණ්‍ය සහ සැක සහිත ලැබිය යුතු දෑ සඳහා වන දීමනා අඩු කළ පසු සාක්ෂාත් කර ගැනීමට ඇස්තමේන්තු කර ඇති මුදල් ප්‍රමාණයන්ගෙන් දක්වනු ලැබේ.

වෙනත් ලැබිය යුතු දෑ සහ සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබීමට ඇති හිඟ මුදල්, අකර්මණ්‍ය සහ අඩමාන ලැබිය යුතු දෑ සඳහා වන දීමනා අඩු කළ පිරිවැය මත හඳුනා ගනු ලැබේ.

### 2.3.1.7. මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ යනු අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ වටිනාකමෙහි සිදුවන වෙනස්වීම් පිළිබඳ නොසැලකිය හැකි අවදානමකට යටත් වන්නා වූ, දන්නා මුදල් ප්‍රමාණයන් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන වේ.

ලැබීම් සහ ගෙවීම් ප්‍රකාශයේ අරමුණ සඳහා, මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල්වලින් සහ හිඟ බැංකු අයිරා අඩු කළ බැංකු තැන්පතුවලින් සමන්විත වේ. එනම් අත්පත් කරගත් දිනයේ සිට මාස තුනක් හෝ ඊට අඩු කෙටි කල් පිරීම් සහිත ආයෝජන ද මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

### 2.3.2. වගකීම් සහ ප්‍රතිපාදන

වගකීමක් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ පියවීමට අපේක්ෂා කරන විට; මූලික වශයෙන් වෙළඳාම් කිරීමේ අරමුණ සඳහා සන්තකයේ තබාගෙන ඇති විට, වාර්තාකරණ කාලසීමාවෙන් පසුව මාස දොළහක් ඇතුළත එය පියවීමට නියමිතව ඇති විට හෝ වාර්තාකරණ කාලසීමාවෙන් පසුව අවම වශයෙන් මාස දොළහක්වත් එම වගකීම පියවීම කල් දැමීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැති විට, එය ජංගම ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව අනෙකුත් සියලුම වගකීම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කරනු ලබයි.

### 2.3.2.1. විලම්භිත ආදායම

විලම්භිත ආදායම හටගනු ලබන්නේ;

### 2.3.2.1. (අ) සාමාජිකයන් ලියාපදිංචි කිරීම අලුත් කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් සාමාජික ලියාපදිංචි කිරීම් සඳහා වසර පහක කාලයක් කල්තබා ආවරණය වන පරිදි අලුත් කිරීමේ සහ ප්‍රතිස්ථාපන ගාස්තු ලබා ගනු ලබයි. ඒ අනුව, එවැනි ලැබීම් ආරම්භක වශයෙන් විලම්භිත ආදායම ලෙස හඳුනා ගනු ලැබේ.

ඉන්පසුව, වාර්ෂිකව මුළු ගාස්තුවෙන් පහෙන් එකක (1/5) අනුපාතය බැගින් සරල රේඛීය පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ආදායම හඳුනා ගනු ලැබේ. ඉතිරි කාලසීමාව තුළ එය ආදායමක් ලෙස හඳුනා ගන්නා තෙක්, අනාගත කාලසීමාවන්ට අදාළ උපයා නොමැති කොටස, ජංගම සහ ජංගම නොවන වගකීම් අතර වර්ගීකරණය කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වගකීමක් ලෙස ගෙන යනු ලැබේ.

### 2.3.2.1. (ආ) විදේශීය වෛද්‍ය විද්‍යාල පිළිගැනීම

විදේශීය වෛද්‍ය සහ දන්ත වෛද්‍ය විද්‍යාල ඇගයීම සඳහා සභාව විසින් ආකෘති පත්‍රය 1 සහ ආකෘති පත්‍රය 2 න් සමන්විත අදියර දෙකක ඇගයීම් ක්‍රියාවලියක් අනුගමනය කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ පිරිනමනු ලබන පිළිගැනීම වසර පහක කාලසීමාවක් සඳහා වලංගුව පවතී. ඒ අනුව, 1 වන ආකෘති පත්‍රය සහ 2 වන ආකෘති පත්‍රය ඇගයීම් සම්බන්ධයෙන් එකතු කරනු ලබන ගාස්තු, ආරම්භක වශයෙන් විලම්භිත ආදායම ලෙස හඳුනා ගනු ලැබේ.

වසර පහේ පිළිගැනීමේ කාලසීමාව පුරා වාර්ෂිකව පහෙන් එකක (1/5) අනුපාතය බැගින් සරල රේඛීය පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ආදායම හඳුනා ගනු ලැබේ. අනාගත කාලසීමාවන්ට අදාළ උපයා නොමැති කොටස, එය ආදායමක් ලෙස හඳුනා ගන්නා තෙක්, ජංගම සහ ජංගම නොවන වගකීම් අතර වර්ගීකරණය කර මුදල් තත්ත්ව ප්‍රකාශය තුළ වගකීමක් ලෙස ගෙන යනු ලැබේ.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

### 2.3.2.2. ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සභාව සතුව වත්මන් බැඳීමක් (නීත්‍යානුකූල හෝ ව්‍යුහගත) පවතින විට, එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගැබ්ව ඇති සම්පත් බාහිරට ගලා යාමක් අවශ්‍ය වීමට ඉඩකඩ ඇති සහ එම බැඳීමේ මුදල පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් කළ හැකි අවස්ථාවලදී ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. මුදලේ කාලීන වටිනාකමෙහි බලපෑම සැලකිය යුතු නම්, මුදලේ කාලීන වටිනාකම සහ සුදුසු පරිදි වගකීමට විශේෂිත වූ අවදානම් පිළිබඳ වත්මන් වෙළඳපොළ තක්සේරුව පිළිබිඹු කරන, බදු පෙර අනුපාතිකයක් භාවිතයෙන් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීම මඟින් ප්‍රතිපාදන තීරණය කරනු ලැබේ. වට්ටම් කිරීම භාවිත කරනු ලබන විට, කාලය ගතවීම හේතුවෙන් ප්‍රතිපාදනයෙහි සිදුවන වැඩිවීම පොලී වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

### 2.3.2.3. සේවක ප්‍රතිලාභ

**(අ) සේවක විශ්‍රාම සැලැස්ම - පාරිතෝෂිකය**

සේවක විශ්‍රාම සැලැස්ම යනු අර්ථ දක්වන ලද දායකත්ව සැලැස්මකින් බැහැර වූ, සේවා නියුක්තියෙන් පසු ප්‍රතිලාභ සැලැස්මකි. මෙම නිර්ණිත ප්‍රතිලාභය, ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය භාවිතයෙන් ගණනය කරනු ලැබේ. නිර්ණිත ප්‍රතිලාභ බැඳීමෙහි වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ, ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් ඒකකයෙන් නාමකරණය කරන ලද සහ අදාළ වගකීමේ කාලසීමාවන්ට ආසන්න වන කල් පිරීමේ කාලසීමාවන් සහිත පොලී අනුපාතික භාවිත කරමින්, ඇස්තමේන්තුගත අනාගත බාහිර මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙනි.

අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම, වට්ටම් අනුපාතිකය, අනාගත වැටුප් වර්ධක සහ මර්ත්‍යතා අනුපාතික පිළිබඳ උපකල්පන ගණනාවක් භාවිත කරමින් රක්ෂණ ගණිතමය පදනමක් මත තීරණය කරනු ලබන සාධක කිහිපයක් මත රඳා පවතී. මෙම සැලසුම්වල පවතින දිගුකාලීන ස්වභාවය හේතුවෙන්, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. සියලුම උපකල්පන එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කරනු ලැබේ.

පාරිතෝෂිකය සඳහා වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වන්නේ, ආයුගණක ලාභ සහ අලාභ ඒවා සිදුවන කාලසීමාව තුළදීම සම්පූර්ණයෙන්ම වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ වෙන් වෙන්ව හඳුනා ගැනීමයි.

සේවක විශ්‍රාම සැලැස්මක් මඟින් සේවකයෙකු විශ්‍රාම ගැන්වීමේදී ලබන ප්‍රතිලාභ මුදල නිර්වචනය කරනු ලබන අතර, එය සාමාන්‍යයෙන් වයස, සේවා කාලය සහ පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ කිහිපයක් මත රඳා පවතී. කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව, සේවකයෙකුට පාරිතෝෂික ගෙවීම සඳහා වන වගකීම පැනනගින්නේ වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. මෙම වගකීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් බාහිරව අරමුදල් සපයා නැත.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

**(ආ) නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසිවලට අනුකූලව සේවකයෝ සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයන් සහ සේවක භාරකාර අරමුදල් දායකත්වයන් සඳහා සුදුසුකම් ලබති. මේවා දරනු ලබන විට විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC) විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් පිළිවෙළින් 15% ක් සහ 3% ක් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා දායක කරනු ලබයි.

### 2.3.2.4. ජංගම සහ විලම්භිත බදු

ආදායම් බදු වියදම, ජංගම සහ විලම්භිත බදුවලින් සමන්විත වේ. එය ලාභ හෝ අලාභ ගිණුම තුළ හඳුනා ගනු ලැබේ.

**(අ) ජංගම බදු**

ජංගම බදුකරණය සඳහා වූ ප්‍රතිපාදන, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සහ පසුව 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මඟින් සංශෝධිත පරිදි ඊට අනුකූලව ගණනය කර ඇත.

**(ආ) විලම්භිත බදුකරණය**

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වන වත්කම් සහ වගකීම්වල දරන අගයන් සහ බදුකරණ අරමුණු සඳහා භාවිත කරන මුදල් ප්‍රමාණයන් අතර පවතින තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්භිත බදු හඳුනා ගනු ලැබේ.

භාවිත නොකළ බදු අලාභ, භාවිත නොකළ බදු බැර සහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්භිත බදු වත්කම් හඳුනා ගනු ලබන්නේ, ඒවා හිලව් කර ගැනීමට හැකි වන පරිදි අනාගතයේදී බදු පැනවිය හැකි ලාභ පවතිනු ඇතැයි සම්භාවිතාවක් පවතින ප්‍රමාණයට පමණි. විලම්භිත බදු වත්කම් එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කරනු ලබන අතර, අදාළ බදු ප්‍රතිලාභය සාක්ෂාත් කරගත හැකි වනු ඇතැයි තවදුරටත් සම්භාවිතාවක් නොමැති ප්‍රමාණයට එම වත්කම් අඩු කරනු ලැබේ; අනාගත බදු පැනවිය හැකි ලාභ ලැබීමේ සම්භාවිතාව වර්ධනය වන විට එවැනි අඩු කිරීම් ආපසු හරවනු ලැබේ.

හඳුනා නොගත් විලම්භිත බදු වත්කම් එක් එක් වාර්තාකරණ දිනයේදී නැවත ඇගයීමට ලක් කෙරෙන අතර, එම වත්කම් භාවිතයට ගත හැකි පරිදි අනාගත බදු පැනවිය හැකි ලාභ ලැබීමට ඇති සම්භාවිතාව සැලකිල්ලට ගනිමින් එම ප්‍රමාණයට පමණක් ඒවා හඳුනා ගනු ලැබේ. විලම්භිත බද්ද මැනීම සිදු කරනු ලබන්නේ, වාර්තාකරණ දිනය වන විට පනවා ඇති හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු අනුපාතික උපයෝගී කරගනිමින්, තාවකාලික වෙනස්කම් ආපසු හැරවීමේදී ඒවා සඳහා යෙදිය යුතු යැයි අපේක්ෂා කරන බදු අනුපාතිකයන් මත පදනම්වය. විලම්භිත බද්ද මැනීමේදී, සමාගම විසින් වාර්තාකරණ දිනයේදී එහි වත්කම් සහ වගකීම්වල ධාරණ මුදලඅය කර ගැනීමට හෝ පියවීමට අපේක්ෂා කරන ආකාරය අනුව පැන නඟින බදුමය ප්‍රතිවිපාකයන් පිළිබිඹු කෙරේ.

## මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්

**2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

ලාභ හෝ අලාභයෙන් පරිබාහිරව හඳුනා ගනු ලබන අයිතමයන්ට අදාළ විලම්භිත බදු, ලාභ හෝ අලාභයෙන් පරිබාහිරව හඳුනා ගනු ලැබේ. විලම්භිත බදු අයිතමයන්, ඊට පාදක වන ගනුදෙනුව සමඟ පවතින සහසම්බන්ධතාවය මත සෙසු විස්තීර්ණ ආදායම් තුළ හෝ ඍජුවම හිමිකම් යටතේ හඳුනා ගනු ලැබේ. ජංගම බදු වත්කම්, ජංගම බදු වගකීම්වලට එරෙහිව හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව බලපැවැත්විය හැකි අයිතිවාසිකමක් පවතින්නේ නම් සහ එම විලම්භිත බදු එකම බදු පැනවිය හැකි ආයතනයට  සහ එකම බදු අධිකාරියට අදාළ වන්නේ නම්, විලම්භිත බදු වත්කම් සහ විලම්භිත බදු වගකීම් එකිනෙකට හිලව් කරනු ලැබේ.

**විලම්භිත බදුවලට අදාළ සැලකිය යුතු විනිශ්චයන්**

භාවිතයට නොගත් බදු අලාභයන් වෙනුවෙන් විලම්භිත බදු වත්කම් හඳුනා ගනු ලබන්නේ, එම අලාභයන් හිලව් කරගත හැකි පරිදි අනාගතයේදී බදු පැනවිය හැකි ලාභ ලැබීමට ඇති සම්භාවිතාව සැලකිල්ලට ගනිමින් එම ප්‍රමාණයට පමණි. අනාගත බදු පැනවිය හැකි ලාභ ලැබිය හැකි කාලසීමාව සහ එහි මට්ටම මෙන්ම අනාගත බදු සැලසුම්කරණ උපාය මාර්ගයන් මත පදනම්ව, හඳුනාගත හැකි විලම්භිත බදු වත්කම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා සැලකිය යුතු කළමනාකරණ විනිශ්චයක් අවශ්‍ය වේ.

### 2.3.3 විදේශ මුදල් පරිවර්තනය

#### 2.3.3.1. ගනුදෙනු සහ ශේෂයන්

සියලුම විදේශ විනිමය ගනුදෙනු ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කරනු ලැබේ. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් මෙහෙයුම් ව්‍යවහාර මුදල තීරණය කරනු ලබන අතර, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ඇති අයිතමයන් එම මෙහෙයුම් ව්‍යවහාර මුදල භාවිතයෙන් මනිනු ලැබේ. විදේශ මුදල්වලින් සිදු කරන ගනුදෙනු, එම ගනුදෙනුව මුලින්ම හඳුනා ගැනීමට සුදුසුකම් ලබන දිනට පවතින, අදාළ මෙහෙයුම් ව්‍යවහාර මුදලේ එසැණ විනිමය අනුපාතිකයන් (spot rates) යටතේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් මූලිකව වාර්තා කරනු ලැබේ. විදේශ මුදල්වලින් දැක්වෙන මූල්‍යමය වත්කම් සහ වගකීම්, වාර්තාකරණ දිනයේ පවතින එසැණ විනිමය අනුපාතිකය අනුව මෙහෙයුම් ව්‍යවහාර මුදලට සමාන වන සේ නැවත පරිවර්තනය කරනු ලැබේ.

විදේශ මුදලකින් ඓතිහාසික පිරිවැය මත මනිනු ලබන මූල්‍යමය නොවන අයිතමයන්, මූලික ගනුදෙනු සිදුවූ දිනට පැවති විනිමය අනුපාතිකයන් භාවිතයෙන් පරිවර්තනය කරනු ලැබේ. මූල්‍යමය නොවන වත්කම් සහ වගකීම් පරිවර්තනය කරනු ලබන්නේ එම අගයන් තීරණය කරන ලද අවස්ථාවන්හිදී පැවති විනිමය අනුපාතිකයන් භාවිතයෙනි. විදේශ මුදල් පරිවර්තන වෙනස්කම් සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

.

## මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්

**2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

**2.3.4** ආදායම් හඳුනා ගැනීම

**2.3.4.1.** ආදායම

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ආදායම් මාර්ග, "පාරිභෝගිකයන් සමඟ ඇති ගිවිසුම්වලින් ලැබෙන ආදායම" පිළිබඳ වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 15 (SLFRS 15) ට අනුකූලව හඳුනා ගනු ලබන අතර, ඒ අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සිය පාර්ශ්වකරුවන් වෙත සේවාවන් සැපයීමෙන් ලැබීමට අපේක්ෂා කරන ප්‍රතිෂ්ඨාව පිළිබිඹු වන මුදලකින් ආදායම් හඳුනා ගැනීම ගිණුම්කරණය කිරීම සඳහා SLFRS 15 මඟින් පියවර පහක ආකෘතියක් ස්ථාපිත කර ඇති අතර, එම ප්‍රමිතිය ප්‍රකාරව ආදායම හඳුනා ගනු ලබන්නේ කාර්යසාධන බැඳීම සතුටුදායක ලෙස සපුරාලීමෙන් පසුව වන අතරම, පාර්ශ්වකරුවන් (ප්‍රධාන වශයෙන් සිසුන් සහ සාමාජිකයන්) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් සපයනු ලබන ප්‍රතිලාභ එකවිටම ලබා ගනිමින් පරිභෝජනය කරන විට සහ සම්පූර්ණ කරන ලද කාර්යසාධනය වෙනුවෙන් ගෙවීම් ලැබීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට බලාත්මක කළ හැකි අයිතියක් පවතින අවස්ථාවලදී ආදායම් හඳුනා ගැනීම කාලයත් සමඟ සිදුවනු ඇතැයි ශ්‍රී ලංකා වෛද්‍ය සභාව අපේක්ෂා කරන අතර එසේ නොමැති නම් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ආදායම යම් නිශ්චිත අවස්ථාවකදී හඳුනා ගනු ලැබේ.

පහත වගුව මඟින්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 15 (SLFRS 15) ට අනුකූලව ආදායම් මාර්ග සහ කාර්යසාධන බැඳීම් සපුරාලීම මත ආදායම හඳුනා ගැනීම පිළිබඳ විස්තර සපයනු ලබයි.

| ආදායම් මාර්ගය | ආදායම් විස්තරය | ආදායම හඳුනා ගැනීම |
|---|---|---|
| ලියාපදිංචි කිරීම | සෞඛ්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි. එය සමස්තයක් ලෙස සෞඛ්‍ය වෘත්තිකයන්ගේ කාණ්ඩ 19 ක් ලියාපදිංචි කරනු ලබයි. මීට අමතරව, පිළිවෙළින් 29 සහ 43 වන වගන්ති යටතේ ලියාපදිංචි කර ඇති වෛද්‍ය විශේෂඥයන් සහ දන්ත විශේෂඥයන් සඳහා වෙන වෙනම ලියාපදිංචි ලේඛන පවත්වාගෙන යනු ලැබේ. | සෞඛ්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ලැබෙන ගාස්තු, සභාවේ අනුමැතිය ලබා දෙන අවස්ථාවේදී ආදායමක් ලෙස පිළිගනු ලබන අතර, පාර්ශ්වකරුවන්ගේ සේවයට කාර්ය සාධන වගකීම ස්ථාපිත කර ඇති බැවින් එවැනි අයදුම්පත් මත ගෙවීමට සිදුවේ. |
| ලියාපදිංචිය අලුත් කිරීම | වාර්තාකරණ කාල සීමාව තුළ ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව පස් වසරකට වරක් අලුත් කිරීම ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් සිදු කර ඇත.<br><br>අ) වෛද්‍ය වෘත්තිකයන්, දන්ත වෛද්‍යවරුන් සහ 41 වන වගන්තිය<br>ආ) සම සෞඛ්‍ය | සාමාජිකයින්ගෙන් අය කරනු ලබන මූල්‍ය කාල සීමාව සඳහා අදාළ ලියාපදිංචිය අලුත් කිරීම සම්බන්ධයෙන් ලැබෙන ගාස්තු, දායකත්වය ලැබිය යුතු මූල්‍ය කාල සීමාව තුළ කාර්ය සාධන වගකීම තෘප්තිමත් වන බැවින් කාලයත් සමඟ ආදායමක් ලෙස පිළිගනු ලැබේ. |

| ආදායම් මාර්ගය | ආදායම් විස්තරය | ආදායම හඳුනා ගැනීම |
|---|---|---|
| | | අනාගත කාලසීමාවන්ට අදාළව අය කරන ලද දායක මුදල්, ජංගම සහ ජංගම නොවන වගකීම් යටතේ කල්තබා ලැබුණු ගාස්තු ලෙස, විලම්භිත ආදායම වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි පෙන්වනු ලැබේ. |
| **ලියාපදිංචිය ප්‍රතිස්ථාපනය කිරීම** | නියමිත කාලසීමාව තුළ සිය ලියාපදිංචිය අලුත් කිරීමට අපොහොසත් වූ ලියාපදිංචිලාභීන්ට, වෛද්‍ය ආඥාපනතේ (105 වන පරිච්ඡේදය) විධිවිධානවලට අනුව නිසි ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් සිය ලියාපදිංචිය ප්‍රතිස්ථාපනය කර ගැනීමට අවසර දෙනු ලැබේ. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් සාමාජික ලියාපදිංචි කිරීම් වෙනුවෙන්, ඉදිරි පස් වසරක කාලසීමාවක් ආවරණය වන පරිදි ලියාපදිංචිය ප්‍රතිස්ථාපනය කිරීමේ ගාස්තු කල්තබා ලබා ගනු ලබයි. | සාමාජිකයන්ගෙන් අය කරනු ලබන සහ අදාළ මූල්‍ය කාලසීමාවට වලංගු වන ලියාපදිංචිය ප්‍රතිස්ථාපනය කිරීමේ ගාස්තු, දායකත්වය ලැබිය යුතු මූල්‍ය කාලසීමාව පුරා කාර්යසාධන බැඳීම සපුරාලනු ලබන බැවින් කාලයත් සමඟ ආදායම ලෙස හඳුනා ගනු ලැබේ.<br><br>අනාගත කාලසීමාවන්ට අදාළව අය කරන ලද දායක මුදල්, ජංගම සහ ජංගම නොවන වගකීම් යටතේ ලියාපදිංචිය ප්‍රතිස්ථාපනය කිරීම වෙනුවෙන් කල්තබා ලැබුණු ගාස්තු ලෙස, විලම්භිත ආදායම වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පෙන්වනු ලැබේ. |
| **විශේෂඥ වෛද්‍ය ලියාපදිංචිය** | ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ විශේෂඥ වෛද්‍ය ලියාපදිංචිය යනු වෛද්‍ය ආඥාපනතේ වෙනත් වගන්තියක් (39අ සහ 39ආ වගන්ති) යටතේ ක්‍රියාත්මක වන වෙනම ක්‍රියාවලියකි. | විශේෂඥ වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ලැබෙන ගාස්තු, සභාවේ අනුමැතිය පිරිනමනු ලබන සහ පාර්ශ්වකරුවන්ගේ සේවාව උදෙසා වන කාර්යසාධන බැඳීම ස්ථාපිත වී ඇති බැවින් එවැනි අයදුම්පත් සඳහා ගෙවීම් හිමි වන යම් නිශ්චිත අවස්ථාවකදී ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ. |
| **අතිරේක සුදුසුකම් ලියාපදිංචි කිරීම** | ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අතිරේක සුදුසුකම් ලියාපදිංචි කිරීම සඳහා වන අයදුම්පත් සැකසීම සහ අනුමත කිරීම සිදු කරනු ලබයි. | අතිරේක සුදුසුකම් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ලැබෙන ගාස්තු, සභාවේ අනුමැතිය පිරිනමනු ලබන සහ පාර්ශ්වකරුවන්ගේ සේවාව උදෙසා වන කාර්යසාධන බැඳීම ස්ථාපිත වී ඇති බැවින් එවැනි අයදුම්පත් සඳහා ගෙවීම් හිමි වන යම් නිශ්චිත අවස්ථාවකදී ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ. |

| ආදායම් මාර්ගය | ආදායම් විස්තරය | ආදායම හඳුනා ගැනීම |
|---|---|---|
| **තාවකාලික ලියාපදිංචි කිරීම්** | තාවකාලික ලියාපදිංචි කිරීම් සඳහා වන අයදුම්පත් සකස් කර අනුමත කිරීම ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් සිදු කරනු ලැබේ. | තාවකාලික ලියාපදිංචි කිරීම් සම්බන්ධයෙන් ලැබෙන ගාස්තු, සභාවේ අනුමැතිය පිරිනමනු ලබන සහ පාර්ශ්වකරුවන්ගේ සේවාව උදෙසා වන කාර්යසාධන බැඳීම ස්ථාපිත වී ඇති බැවින් එවැනි අයදුම්පත් සඳහා ගෙවීම් හිමි වන යම් නිශ්චිත අවස්ථාවකදී ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ. |
| **විභාග** | ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වසරකට දෙවරක් වෛද්‍ය වෘත්තියෙහි නිරත වීම සඳහා ලියාපදිංචි වීමේ විභාගය (ERPM) සහ දන්ත ශල්‍ය වෛද්‍ය වෘත්තියෙහි නිරත වීම සඳහා ලියාපදිංචි වීමේ විභාගය (ERPDS) පවත්වයි. | විභාග සඳහා වන ගාස්තු, ප්‍රවේශ පත්‍ර උත්පාදනය කිරීමේ කාර්යසාධන බැඳීම සතුටුදායක ලෙස ඉටු කිරීමෙන් පසු ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ. |
| **විදේශීය වෛද්‍ය විද්‍යාල පිළිගැනීම** | ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පිළිගැනීම සඳහා විදේශීය වෛද්‍ය සහ දන්ත වෛද්‍ය විද්‍යාල ඇගයීමට ලක් කිරීම වෙනුවෙන්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අදියර දෙකකින් යුත් (ආකෘතිය 1 සහ ආකෘතිය 2) ඇගයීම් ක්‍රියාවලියක් අනුගමනය කරනු ලබයි. | විදේශීය වෛද්‍ය විද්‍යාල පිළිගැනීම සම්බන්ධයෙන් ලැබෙන ගාස්තු, එම විශ්වවිද්‍යාලවලින් අය කරනු ලබන මූල්‍ය කාල සීමාව සඳහා, දායකත්වය ලැබිය යුතු මූල්‍ය කාල සීමාව තුළ සපුරා ඇති කාර්ය සාධන වගකීම නිසා කාලයත් සමඟ ආදායමක් ලෙස පිළිගැනේ. අනාගත කාල පරිච්ඡේදවලට අදාළව අය කරනු ලබන දායකත්ව මුදල්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම සහ ජංගම නොවන වගකීම් යටතේ කල්තියා ලැබුණු ගාස්තු ලෙස, විලම්භිත ආදායම වශයෙන් දක්වා ඇත. |
| **සහතික නිකුත් කිරීම** | ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් යහපත් වෘත්තීය තත්ත්ව සහතික (Certificates of Good Standing - CGS) සඳහා වන අයදුම්පත් සැකසීම සහ අනුමත කිරීම සිදු කරනු ලබයි. | සහතික නිකුත් කිරීමෙන් ලැබෙන ආදායම, සහතික නිකුත් කරනු ලබන සහ එම කාර්යය සඳහා වන ගෙවීම් ලබාගන්නා යම් නිශ්චිත අවස්ථාවකදී ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ. |
| **වෛද්‍ය සත්‍යාපනය කිරීම** | ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් සත්‍යාපනය කිරීම් සඳහා වන අයදුම්පත් සැකසීම සහ අනුමත කිරීම සිදු කරනු ලබයි. | සහතික නිකුත් කිරීමෙන් ලැබෙන ආදායම, සහතික නිකුත් කරනු ලබන සහ එම කාර්යය සඳහා වන ගෙවීම් ලබාගන්නා යම් නිශ්චිත අවස්ථාවකදී ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ. |

| ආදායම් මාර්ගය | ආදායම් විස්තරය | ආදායම හඳුනා ගැනීම |
|---|---|---|
| **වෙනත් සේවාවන්** | ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් තොරතුරු වෙනස් කිරීම සඳහා වන අයදුම්පත්, ලේඛනවල සහතික කළ උපුටන නිකුත් කිරීම සඳහා වන ඉල්ලීම් සහ විශේෂිත අවස්ථාවලදී සංශෝධිත/යාවත්කාලීන කරන ලද සහතික නැවත නිකුත් කිරීම සඳහා වන ඉල්ලීම් වෙනුවෙන් කටයුතු කරනු ලබයි. | වෙනත් සේවාවන්ගෙන් ලැබෙන ආදායම, එම වෙනත් සේවාව සැපයීම සහ එම කාර්යය සඳහා වන ගෙවීම් ලබාගන්නා යම් නිශ්චිත අවස්ථාවකදී ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ. |
| **හිඟ මුදල්, දණ්ඩන සහ දඩ මුදල්** | නියමිත දිනට පසුව ලැබෙන ගෙවීම් සම්බන්ධයෙන් වන යම් හිඟ මුදල්, දණ්ඩන සහ දඩ මුදල් | නියමිත දිනට පසුව ලැබෙන ගෙවීම් සම්බන්ධයෙන් වන හිඟ මුදල්, දණ්ඩන සහ දඩ මුදල් එම ආදායම ලැබුණු පසු හඳුනා ගනු ලැබේ. එබැවින්, ආදායම යම් නිශ්චිත අවස්ථාවකදී හඳුනා ගනු ලබයි. |
| **විවිධ ආදායම්** | ඉහත සඳහන් කර නොමැති වෙනත් ඕනෑම ආදායමක් | ඉහත සඳහන් කර නොමැති වෙනත් ඕනෑම ආදායමක් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ. |

**2.3.4.2. මූල්‍ය ආදායම:**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) 09 - මූල්‍ය උපකරණ ප්‍රමිතියට අනුකූලව ඵලදායී පොලී අනුපාතික ක්‍රමය (EIR) භාවිතා කරමින් හඳුනා ගන්නා ලද පොලී ආදායමෙන් මූල්‍ය ආදායම සමන්විත වේ.

**2.3.4.3. ලාභ සහ පාඩු**

ආයෝජන ඇතුළුව දේපළ, පිරියත සහ උපකරණ මෙන්ම වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමෙන් සහ විදේශ මුදල් පරිවර්තනයෙන් පැන නගින, ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ සහ පාඩු, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කරනු ලබන්නේ, අපහරණය කිරීමෙන් ලැබෙන ආදායමෙන් එම වත්කම්වල ධාරණ ප්‍රමාණය සහ අදාළ විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසුවය.

**2.3.4.4. වෙනත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

**2.3.5. වියදම් හඳුනා ගැනීම**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ක්‍රියාකාරකම් සිදුකිරීමේදී දරන ලද වියදම්, ඒවා දරන ලද කාල සීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පරිපාලනය හා ක්‍රියාත්මක කිරීම සහ අපේක්ෂිත මට්ටම්වල ඉටු කිරීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ ප්‍රතිසංස්කරණය හා නඩත්තු කිරීමේදී දරන ලද අනෙකුත් වියදම් උපචිත පදනමක් මත ගිණුම්ගත කර විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අය කරනු ලැබේ. වියදම් ස්වභාවයේ ක්‍රමය භාවිතා කරමින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම් ඉදිරිපත් කෙරේ.

## මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය**

**(අ) ව්‍යාපෘති වියදම්**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සිදුවන වියදම්, ඒවා දරනු ලබන කාලසීමාව තුළදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලබන අතර, ව්‍යාපෘති වියදම් හඳුනා ගැනීමේ පදනම ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති යෝජනාවට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ස්ථාන, ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති කාර්ය මණ්ඩලය සහ ව්‍යාපෘතියේ අපේක්ෂිත ක්‍රියාකාරකම් මත පදනම් වේ.

දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතමයන් ඉපැයීම අතර පවතින සෘජු සම්බන්ධතාවය පදනම් කර ගනිමින් වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

**(ආ) පරිපාලන සහ මෙහෙයුම් වියදම්**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පවත්වාගෙන යාම වෙනුවෙන් සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම මට්ටමකින් නඩත්තු කිරීම වෙනුවෙන් දරනු ලබන සියලුම පරිපාලන සහ මෙහෙයුම් වියදම්, වර්ෂය සඳහා වන වියදම් ඉක්මවූ ආදායම ගණනය කිරීමේදී ආදායමට එරෙහිව අය කර ඇත.

දරනු ලබන සියලුම පරිපාලන සහ මෙහෙයුම් වියදම් උපචිත පදනම මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

**(ඇ) මූල්‍ය වියදම්**

මූල්‍ය වියදම් හඳුනාගනු ලබන්නේ ඒවා ගෙවන විට හෝ වගකීම් නිර්මාණය කරන විට උපචිත පදනමක් මත ය.

### 3. ආදායම

| | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| ගාස්තු - ලියාපදිංචිය, ලියාපදිංචිය අලුත් කිරීම සහ සේවා | 207,888,208 | 155,578,907 |
| විභාග ගාස්තු | 120,298,820 | 68,724,323 |
| විදේශ වෛද්‍ය විද්‍යාල ආදායම පිළිගැනීම - ආකෘති පත්‍ර I සහ 2 | 10,194,854 | 7,314,852 |
| | 338,381,882 | 231,618,081 |

### 4. දේපළ, පිරියත සහ උපකරණ

| 4.1 රැගෙන ආ අගයන් | 2024.01.01 දිනට ශේෂය | එකතු කිරීම් | අපහරණය | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය මත** | | | | |
| ඉඩම් | 74,266,084 | - | | 74,266,084 |
| ගොඩනැගිලි | 35,990,804 | 5,624,310 | | 41,615,114 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 6,329,222 | 1,579,396 | | 7,908,618 |
| කාර්යාල උපකරණ | 21,369,496 | 5,969,777 | | 27,339,274 |
| වෙනත් උපකරණ | 3,834,673 | 48,057 | | 3,882,729 |
| දුරකථන පද්ධතිය | 479,771 | - | | 479,771 |
| සමානුකාරක සහ විභාග පුහුණුකාරක (Simulators and Examination Trainer) | 749,570 | - | | 749,570 |
| පරිගණක මෘදුකාංග | 248,874 | - | | 248,874 |
| මෝටර් වාහන | 217,500 | - | | 217,500 |
| පරිගණක ජාල පද්ධති උපකරණ | 4,634,155 | - | | 4,634,155 |
| ක්ෂය කළ හැකි වත්කම්වල මුළු වටිනාකම | **148,120,150** | **13,221,540** | **-** | **161,341,689** |

| 4.2 ක්ෂයවීම් | 2024.01.01 දිනට ශේෂය | වර්ෂය සඳහා වෙනස්වීම | අපහරණය | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය මත** | | | | |
| ගොඩනැගිලි | 27,366,848 | 3,964,732 | | 31,331,580 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 5,011,489 | 793,196 | | 5,804,685 |
| කාර්යාල උපකරණ | 15,348,494 | 3,416,354 | | 18,764,848 |
| වෙනත් උපකරණ | 3,366,378 | 232,052 | | 3,598,429 |
| දුරකථන පද්ධතිය | 446,598 | 8,769 | | 455,367 |
| සමානුකාරක සහ විභාග පුහුණුකාරක (Simulators and Examination Trainer) | 749,570 | - | | 749,570 |
| පරිගණක මෘදුකාංග | 248,874 | - | | 248,874 |
| මෝටර් වාහන | 217,500 | - | | 217,500 |
| පරිගණක ජාල පද්ධති උපකරණ | 1,927,652 | 1,120,337 | | 3,047,989 |
| මුළු ක්ෂයවීම් | **54,683,404** | **9,535,439** | | **64,218,843** |

#### 4.3 ශුද්ධ පොත් වටිනාකම්

| | 2024 | 2023 |
|---|---|---|
| **පිරිවැය මත** | රු. | රු. |
| ඉඩම් | 74,266,084 | 74,266,084 |
| ගොඩනැගිලි | 10,283,534 | 8,623,956 |
| ගෘහ භාණ්ඩ සහ උපාංග | 2,103,933 | 1,317,733 |
| කාර්යාල උපකරණ | 8,574,425 | 6,021,002 |
| වෙනත් උපකරණ | 284,300 | 468,295 |
| දුරකථන පද්ධතිය | 24,404 | 33,173 |
| සමානුකාරක සහ විභාග පුහුණුකාරක (Simulators and Examination | - | - |
| Trainer) | (0) | (0) |
| පරිගණක මෘදුකාංග | (0) | (0) |
| මෝටර් වාහන | 1,586,166 | 2,706,503 |
| පරිගණක ජාල පද්ධති උපකරණ | **97,122,847** | **93,436,746** |
| **දේපල, කම්හල සහ උපකරණවල මුළු රැගෙන යා හැකි අගයන්** | | |

**4. දේපළ, පිරියත සහ උපකරණ (සම්බන්ධිත)**

**4.4 වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි ඇස්තමේන්තු කර ඇත:**

| | **2024** | **2023** |
|---|---|---|
| ගොඩනැගිලි | වසර 20 | වසර 20 |
| මෝටර් රථ | වසර 5 | වසර 5 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | වසර 4 | වසර 4 |
| කාර්යාල උපකරණ | වසර 4 | වසර 4 |
| වෙනත් උපකරණ | වසර 4 | වසර 4 |
| දුරකථන පද්ධතිය | වසර 4 | වසර 4 |
| සමානුකාරක සහ විභාග පුහුණුකාරක (Simulators and Examination Trainer) | වසර 4 | වසර 4 |
| පරිගණක ජාල පද්ධති උපකරණ | වසර 4 | වසර 4 |

**4.5 දේපල පිරියත සහ උපකරණ සඳහා හිමිකම් සීමා කිරීම්**

වාර්තා කරන දිනට දේපල පිරියත සහ උපකරණ අයිතම සඳහා හිමිකම් සීමාවන් නොමැත.

**4.6 වත්කම භාවිතා කිරීමේ අයිතිය**

වාර්තා කරන දිනට දේපල, පිරියත සහ උපකරණ අයිතම භාවිතා කිරීමේ අයිතිය ලෙස වර්ගීකරණය කර නොමැත.

**4.7 සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපල, පිරියත සහ උපකරණ පිරිවැය අනුව**

| 2024 දෙසැම්බර් 31 දිනට | **2024** | **2023** |
|---|---|---|
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 4,427,373 | 4,381,754 |
| කාර්යාල උපකරණ | 11,961,448 | 11,719,070 |
| වෙනත් උපකරණ | 3,359,845 | 3,001,910 |
| දුරකථන පද්ධතිය | 444,771 | 444,771 |
| සමානුකාරක සහ විභාග පුහුණුකාරක (Simulators and Examination Trainer) | 749,570 | 749,570 |
| පරිගණක මෘදුකාංග | 248,874 | 248,874 |
| මෝටර් වාහන | 217,500 | 217,500 |
| පරිගණක ජාල පද්ධති උපකරණ | 170,000 | 170,000 |
| **එකතුව** | **21,579,381** | **20,933,449** |

**4.8 දේපළ, පිරියත සහ උපකරණ අපහායනය**

2024 දෙසැම්බර් 31 වන දිනට දේපළ, පිරියත සහ උපකරණවල ඇති විය හැකි හානි අලාභය කළමනාකරණය විසින් තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම්ව, දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් වාර්තා කරන දිනට මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හානි ප්‍රතිපාදනයක් සිදු කිරීම අවශ්‍ය නොවේ.

**4.9 ඇපකර ලෙස තබා ඇති දේපළ, පිරියත සහ උපකරණ**

වාර්තාකරණ දිනය වන විට වගකීම් සඳහා ඇපකර ලෙස තබා ඇති කිසිදු දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් නොතිබුණි.

**5. අස්පෘශ්‍ය වත්කම්**

**මෘදුකාංග**

| **5.1** රැගෙන ආ අගය | **2024.01.01 දිනට ශේෂය** | **එකතු කිරීම්** | **අපහරණය** | 2024.**12.31** දිනට **ශේෂය** |
|---|---|---|---|---|
| පිරිවැය මත | **රු.** | **රු.** | **රු.** | **රු.** |
| CGS මොඩියුලය සංස්කරණය 1.0.0 | 75,000 | - | - | 75,000 |
| ලේඛන සංරක්ෂණ පද්ධතිය | 16,162,873 | - | - | 16,162,873 |
| EMIS මෘදුකාංගය -Uni Consultancy | 3,234,800 | - | - | 3,234,800 |
| ප්‍රශ්න පත්‍ර ඇගයීම් මෘදුකාංගය | 470,000 | - | - | 470,000 |
| QuickBooks ගිණුම්කරණ මෘදුකාංගය 2020 | 216,000 | - | - | 216,000 |
| අස්පෘශ්‍ය වත්කම් :SLMC දත්ත සමුදාය | 1,305,000 | - | - | 1,305,000 |
| අස්පෘශ්‍ය වත්කම් :Windows Server | 468,375 | - | - | 468,375 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **21,932,048** | - | - | **21,932,048** |

| **5.2** ක්‍රමක්ෂය කිරීම් | **2024.01.01 දිනට ශේෂය** | **වර්ෂය සඳහා වෙනස්වීම්** | අපහරණය | 2024.**12.31** දිනට **ශේෂය** |
|---|---|---|---|---|
| | **රු.** | **රු.** | රු. | රු. |
| CGS මොඩියුලය සංස්කරණය 1.0.0 | 26,507 | 18,801 | - | 45,308 |
| ලේඛන සංරක්ෂණ පද්ධතිය | | 4,051,789 | - | 4,051,789 |
| EMIS මෘදුකාංගය -Uni Consultancy | 3,234,800 | - | - | 3,234,800 |
| ප්‍රශ්න පත්‍ර ඇගයීම් මෘදුකාංගය | 470,000 | - | - | 470,000 |
| QuickBooks ගිණුම්කරණ මෘදුකාංගය 2020 | 159,041 | 49,488 | - | 208,529 |
| අස්පෘශ්‍ය වත්කම් :SLMC දත්ත සමුදාය | - | 327,144 | - | 327,144 |
| අස්පෘශ්‍ය වත්කම් :Windows Server | 112,268 | 117,107 | - | 229,375 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **4,002,616** | **4,564,328** | - | **8,566,945** |

### 5.3 ශුද්ධ පොත් අගය

| | 2024 | 2023 |
|---|---|---|
| **පිරිවැය මත** | රු. | රු. |
| CGS මොඩියුලය - සංස්කරණය 1.0.0 | 29,692 | 48,493 |
| ලේඛන සංරක්ෂණ පද්ධතිය | 12,111,084 | 16,162,873 |
| EMIS මෘදුකාංගය - Uni Consultancy | - | - |
| ප්‍රශ්න පත්‍ර ඇගයීම් මෘදුකාංගය | - | - |
| QuickBooks ගිණුම්කරණ මෘදුකාංගය 2020 | 7,471 | 56,959 |
| අස්පෘශ්‍ය වත්කම්: SLMC දත්ත ගබඩාව | 977,856 | 1,305,000 |
| අස්පෘශ්‍ය වත්කම්: Windows Server | 239,000 | 356,107 |
| **අස්පෘශ්‍ය වත්කම්වල මුළු රැගෙන ආ අගය** | **13,365,103** | **17,929,431** |

### 5.4 වත්කම්වල ඵලදායී කාලසීමාවන් පහත පරිදි ඇස්තමේන්තු කර ඇත:

| | 2024 | 2023 |
|---|---|---|
| සියලුම අස්පෘශ්‍ය වත්කම් (සියලුම පරිගණක මෘදුකාංග වර්ග) | වසර 4 | වසර 4 |

### 5.5 අස්පෘශ්‍ය වත්කම්වල අපහායනය

කළමනාකාරිත්වය විසින් 2024 දෙසැම්බර් 31 දිනට අස්පෘශ්‍ය වත්කම්වල සිදුවිය හැකි දුර්වලතා අපහායනයන් ඇගයීමට ලක් කර ඇත. එම ඇගයීම මත පදනම්ව, වාර්තාකරණ දිනය වන විට අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කිසිදු අපහායන ප්‍රතිපාදනයක් සිදු කිරීම අවශ්‍ය නොවේ.

### 5.6 ඇපකර ලෙස තබා ඇති අස්පෘශ්‍ය වත්කම්

වාර්තාකරණ දිනය වන විට වගකීම් සඳහා ඇපකර ලෙස තබා ඇති කිසිදු අස්පෘශ්‍ය වත්කම් අයිතමයක් නොතිබුණි.

### 5.7 අස්පෘශ්‍ය වත්කම්වල හිමිකාරිත්ව සීමාවන්

වාර්තාකරණ දිනය වන විට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අස්පෘශ්‍ය වත්කම්වල හිමිකාරිත්වය සම්බන්ධයෙන් කිසිදු සීමා කිරීමක් පවතින්නේ නැත.

### 5.8 WFME පිළිගැනීම

| | 2024 | 2023 |
|---|---|---|
| **5.8 WFME** පිළිගැනීම | රු. | රු. |
| 5.8.1 පිරිවැය අනුව | | |
| ජනවාරි 01 වන දිනට | 34,328,201 | - |
| වසර තුළ එකතු කිරීම් | - | 34,328,201 |
| දෙසැම්බර් 31 වන දිනට | 34,328,201 | 34,328,201 |
| **5.8.2 ක්‍රමක්ෂය කිරීම්** | | |
| ජනවාරි 01 දිනට | 2,584,955 | - |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය අයකිරීම | 3,421,540 | 2,584,955 |
| දෙසැම්බර් 31 දිනට | 6,006,495 | 2,584,955 |
| **5.8.3 ශුද්ධ පොත් අගය** | 28,321,706 | 31,743,246 |
| දෙසැම්බර් 31 දිනට | **28,321,706** | **31,743,246** |

### 5.8.4 වත්කම්වල ඵලදායී කාලසීමාවන් පහත පරිදි ඇස්තමේන්තු කර ඇත:

| | 2024 | 2023 |
|---|---|---|
| **WFME** පිළිගැනීම | වසර 10 | වසර 10 |

### 6. ක්‍රමක්ෂිත පිරිවැය යටතේ ඇති මූල්‍ය වත්කම්

| දෙසැම්බර් 31 දිනට | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| **වසරක් ඇතුළත කල් පිරෙන**ස්ථාවර තැන්පතු - | 1,084,016,561 | - |
| - භාණ්ඩාගාර බිල්පත් | 303,835,065 | - |
| - බැඳුම්කර | 10,201,424 | 181,162,390 |
| **වසරක් ඇතුළත කල් පිරෙන ක්‍රමක්ෂිත පිරිවැය යටතේ ඇති මුළු මූල්‍ය වත්කම්** | **1,398,053,049** | **181,162,390** |
| **වසරකට පසුව කල් පිරෙන -** ස්ථාවර තැන්පතු | 66,707,990 | 843,142,292 |
| - භාණ්ඩාගාර බිල්පත් | - | 272,242,821 |
| - බැඳුම්කර | - | 9,435,743 |
| **වසරකට පසුව කල් පිරෙන ක්‍රමක්ෂිත පිරිවැය යටතේ ඇති මුළු මූල්‍ය වත්කම්** | **66,707,990** | **1,124,820,856** |

| **දෙසැම්බර් 31 දිනට** | **2024** | |
|---|---|---|
| | **රැගෙන ආ අගය** | **සාධාරණ අගය** |
| | රු. | රු. |
| ස්ථාවර තැන්පතු | 1,150,724,550 | 1,231,549,702 |
| භාණ්ඩාගාර බිල්පත් | 303,835,065 | 328,931,060 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 10,201,424 | 10,284,960 |
| **මුළු එකතුව** | **1,464,761,039** | **1,570,765,722** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**6. 1 ස්ථාවර තැන්පතුවල මුළු ආයෝජනය**

| දෙසැම්බර් 31 දිනට | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| ලංකා බැංකුව | 589,143,058 | 532,146,203 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 203,780,746 | 178,996,280 |
| මහජන බැංකුව | 357,800,746 | 131,999,809 |
| **ආයෝජනවල මුළු රැගෙන ආ අගය** | **1,150,724,550** | **843,142,292** |

**6. 2 භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල මුළු ආයෝජනය**

| දෙසැම්බර් 31 දිනට | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව - **භාණ්ඩාගාර බිල්පත්** | 303,835,065 | 272,242,821 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව - **භාණ්ඩාගාර බැඳුම්කර** | 10,201,424 | 190,598,133 |
| **ආයෝජනවල මුළු රැගෙන ආ අගය** | **314,036,489** | **462,840,954** |

**6.2** මූල්‍ය වත්කම්වල අපහායනය
මූල්‍ය වත්කම්වල අවදානම් කළමනාකරණ අනාවරණයන් සහ කල් පිරීම් විශ්ලේෂණය සඳහා සටහන් 2.3.6 බලන්න.
ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර රජයට අයත් බැංකුවක තැන්පත් කර ඇත.

| **7. සේවක ණය** | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| සේවක ණය | 916,397 | 1,072,950 |
| ආපදා ණය | 1,443,807 | 759,875 |
| | **2,360,204** | **1,832,825** |

| 7.1 **සේවක ණය සහ ආපදා ණයවල ජංගම සහ ජංගම නොවන කොටස්** | 2024 | 2024 |
|---|---|---|
| | රු. | රු. |
| | **සේවක ණය** | **ආපදා ණය** |
| වසරක් ඇතුළත ලැබිය යුතු | 293,730 | 539,520 |
| වසරකට පසුව ලැබිය යුතු | 622,667 | 904,287 |
| **මුළු එකතුව** | **916,397** | **1,443,807** |

| **8. අත්තිකාරම්, පෙරගෙවුම් සහ ආපසු ගෙවිය හැකි තැන්පතු** | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| උත්සව අත්තිකාරම් | 369,000 | 297,000 |
| පෙරගෙවුම් සහ ආපසු ගෙවිය හැකි තැන්පතු | 2,398,505 | 3,704,424 |
| | **2,767,505** | **4,001,424** |

**9. ආදායම් බදු**

**දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා වන ආදායම් බදු වියදම්වල ප්‍රධාන සංරචකයන් පහත පරිදි වේ:**

| | | 2024 | 2023 |
|---|---|---|---|
| | | රු. | රු. |
| ලාභ හෝ අලාභ ප්‍රකාශය | | | |
| ජංගම ආදායම් බදු අයකිරීම (9.1) | | 87,090,415 | 76,282,179 |
| පූර්ව වර්ෂය සඳහා වූ ඌන/(අධි) ප්‍රතිපාදන | | - | - |
| විලම්භිත ආදායම් බදු | **9.2.1** | (2,709,234) | 802,662 |
| විලම්භිත බදු අයකිරීම්/ (ප්‍රතිවර්තන) | | | |
| **ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි වාර්තා කර ඇති ආදායම් බදු වියදම** | | **84,381,181** | **77,084,841** |

**9.1 අ. බදු වියදම සහ ව්‍යවස්ථාපිත බදු අනුපාතයෙන් ගුණ කරන ලද ගිණුම්කරණ ලාභයේ නිෂ්පාදිතය අතර සැසඳුම පහත පරිදි වේ,**

| | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| බදුකරණයට පෙර වියදමට වඩා වැඩි ආදායම | 320,475,635 | 277,347,492 |
| සමස්ත අනුමත අයිතම | (92,260,256) | (233,586,472) |
| සමස්ත අනුමත නොවූ අයිතම | 58,910,527 | 38,470,964 |
| **ශුද්ධ ආදායම** | **287,125,907** | **82,231,984** |
| අනුමත වෙනත් ආදායම් | 3,175,477 | 172,041,948 |
| 14% ක ව්‍යවස්ථාපිත බද්ද | | |
| 24% ක ව්‍යවස්ථාපිත බද්ද | | |
| 30% ක ව්‍යවස්ථාපිත බද්ද | 87,090,415 | 76,282,179 |
| **ආදායම් සහ වියදම් ප්‍රකාශයෙහි වාර්තා කර ඇති ආදායම් බදු වියදම** | **87,090,415** | **76,282,179** |

**9.1. ආ. ගෙවිය යුතු ආදායම් බදු**

| දෙසැම්බර් 31 දිනට | 2024 | 2023 |
|---|---|---|
| ඉදිරියට ගෙන ආ ශේෂය | 32,640,590 | 45,020,142 |
| පූර්ව වර්ෂ සඳහා බදු ප්‍රතිපාදන | | |
| කාලච්ඡේදය සඳහා අයකිරීම | 87,090,415 | 76,282,179 |
| **මුළු ගෙවිය යුතු මුදල** | **119,731,005** | **121,302,321** |
| වර්ෂය තුළ ගෙවන ලද බදු | 64,088,407 | 85,463,700 |
| ගෙවන ලද රඳවා ගැනීමේ බදු | 145,163 | 3,198,031 |
| ගෙවිය යුතු ආදායම් බදු | (119,731,005) | (121,302,321) |
| ලැබිය යුතු ආදායම් බදු | | |
| **ගෙවිය යුතු ශුද්ධ ආදායම් බදු** | **(55,497,435)** | **(32,640,590)** |

**9.2 විලම්භිත බදු**

| | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | |
|---|---|---|
| විලම්භිත බදු වත්කම්, වගකීම් සහ ආදායම් බදු පහත සඳහන් කරුණු වලට අදාළ වේ | 2024 | 2023 |
| | රු. | රු. |
| **විලම්භිත බදු වත්කම්/වගකීම්** | | |
| විලම්භිත බදු වගකීම් (දේපළ, පිරියත සහ උපකරණ) | (7,468) | (2,700,893) |
| විලම්භිත බදු වගකීම් (අස්පෘශ්‍ය වත්කම්) | (730,846) | |
| විලම්භිත බදු වත්කම් (නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්) | 4,372,563 | 3,625,910 |
| **ශුද්ධ විලම්භිත බදු වත්කම් \| විලම්භිත බදු** | **3,634,249** | **925,017** |

**9.2.1 විලම්භිත බදු වත්කම්/(වගකීම්) වල චලනයන් පහත පරිදි වේ**

| | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| ජනවාරි 01 දිනට | 925,016 | 1,727,678 |
| වර්ෂය සඳහා විලම්භිත බදු (වියදම)/ප්‍රතිවර්තනය | 2,709,234 | (802,662) |
| **දෙසැම්බර් 31 දිනට** | **3,634,249** | **925,016** |

**10. විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව**

| දෙසැම්බර් 31 දිනට | **2024** | **2023** |
|---|---|---|
| **10.1 වර්ෂය තුළ සිදුකළ ප්‍රතිපාදන** | රු. | රු. |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 12,086,368 | 11,490,095 |
| වර්ෂය තුළ සිදුකළ ගෙවීම් | (641,208) | (389,769) |
| පොලී පිරිවැය | 1,080,395 | - |
| ජංගම සේවා පිරිවැය | 1,293,018 | 986,042 |
| වෙනත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් ශුද්ධ ආයුකාල අලාභය/(ලාභය) | 756,638 | - |
| **වර්ෂය තුළ සිදුකළ මුළු ප්‍රතිපාදනය** | **14,575,212** | **12,086,368** |

1983 අංක 12 දරන පාරිතෝෂිත පනත යටතේ, පාරිතෝෂිත වගකීමක් පැනනගින්නේ සේවකයෙකු වසර පහක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

**10.2 භාවිතා කරන ලද ප්‍රධාන උපකල්පන**

2024 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය තීරණය කිරීමේදී භාවිතා කරන ලද උපකල්පන පහත පරිදි වේ,

| **උපකල්පනය** | **2024** |
|---|---|
| වට්ටම් පොලී අනුපාතිකය * | වාර්ෂිකව 10% |
| සේවක පිරිවැටුම් අනුපාතිකය | වාර්ෂිකව 7% |
| වැටුප් වර්ධක අනුපාතිකය | 10.00% |
| විශ්‍රාම ගැනීමේ වයස | වසර 60 |

* ශ්‍රී ලංකාව තුළ දිගුකාලීන බැඳුම්කර සඳහා පුළුල් වෙළඳපොළක් නොමැති තත්ත්වයකදී, අපේක්ෂිත දිගුකාලීන උද්ධමන අනුපාතිකය සැලකිල්ලට ගනිමින් අනාගත වගකීම් වට්ටම් කිරීම සඳහා වාර්ෂිකව 10% ක දිගුකාලීන පොලී අනුපාතිකයක් භාවිතා කර ඇත.

**10.3 සංවේදීතා විශ්ලේෂණය**

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මැනීමේදී අනෙකුත් සියලුම විචල්‍යයන් ස්ථාවරව තබා ගනිමින්, භාවිතා කරන ලද ප්‍රධාන උපකල්පනයන්හි සිදුවිය හැකි සාධාරණ වෙනස්වීම් සඳහා වන සංවේදීතාවය පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

| **දෙසැම්බර් 31 දිනට** | **2024** |
|---|---|
| **උපකල්පනය** | නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වැඩිවීම / (අඩුවීම) |
| **වට්ටම් අනුපාතිකය සඳහා සංවේදීතා විශ්ලේෂණය** | |
| වට්ටම් අනුපාතිකය 1% කින් වැඩිවීම | (993,741) |
| වට්ටම් අනුපාතිකය 1% කින් අඩුවීම | 1,086,178 |
| **වැටුප් වර්ධක අනුපාතිකය සඳහා සංවේදීතා විශ්ලේෂණය** | |
| වැටුප් වර්ධක අනුපාතිකය 1% කින් වැඩිවීම | 1,075,951 |
| වැටුප් වර්ධක අනුපාතිකය 1% කින් අඩුවීම | (1,002,458) |

**10.4 නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ කල් පිරීමේ පැතිකඩ**

| අනාගත සේවා කාලය | **නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව** |
|---|---|
| දෙසැම්බර් 31 දිනට | **2024** |
| ඉදිරි මාස 12 ඇතුළත | 38,675 |
| වසර 1 ත් 5 ත් අතර | 1,022,423 |
| වසර 5 ත් 10 ත් අතර | 1,926,778 |
| වසර 10 කට වඩා වැඩි | 11,587,335 |
| **මුළු එකතුව** | **14,575,211** |

**නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ භාරිත සාමාන්‍ය කාලසීමාව (Weighted Average duration) වසර 9 කි.**

**11** ජංගම වගකීම්

| **11.1** සාමාජිකයින්ගෙන් ලැබුණු අත්තිකාරම් සහ වෙනත් | **2024** | **2023** |
|---|---|---|
| | රු. | රු. |
| **11.1 ජංගම වගකීම් - රඳවා ගැනීමේ මුදල් සහ වෙනත් ගෙවිය යුතු දෑ** | | |
| රඳවා ගැනීමේ මුදල් සහ වෙනත් ගෙවිය යුතු දෑ | 1,093,288 | 51,908,375 |
| | **1,093,288** | **51,908,375** |
| **11.2** ජංගම නොවන වගකීම් - විලම්භිත ආදායම | | |
| විලම්භිත ආදායම - අලුත් කිරීම් සහ ප්‍රතිස්ථාපන | 14,295,360 | 57,506,681 |
| විලම්භිත ආදායම - ආකෘතිය 1 සහ 2 | 22,058,378 | 1,746,070 |
| | **36,353,738** | **59,252,751** |
| **11.3 ජංගම වගකීම් - විලම්භිත ආදායම** | | |
| විලම්භිත ආදායම - අලුත් කිරීම් සහ ප්‍රතිස්ථාපන | 3,573,840 | 29,489,672 |
| විලම්භිත ආදායම - ආකෘතිය 1 සහ 2 | 11,206,616 | 734,500 |
| | **14,780,456** | **30,224,172** |

| **11.4** උපචිත වියදම් | **2024** | **2023** |
|---|---|---|
| | රු. | රු. |
| විදුලිය | 221,356 | - |
| ජලය | 31,254 | - |
| ආරක්ෂක සේවා | 269,395 | - |
| විගණන ගාස්තු | 750,000 | - |
| බදු සැකසීමේ ගාස්තු | 150,000 | |
| වෙනත් උපචිත වියදම් | - | 13,648,835 |
| | **1,422,006** | **13,648,835** |

| **12.** වෙනත් ආදායම් | **2024** | **2023** |
|---|---|---|
| | රු. | රු. |
| විවිධ ආදායම් | 87,557 | 60,740 |
| අලුත් කිරීම් සහ ලියාපදිංචි කිරීම්වල ප්‍රමාද ගාස්තු | - | 1,092,246 |
| නැවත නොගෙවන ලංසු ආදායම් | 17,500 | 19,000 |
| | **105,057** | **1,171,986** |

| **13.** මුදල් සහ මුදල් සමාන දෑ | **2024** | **2023** |
|---|---|---|
| | රු. | රු. |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල සංරචක | | |
| 13.1 වාසිදායක මුදල් සහ මුදල් සමාන දෑ ශේෂයන්<br>මුදල් සහ බැංකු ශේෂයන් | 79,015,608 | 72,044,632 |
| 13.2 අවාසිදායක මුදල් සහ මුදල් සමාන දෑ ශේෂයන්<br>බැංකු අයිරා - ලෙජරයට අනුව | (1,872,660) | (772,695) |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණ සඳහා මුළු මුදල් සහ මුදල් හා සමාන දෑ** | **77,142,949** | **71,271,938** |

ඉදිරිපත් නොකළ චෙක්පත් හේතුවෙන් ඇති වන අවාසිදායක මුදල් පොත් ශේෂයන්, මුදල් පොතෙහි බැංකු අයිරා ලෙස නැවත වර්ගීකරණය කර මුදල් සහ මුදල් සමාන දෑවල වාසිදායක ශේෂයන් යටතේ ඉදිරිපත් කර ඇත.

| **14. සේවක පිරිවැය** | **2024** | **2023** |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | රු. | රු. |
| වැටුප් සහ වේතන | 52,111,184 | 44,090,203 |
| නිශ්චිත දායකත්ව සැලසුම් පිරිවැය | | |
| - සේවක අර්ථසාධක අරමුදල (EPF) | 4,504,765 | 4,052,144 |
| - සේවක භාරකාර අරමුදල (ETF) | 1,133,984 | 810,429 |
| වෙනත් සේවක පාර්ශවීය පිරිවැය | 3,234,618 | 3,773,919 |
| රක්ෂණ | 2,550,543 | 1,907,472 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | 1,293,018 | 986,042 |
| **මුළු සේවක පිරිවැය** | **64,828,112** | **55,620,209** |

| **15. පරිශ්‍ර නඩත්තුව** | **2024** | **2023** |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | රු. | රු. |
| උපයෝගිතා (විදුලිය, ජලය, ආරක්ෂක සේවා) | 6,919,231 | 6,855,965 |
| ගොඩනැගිලි නඩත්තුව | 1,396,777 | 1,514,563 |
| උපකරණ නඩත්තුව | 882,672 | 625,258 |
| **මුළු පරිශ්‍ර නඩත්තු පිරිවැය** | **9,198,679** | **8,995,786** |

| **16. ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය කිරීම්** | **2024** | **2023** |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | රු. | රු. |
| වර්ෂය සඳහා ක්ෂයවීම් | 9,535,439 | 6,103,712 |
| **අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම්** | 4,564,328 | 1,055,527 |
| මුළු ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය කිරීම් වියදම | **14,099,768** | **7,159,238** |

**17. ශුද්ධ මූල්‍ය ආදායම**

| **17.1 මූල්‍ය ආදායම** | **2024** | **2023** |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | රු. | රු. |
| පොලි ආදායම්, | 99,823,562 | 106,798,758 |
| ස්ථාවර තැන්පතු පොලිය (LKR) | 20,536,171 | 22,176,976 |
| ස්ථාවර තැන්පතු පොලිය (USD) | 50,132,492 | 89,354,433 |
| භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර පොලිය | 2,824,761 | 1,652,068 |
| අරමුදල් කළමනාකරණ සහ Money Market ගිණුම් පොලිය | 89,788 | 65,418 |
| ඉතුරුම් ගිණුම් පොලිය | 72,996 | 84,940 |
| සේවක ණය පොලිය | | |
| නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පොලිය | 82,875 | 48,103 |
| **මුළු මූල්‍ය ආදායම** | **173,562,645** | **220,180,698** |

| **17.2 මූල්‍ය පිරිවැය** | **2024** | **2023** |
|---|---|---|
| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | රු. | රු. |
| බැංකු ගාස්තු සහ හර බද්ද | 61,528 | 52,242 |
| **මුළු මූල්‍ය පිරිවැය** | 61,528 | 52,242 |
| **ශුද්ධ මූල්‍ය ආදායම** | **173,501,117** | **220,128,455** |

# සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

**18.** මෙහෙයුම් වියදම්

| | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| පරීක්ෂක ගාස්තු | 6,221,680 | 9,829,786 |
| ERPM විභාගය | 15,708,723 | - |
| අධීක්ෂකවරුන් සහ සම්බන්ධීකාරක ගාස්තු | 4,551,080 | 3,195,420 |
| ප්‍රතිඵල මණ්ඩලය | - | 15,000 |
| සහායක කාර්ය මණ්ඩල ගෙවීම් - SLMC | 409,235 | 429,165 |
| සහායක කාර්ය මණ්ඩල ගෙවීම් - වෙනත් | 3,911,773 | 5,836,110 |
| විභාග ශාලා ගාස්තු | 1,536,250 | 1,509,750 |
| විභාග උපකරණ | - | 25,500 |
| රෝගීන් සඳහා ගෙවීම් | 1,294,900 | 1,613,750 |
| ආහාර පාන | 4,608,985 | 5,796,853 |
| ERPDS විභාගය සඳහා ගෙවීම් | 705,763 | 217,800 |
| මුද්‍රණය, තැපැල් ගාස්තු සහ ලිපි ද්‍රව්‍ය | 483,640 | 921,366 |
| සංචාරක | 140,917 | 82,418 |
| රැස්වීම් වියදම් | 469,748 | 862,500 |
| දුරකථන ගාස්තු | 8,001 | 13,041 |
| වෙළඳ දැන්වීම් | 742,123 | 389,597 |
| අලුත්වැඩියා කිරීම් සහ නඩත්තුව | 228,453 | 117,545 |
| හැඳුනුම්පත් සකස් කිරීමේ ගාස්තු | 1,148,070 | 1,585,820 |
| කමිටු රැස්වීම් දීමනා | 5,661,635 | 2,673,000 |
| සභා රැස්වීම් දීමනා සහ ගමන් ගාස්තු | 2,598,930 | 2,693,180 |
| කොවිඩ් 19 වියදම් (සාමාන්‍ය) | - | 7,200 |
| කුරියර් ගාස්තු | 5,300 | 1,750 |
| ප්‍රශ්න පත්‍ර සහ නිවැරදි කිරීමේ ගාස්තු | 320,725 | 314,820 |
| ලේඛන සංරක්ෂණය | 822,676 | - |
| නැවත පරීක්ෂා කිරීම | 63,000 | 9,000 |
| | **51,641,606** | **38,140,372** |

**19.** පරිපාලන වියදම්

| | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| සේවක වැටුප් සහ දීමනා | 35,428,415 | 30,538,586 |
| අතිකාල දීමනා | 679,391 | 337,409 |
| ලේඛකාධිකාරී දීමනාව | 3,557,988 | 3,226,775 |
| සේවක දීමනා - ලියාපදිංචිය අලුත් කිරීම | 1,235,724 | 87,543 |
| සහකාර ලේඛකාධිකාරී දීමනාව | 2,709,504 | 1,860,438 |
| නීති නිලධාරී දීමනාව | 1,637,660 | 1,725,000 |
| ප්‍රතීතන ප්‍රධානී දීමනාව | 1,714,000 | 1,980,000 |
| සභාපති දීමනාව | 620,000 | 720,000 |
| මූල්‍ය ප්‍රධානී දීමනාව | 1,755,662 | 974,252 |
| සීමාවාසික ප්‍රධානී දීමනාව | 1,200,000 | 1,200,000 |
| PPC වාර්තා සඳහා දීමනා | 1,469,589 | 1,320,000 |
| දීමනා: දළුවත්ත මහත්මිය | - | 79,200 |
| දීමනා: NITA අභ්‍යාසලාභීන් | 103,250 | 41,000 |
| වෛද්‍ය විද්‍යාල සමාලෝචන ගාස්තු | 1,773,979 | 998,600 |
| සේවක අර්ථසාධක අරමුදල (EPF) | 4,504,765 | 4,052,144 |
| සේවක භාරකාර අරමුදල (ETF) | 1,133,984 | 810,429 |
| පාරිතෝෂික දීමනා | 1,510,179 | 1,663,798 |
| පාරිතෝෂිත වියදම් | 1,293,018 | 986,042 |
| මැතිවරණ වියදම් | - | 9,555,471 |
| ශාලා ගාස්තු | 757,488 | 870,000 |
| ක්ෂයවීම් | 9,535,439 | 6,103,712 |
| ක්‍රමක්ෂය කිරීම් | 4,564,328 | 1,055,527 |
| සේවක සුබසාධන | 256,881 | 520,805 |
| ආහාර පාන සහ වෙනත් | 1,526,737 | 1,117,574 |
| ගමන් වියදම් | 753,309 | 443,543 |
| වරිපනම් බදු - කොළඹ මහා නගර සභා ආරක්ෂක සේවා | 289,212 | 300,608 |
| ආරක්ෂක සේවා | 3,398,510 | 3,465,419 |
| විදුලිය | 3,105,506 | 3,007,054 |
| ජලය | 415,216 | 383,492 |
| දුරකථන | 1,634,297 | 1,050,411 |
| උත්සව සැමරුම් | 1,561,510 | - |
| සේවක රක්ෂණ | 2,550,543 | 1,827,057 |
| වෘත්තීය සමිති/සංගම් දායකත්ව මුදල් | 339,291 | 0 |
| පොදු රක්ෂණ | - | 80,414 |
| **අලුත්වැඩියාවන් සහ නඩත්තුව** | | |
| පරිගණක | 114,062 | 33,500 |
| යතුරුපැදි | 110,770 | 62,647 |

# සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

**19.** **පරිපාලන වියදම් (සම්බන්ධිත)**

| | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| ගොඩනැගිලි, කාර්යාල සහ උපකරණ | 959,161 | 1,088,077 |
| සෝපානය | 110,000 | 84,000 |
| වෙබ් අඩවිය | 1,891,874 | 1,785,006 |
| වායු සමීකරණ | 189,128 | 271,761 |
| Quick Book මෘදුකාංග | 18,720 | 17,985 |
| මාර්ගගත අලුත් කිරීම සහ ප්‍රතිසංස්කරණ පද්ධතිය | 598,000 | - |
| වෙනත් අලුත්වැඩියාවන් සහ නඩත්තු කිරීම් | 254,258 | - |
| Microsoft 365 දායකත්වය | 25,243 | 55,801 |
| මුද්‍රණ යන්ත්‍ර | - | 56,750 |
| දුරකථන | 72,422 | 62,138 |
| මෘදුකාංග | 31,900 | 14,809 |
| Adobe Acrobat දායකත්වය | 59,523 | 73,130 |
| ඡායා පිටපත් යන්ත්‍ර | 312,659 | 378,973 |
| පුවරු PAC මෘදුකාංග | - | 593,973 |
| ගිනි නිවන යන්ත්‍ර | 18,500 | 31,250 |
| Grammarly මෘදුකාංග | - | 53,973 |
| අතථ්‍ය සත්කාරක සේවාදායකය/Zoom දායකත්වය | 93,828 | 150,787 |
| (Virtual Hosting Server/ Zoom Subscription) | 2,184,505 | 2,612,710 |
| මුද්‍රණය සහ ලිපි ද්‍රව්‍ය | 222,230 | 198,880 |
| තැපැල් ගාස්තු | 47,400 | 62,280 |
| පුවත්පත් සහ වාර සඟරා | 4,053,646 | 1,346,025 |
| වෙළඳ දැන්වීම් සහ ස්ථාපිත කිරීම | 2,525,675 | 3,505,621 |
| දිවුරුම් දීමේ උත්සව වියදම් | 735,900 | 285,750 |
| කාර්ය මණ්ඩල පුහුණුව | - | 35,400 |
| උද්‍යාන වියදම් | - | 62,750 |
| ශාලා ගාස්තු | 62,149 | 77,639 |
| සංග්‍රහ වියදම් | 1,110,850 | 1,814,954 |
| ප්‍රතීතන අඩවි සංචාරය (Accreditation Site Visit) | 138,488 | 70,725 |
| ගොඩනැගිලි අලුත්වැඩියා (ප්‍රතීතනය) | 3,421,540 | 2,584,955 |
| WFME පිළිගැනීම | 731,658 | 1,083,566 |
| වැඩ සාප්පු වියදම් | 22,826 | 54,269 |
| පිරිසිදු කිරීම සහ නඩත්තු වියදම් | - | 220,000 |
| නිවාඩු මුදල් ආපසු ගැනීම | | |
| | **113,132,289** | **101,212,388** |

**20.** **මූල්‍ය සහ අනෙකුත් වියදම්**

| | 2024 | 2023 |
|---|---|---|
| | රු. | රු. |
| විනිමය පාඩු | 22,584,145 | 26,024,586 |
| නීතිමය ගාස්තු | 1,118,232 | 8,165,286 |
| විගණන ගාස්තු | 1,273,920 | 517,201 |
| බදු සකස් කිරීමේ ගාස්තු | 150,000 | - |
| වසර සඳහා පොළිය - පාරිතෝෂිකය | 1,080,395 | - |
| උපදේශන ගාස්තු | - | 95,000 |
| අධිභාරය | 1,350 | 34,968 |
| PCC වියදම් | 135,000 | 135,000 |
| වෘත්තීය ගාස්තු | 395,484 | 1,246,230 |
| | **26,738,526** | **36,218,271** |

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

## 21. බැඳීම් සහ අනුකූලතා

### 21.1 බැඳීම්

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ සැලකිය යුතු බැඳීම් නොමැත.

### 21.2 අවිනිශ්චිත වගකීම්

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ දැනට විභාග වෙමින් පවතින පහත අධිකරණ නඩු හැර සැලකිය යුතු අවිනිශ්චිත වගකීම් නොමැත.

- **ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනය 81/2023** – මෙය මහාචාර්ය නාරද දිගගාමිණී වර්ණසූරිය සහ වෛද්‍ය පුෂ්පිත දර්ශන විසින් ගොනු කරන ලද නඩුවකි. 01 වන වගඋත්තරකරු සෞඛ්‍ය අමාත්‍යවරයා වන අතර, 02 වන වගඋත්තරකරු සභාපතිවරයා වන අතර 03 සිට 06 දක්වා වගඋත්තරකරුවන් වන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා 01 වන වගඋත්තරකරු විසින් පත් කරන ලද කමිටුවේ සාමාජිකයින් ය. 07 වන වගඋත්තරකරු වන්නේ 01 වන වගඋත්තරකරු විසින් පත් කරන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නව සභාපතිවරයාය.

- **ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනය 82/2023** – මෙය මහාචාර්ය ඩී.ජී. හරේන්ද්‍ර ද සිල්වා, වෛද්‍ය ඩබ්ලිව්.එම්. සුනිල් රත්නප්‍රිය සහ වෛද්‍ය යූ.එම්. ගුණසේකර යන මහත්වරුන් විසින් පවරන ලද නඩුවකි. මෙහි පළමුවන වගඋත්තරකරු සෞඛ්‍ය අමාත්‍යවරයා වන අතර, දෙවන වගඋත්තරකරු සභාපතිවරයා වේ. තුන්වන සිට හයවන දක්වා වගඋත්තරකරුවන් වන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට අදාළ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පළමුවන වගඋත්තරකරු විසින් පත් කරන ලද කමිටුවේ සාමාජිකයින්ය. හත්වන වගඋත්තරකරු වන්නේ පළමුවන වගඋත්තරකරු විසින් පත් කරන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නව සභාපතිවරයාය.

- **ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනය 83/2023** – මෙය මහාචාර්ය නාරද දිගගාමිණී වර්ණසූරිය සහ වෛද්‍ය පුෂ්පිත දර්ශන සුනිල් අබේසිරි යන මහත්වරුන් විසින් පවරන ලද නඩුවකි. මෙහි පළමුවන වගඋත්තරකරු සෞඛ්‍ය අමාත්‍යවරයා වන අතර, දෙවන වගඋත්තරකරු සභාපතිවරයා වේ. තුන්වන සිට හයවන දක්වා වගඋත්තරකරුවන් වන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට අදාළ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පළමුවන වගඋත්තරකරු විසින් පත් කරන ලද කමිටුවේ සාමාජිකයින්ය. හත්වන වගඋත්තරකරු වන්නේ පළමුවන වගඋත්තරකරු විසින් පත් කරන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නව සභාපතිවරයාය.

- **ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනය 84/2023** - මෙය මහාචාර්ය ඩී.ජී. හරේන්ද්‍ර ද සිල්වා, වෛද්‍ය ඩබ්ලිව්.එම්. සුනිල් රත්නප්‍රිය සහ වෛද්‍ය යූ.එම්. ගුණසේකර යන මහත්වරුන් විසින් ගොනු කරන ලද නඩුවකි. මෙහි 01 වන වගඋත්තරකරු සෞඛ්‍ය අමාත්‍යවරයා වන අතර, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට අදාළ පැමිණිලි විමර්ශනය කිරීමේ අරමුණින් 01 වන වගඋත්තරකරු විසින් පත් කරන ලද කමිටුවේ සභාපතිවරයා 02 වන වගඋත්තරකරු වන අතර 03 වන සිට 06 වන දක්වා වගඋත්තරකරුවන් එහි සාමාජිකයෝ වෙති. 07 වන වගඋත්තරකරු වන්නේ 01 වන වගඋත්තරකරු විසින් පත් කරන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නව සභාපතිවරයාය.

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

- **ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් අයදුම්පත (SCFR) 84/2018** – මෙය මූලික අයිතිවාසිකම් අයදුම්පතක් සම්බන්ධයෙන් කේ.ඩී.එන්. කඩදොර මහතා විසින් වෛද්‍ය ඒ.එම්.එස්. වීරබණ්ඩාර, වෛද්‍ය කේ.ඒ.එස්. සමරසිංහ සහ වෛද්‍ය පී.ජී. මහීපාල යන මහත්වරුන්ට එරෙහිව ගොනු කරන ලද නඩුවකි. මෙහි 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව, පූජිත ජයසුන්දර මහතා සහ නීතිපති දෙපාර්තමේන්තුවයි.

- **ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් අයදුම්පත (SCFR) 180/2021** – මෙය ශ්‍රී ලංකා වෛද්‍ය සභාව, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ නීතිපති දෙපාර්තමේන්තුවට එරෙහිව වෛද්‍ය වන්දන අතපත්තු මහතා විසින් ගොනු කරන ලද නඩුවකි.

- **ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් අයදුම්පත (SCFR) 104/2023** – මෙය වෛද්‍ය වංග කුරුකුලරත්න මහතා විසින් ගොනු කරන ලද නඩුවකි. මෙහි 01 වන වගඋත්තරකරු ශ්‍රී ලංකා වෛද්‍ය සභාවයි.

- **ශ්‍රේෂ්ඨාධිකරණ අපහාස නඩුකරය (SC Contempt) 05/2018 -** මෙය නවලෝක හොස්පිටල්ස් පීඑල්සී සහ වෛද්‍ය විවේගානත් විනෝත් යන අය විසින් ගොනු කරන ලද නඩුවකි. මෙහි 01 වන වගඋත්තරකරු ශ්‍රී ලංකා වෛද්‍ය සභාවයි.

- **අභියාචනාධිකරණ රිට් ආඥා පෙත්සම (CA WRIT) 296/2020** – මෙය වෛද්‍ය දිලිනි හේරත් සමරකෝන් මහත්මිය විසින් ගොනු කරන ලද නඩුවකි. මෙහි 01 වන වගඋත්තරකරු ශ්‍රී ලංකා වෛද්‍ය සභාවයි.

- **අභියාචනාධිකරණ රිට් ආඥා පෙත්සම (CA WRIT) 445/2021** – මෙය වෛද්‍ය ප්‍රියංකරන් මුතුකුමාර් මහතා විසින් ගොනු කරන ලද නඩුවකි. මෙහි 01 වන සහ 02 වන වගඋත්තරකරුවන් වන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවයි.

- **අභියාචනාධිකරණ රිට් ආඥා පෙත්සම (CA WRIT) 575/2023** – මෙය වෛද්‍ය ගමගේ රංගන සඳකැළුම් මහතා විසින් ගොනු කරන ලද නඩුවකි. මෙහි 01 වන වගඋත්තරකරු ශ්‍රී ලංකා වෛද්‍ය සභාවයි.

- **අභියාචනාධිකරණ රිට් ආඥා පෙත්සම (CA WRIT) 574/2023** – මෙය ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC) විසින් පිළිගනු නොලබන, ඉන්දියාවේ මහාරාෂ්ට්‍ර සෞඛ්‍ය විද්‍යා විශ්වවිද්‍යාලයේ උපාධිධාරිනියක වන ෂෙමන්ක්කරි කේසවන් මෙනෙවිය විසින් ගොනු කරන ලද නඩුවකි.

- **අභියාචනාධිකරණ රිට් ආඥා පෙත්සම (CA WRIT) 798/2023** – මෙය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ තීරණය අභියෝගයට ලක් කරමින් අධිකරණ බලය අයැද සිටිමින් මහාචාර්ය මොහොමඩ් රෙස්වි ෂෙරිෆ් මහතා විසින් ගොනු කරන ලද නඩුවකි.

- **අභියාචනාධිකරණ රිට් ආඥා පෙත්සම (CA WRIT) 59/2024** – මෙය වෛද්‍ය උමාසුගි නඩරාජා මහත්මිය විසින් ගොනු කරන ලද නඩුවකි. මෙහි 01 වන වගඋත්තරකරු ශ්‍රී ලංකා වෛද්‍ය සභාවයි.

- **අභියාචනාධිකරණ රිට් ආඥා පෙත්සම (CA WRIT) 153/2024** – මෙය විනායගමූර්ති තිනේෂ් මහතා විසින් ගොනු කරන ලද නඩුවකි. මෙහි 01 වන වගඋත්තරකරු ශ්‍රී ලංකා වෛද්‍ය සභාවයි.

- **අභියාචනාධිකරණ රිට් ආඥා පෙත්සම (CA WRIT) 407/2024** – මෙය යාපා මුදියන්සේලාගේ ධර්මසේන මහතා විසින් ගොනු කරන ලද නඩුවකි. මෙහි 01 වන සහ 02 වන වගඋත්තරකරුවන් වන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සහ රෙජිස්ට්‍රාර්වරයායි.

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

**22. ඇපයට තබා ඇති වත්කම්**

වගකීම් සඳහා සුරැකුම්පත් ලෙස වත්කම් ඇපයට තබා නොමැත.

**23. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවූ සිදුවීම්**

වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිදුවීම් යනු වාර්තාකරණ කාලපරිච්ඡේදයේ අවසානය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර දී ඇති දිනය අතර සිදුවන හිතකර සහ අහිතකර සිදුවීම් වේ.

වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිදුවන සිදුවීම්වල ප්‍රමාණාත්මකභාවය සලකා බලනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

## 24. සම්බන්ධිත පාර්ශවවල හෙළිදරව් කිරීම

### 24.1 ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් (KMP) සහ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයින් (CFM) සම්බන්ධ ගනුදෙනු, විධිවිධාන සහ ගිවිසුම්

ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 (LKAS 24) – ‘සම්බන්ධිත පාර්ශවවල අනාවරණයන්’ අනුව, ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් (KMP) යනු ආයතනයේ කටයුතු සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම ඇති පුද්ගලයින් වේ. ඒ අනුව, සභාවේ සාමාජිකයින් (රෙජිස්ට්‍රාර් සහ සහකාර රෙජිස්ට්‍රාර් ඇතුළුව) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් ලෙස වර්ගීකරණය කර ඇත.

ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ (KMP) සමීපතම පවුලේ සාමාජිකයින් (CFM) යනු සභාව සමඟ සිදුකරන ගනුදෙනුවලදී එම ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් කෙරෙහි බලපෑම් කිරීමට හෝ ඔවුන්ගේ බලපෑමට ලක්වීමට ඉඩ ඇතැයි අපේක්ෂා කළ හැකි පවුලේ සාමාජිකයින් වේ. ඔවුන්ට පහත අය ඇතුළත් විය හැකිය:

(අ) අදාළ පුද්ගලයාගේ සහකරු/සහකාරිය සහ දරුවන්;
(ආ) අදාළ පුද්ගලයාගේ සහකරුගේ/සහකාරියගේ දරුවන්; සහ
(ඇ) අදාළ පුද්ගලයාගෙන් හෝ අදාළ පුද්ගලයාගේ සහකරුගෙන්/සහකාරියගෙන් යැපෙන්නන්.

සමීපතම පවුලේ සාමාජිකයින් (CFM) යනු ආයතනයට සම්බන්ධ පාර්ශවයන් වේ. වර්ෂය තුළ සමීපතම පවුලේ සාමාජිකයින් (CFM) සමඟ කිසිදු ගනුදෙනුවක් සිදුවී නොමැත.

### 24.2 සභා සාමාජිකයින්ගේ ණය

මෙම මූල්‍ය කාලපරිච්ඡේදය අවසානයේදී සභාවේ සාමාජිකයින් වෙත කිසිදු ණයක් ලබා දී නොමැත.

.

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

## 25. මූල්‍ය අවදානම් කළමනාකරණය

මූල්‍ය උපකරණ භාවිතය හේතුවෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පහත සඳහන් අවදානම්වලට නිරාවරණය වේ. මේවා සභාව සහ කළමනාකරණ කමිටුව විසින් නිරන්තරයෙන් නිරීක්ෂණය කරනු ලැබේ.

### 25.1. ණය අවදානම

ණය අවදානම යනු සේවාවක් ලබන්නෙකු හෝ මූල්‍ය උපකරණයකට අදාළ අනෙක් පාර්ශවය සිය ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෙත සිදුවන මූල්‍ය අලාභයන්ගේ අවදානමයි.

### 25.1. (අ) ණය අවදානමට ඇති උපරිම නිරාවරණය

සාමාන්‍යයෙන් ණය අවදානමට යටත් වන මූල්‍ය වත්කම්වල උපරිම අවදානම් නිරාවරණය ඒවායේ ගිණුම්ගත වටිනාකමට සමාන වේ.

| දෙසැම්බර් 31 වන දිනට ගිණුම්ගත වටිනාකම | 2024 (රු.) | 2023 (රු.) |
|---|---:|---:|
| ස්ථාවර තැන්පතු | 1,150,724,550 | 843,142,292 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 10,201,424 | 190,598,133 |
| කාර්ය මණ්ඩලයට ණය සහ උත්සව අත්තිකාරම් | 2,729,204 | 2,129,825 |
| භාණ්ඩාගාර බිල්පත් | 303,835,065 | 272,242,821 |
| **ණය අවදානමට උපරිම නිරාවරණය** | **1,467,490,243** | **1,308,113,071** |

### 25.1. (ආ) ණය අවදානමට අවදානම් ප්‍රතිචාරය

ණය අවදානම අවම කිරීම සඳහා, ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත් රජය සතු බැංකු ආයතනවල ආයෝජනය කරනු ලැබේ.

| දෙසැම්බර් 31 දිනට වටිනාකම රඟෙන යාම | 2024 (රු.) | 2023 (රු.) |
|---|---:|---:|
| ස්ථාවර තැන්පතු | 1,150,724,550 | 843,142,292 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 10,201,424 | 190,598,133 |
| භාණ්ඩාගාර බිල්පත | 303,835,065 | 272,242,821 |
| **රජය සතු බැංකු ආයතන සමඟ මුළු මූල්‍ය වත්කම්** | **1,464,761,039** | **1,305,983,246** |

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

## 25.2. ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු නියමිත කාලයට පෙර තම වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රව අරමුදල් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සතුව නොතිබිය හැකි අවදානමයි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කීර්ති නාමයට පිළිගත නොහැකි හානියක් සිදු නොකර, නියමිත කාලයට පෙර තම වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් සැමවිටම පවතින බව සහතික කරමින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරයි.

## 25.2. (අ) මූල්‍ය වත්කම් සහ වගකීම් පිළිබඳ කල්පිරීම් විශ්ලේෂණය

| විස්තරය | ඉල්ලුම මත (රු.) | මාස 12 ට අඩු (රු.) | වසර 1 කට වැඩි (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | |
| ලැබිය යුතු දෑ | - | 145,163 | - | **145,163** |
| කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම් | - | 1,202,250 | 1,526,954 | **2,729,204** |
| ස්ථාවර තැන්පතු | - | 1,084,016,561 | 66,707,990 | **1,150,724,551** |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | 10,201,424 | - | **10,201,424** |
| භාණ්ඩාගාර බිල්පත | - | 303,835,065 | - | **303,835,065** |
| මුදල් සහ මුදල් සමාන දෑ | 77,142,949 | - | - | **77,142,949** |
| **මුළු මූල්‍ය වත්කම්** | **77,142,949** | **1,399,400,463** | **68,234,944** | **1,544,778,356** |
| | | | | |
| **මූල්‍ය වගකීම්** | | | | |
| ගෙවිය යුතු දෑ | - | 26,590,723 | - | **26,590,723** |
| උපචිත | - | 1,422,006 | - | **1,422,006** |
| **මුළු මූල්‍ය වගකීම්** | - | **28,012,729** | - | **28,012,729** |
| | | | | |
| **ශුද්ධ මූල්‍ය වත්කම්** | **77,142,949** | **1,371,387,734** | **68,234,944** | **1,516,765,627** |

## 25.3. වෙළඳපල අවදානම

වෙළෙඳපොළ අවදානම යනු පොලී අනුපාතික සහ විදේශ විනිමය අනුපාතිකයන්හි සිදුවන වෙනස්වීම් හේතුවෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ආදායමට හෝ එය සතු මූල්‍ය උපකරණවල අගයට බලපෑම් එල්ල වීමේ අවදානමයි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ප්‍රතිලාභ උපරිම කර ගන්නා අතරම, වෙළෙඳපොළ අවදානම් නිරාවරණය පිළිගත හැකි සීමාවන් තුළ කළමනාකරණය සහ පාලනය කරනු ලබයි. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වෙළෙඳපොළ අවදානම් නිරාවරණය අවම මට්ටමක පවතී.

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

## 26. ප්‍රකාශයට පත් කර ඇති නමුත් මෙතෙක් බලාත්මක වී නොමැති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල (SLFRSs /LKASs) සංශෝධන

- SLFRS 17 - රක්ෂණ ගිවිසුම්
- SLFRS 17 සඳහා වන සංශෝධන